# වාර්ෂික වාර්තාව
# ANNUAL REPORT
## 2013



රාජ්‍ය දැව සංස්ථාව
STATE TIMBER CORPORATION

45 වසරක මෙහෙවර සනිටුහන් කරමින් කැපවීම, නිපුණත්වය, දැඩි උත්සාහය, නිර්මාණශීලීත්වය සහ මහත් ලැදි බව තුළින් රාජ්‍ය දැව සංස්ථාව ප්‍රමුඛස්ථානයට පත්ව ඇත. ආපසු හැරී බලනවිට පැමිණි ගමන් මඟ පිළිබඳ අපි සැබෑවටම සතුටුවෙමු. ආඩම්බර වෙමු. නමුත්, නොනවතින ගමනක යෙදෙන්නෙමු. අපේවෘතාන්තය අදට වඩා හෙට දිගු ගමනක ආරම්භයයි.



45 years of commitment, proficiency, perseverance, creativity and passion has placed the State Timber Corporation at the forefront. We are really pleased and proud to look back our voyage of success. Yet, we will not rest and our story is far from over.

# පටුන


| | |
|---|---|
| ආරම්භය සහ අද | 03 |
| අපි රාජ්‍ය දැව සංස්ථාවයි | 04 |
| අපේ හෙට දින | 05 |
| මූල්‍ය ප්‍රකාශන උද්ධෘත | 07 |
| ආයතනික තොරතුරු | 08 |
| කළමනාකරණ මඩුල්ල | 09 - 10 |
| සභාපතිතුමාගේ සමාලෝචනය | 11 |
| සාමාන්‍යාධිකාරීතුමාගේ සමාලෝචනය | 12 |
| අපගේ කාර්යභාරයන් | 13 |
| අපගේ ව්‍යාපාරික වටිනාකම් | 14 |
| අධ්‍යක්ෂ මණ්ඩලය | 15 |
| ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මඩුල්ල | 16 - 17 |
| අධ්‍යක්ෂ මණ්ඩල සමාලෝචනය | 18 - 26 |
| විගණන හා කළමනාකරණ කමිටුවේ වාර්තාව | 27 |
| ව්‍යාපාරික සාරාංශය | 28 - 35 |
| තිරසාර සමාලෝචනය | 36 - 42 |
| සම්මාන හා විශේෂ ගෞරව තිළිණ | 43 |
| අවදානම් කළමණාකරණය | 44 - 49 |
| විගණකාධිපති වාර්තාව | 50 - 66 |
| වාර්ෂික ගිණුම් | 67 - 71 |
| ගිණුම් සඳහා සටහන් | 72 - 86 |
| මූල්‍ය පාරිභාෂික ශබ්ද මාලාව | 87 |

## ආරම්භය

රාජ්‍ය දැව සංස්ථාව රජය සතු ව්‍යාපාරයකි. එය 1968 වර්ෂයේ දී ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ගරු අමාත්‍යතුමන් විසින් 1957 අංක 49 දරන රජයේ කාර්මික සංස්ථා පනතේ බලතල ප්‍රකාර පිහිටුවන ලද අතර, 1982 පෙබරවාරි 05 දිනැති අංක:178/10 ඇති විශේෂ ගැසට් නිවේදනය සහ 2009 වර්ෂයේ ජුනි 26 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයට අනුව තවදුරටත් සංශෝධනය කොට යාවත්කාලීන කරන ලදී. යෙදවූ මූලික ප්‍රාග්ධනය රු.මිලියන 2.5කි.

## අද

ප්‍රධාන කාර්යාලය බත්තරමුල්ල "සම්පත්පාය" පරිශ්‍රයෙහි පිහිටා ඇති අතර, ප්‍රාදේශීය ඒකක උප කාර්යාල දිප ව්‍යාප්තව ස්ථානගත කර ඇත. රාජ්‍ය දැව සංස්ථාවේ මූලික ආදායම් ප්‍රභවය දැව හා දැවමය නිෂ්පාදන අලෙවිය වන අතර, තිරසාර අස්වැන්නක් උදෙසා රාජ්‍ය දැව සංස්ථාව, වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව හා ඒකාබද්ධව තිරසාර වනාන්තර වැඩසටහන් ක්‍රමය ක්‍රියාවට නංවනු ලබයි.

ඉතා උසස් තත්වයේ දැව නිෂ්පාදන හා විශිෂ්ඨ සේවාවක් සැපයීමට අප නිරතුරු උත්සුක වන අතර ඉකුත් වසර 45ක් මුළුල්ලේ රාජ්‍ය දැව සංස්ථාව දැව හා දැව ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තයේ උච්චස්ථානයේ වැජඹීමට මෙය හේතු සාධක වූ අතර, ඉහළ ශ්‍රේණියේ නිෂ්පාදන ඇගයීමේදී අපගේ නිෂ්පාදන පිළිගත් සාධනික සලකුණක් ලෙස භාවිතයට පත්ව ඇත.

- ✔ අපි ගුණාත්මක භාවයෙන් සමන්විත වන්නෙමු.
- ✔ අපි සුරක්ෂිත භාවයෙන් සමන්විත වන්නෙමු.
- ✔ අපි වගකීමෙන් යුක්ත වන්නෙමු.
- ✔ අපි පාරිභෝගිකයා ඉලක්ක කරන්නෙමු.
- ✔ අපි රාජ්‍ය අංශය සතුය.

# අපි රාජ්‍ය දැව සංස්ථාවයි.



බාධක ජයගනිමින්
නැඟීසිටින හැම
මොහොතකම,
අවංක කැපවීම
හා නවපකරණය තුළින් අපි
සාර්ථකත්වය කරා
පියනගමු.

# අපේ හෙට දින

## දැක්ම

ජාතියේ
විශ්වාසනීයත්වය දිනූ
අනර්ඝතම දැව
හා දැවමය
භාණ්ඩ සැපයුම්කරුවීම
සහ
දැව වෙළෙඳ පොළෙහි සැබෑ
නායකත්වය ඉසිලීම.



## මෙහෙවර

අප සතු තාක්ෂණික දැනුම,
කීර්තිනාමය හා නිපුනතාවය
උපයෝගි කරගනිමින්
නීත්‍යානුකූලව, පරිසර හිතකාමී
අන්දමින් ජාතික අවශ්‍යතාවය අනුව
අපගේ ගැනුම්කරුවන්ගේ දැව සහ
දැවමය භාණ්ඩ ඉල්ලීම නිෂ්පාදනය
කර ලබාදීම.




# රාජ්‍ය දැව සංස්ථාව

## පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය

# මූල්‍ය ප්‍රකාශන උද්ධෘත


2013 මූල්‍ය වර්ෂය තුළදී රාජ්‍ය දැව සංස්ථාව සැලකිය යුතු කාර්යසාධනයක් වාර්තා කර ඇත. ප්‍රධාන ක්‍රියාකාරී දර්ශක පහත පරිදි වේ.

| දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා | | 2013 | 2012 | වෙනස % |
|---|---|---|---|---|
| **ඉපැයීම් සම්බන්ධ ප්‍රධාන දත්ත සහ අනුපාත** | | | | |
| අයභාරය | රු. '000 | 2,893,651 | 3,269,514 | -11% |
| භාණ්ඩාගාර හා ආදායම් බදු වලට පෙර ලාභය | රු. '000 | 382,337 | 801,681 | -52% |
| භාණ්ඩාගාරයට ගෙවූ බදු | රු. '000 | 50,000 | 600,000 | -92% |
| ආදායම් බදු | රු. '000 | 150,223 | 37,030 | 306% |
| වර්ෂය සඳහා ශුද්ධ ලාභය | රු. '000 | 182,114 | 164,651 | 11% |
| ස්කන්ධය මත ඉපැයීම් | % | 11.32 | 25.08 | -55% |
| වත්කම් මත ඉපැයීම් | % | 7.94 | 18.18 | -56% |
| **ශේෂ පත්‍ර සම්බන්ධ ප්‍රධාන දත්ත සහ අනුපාත** | | | | |
| මුළු වත්කම් | රු. '000 | 4,812,312 | 4,409,065 | 9% |
| මුළු ස්කන්ධය | රු. '000 | 3,377,223 | 3,195,933 | 6% |
| මුළු ණයහිමියන් | රු. '000 | 1,435,089 | 1,213,132 | 18% |
| ණය/ස්කන්ධ | % | 42.49 | 37.96 | 12% |
| ණය/මුළු වත්කම් | % | 29.82 | 27.51 | 8% |
| **වෙනත් තොරතුරු** | | | | |
| මුළු සේවකයන් | සංඛ්‍යාව | 2,139 | 2,187 | -2% |
| එක් සේවකයෙකුට අයභාරය | රු. '000 | 1,353 | 1,495 | -10% |
| එක් සේවකයෙකුට ලාභය (භාණ්ඩාගාර හා ආදායම් බදු වලට පෙර) | රු. '000 | 179 | 367 | -51% |





අයභාරය

(රු. මිලියන)





ශුද්ධ ලාභය

(රු. මිලියන)





මුළු වත්කම්

(රු. මිලියන)




ස්කන්ධය මත ඉපැයීම්

(%)




භාණ්ඩාගාර හා ආදායම් බදු වලට පෙර ලාභය

(රු. මිලියන)

# ආයතනික තොරතුරු - 2013

| | | |
|---|---|---|
| ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා | - | පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා |
| ගරු අල්හාජ් ඒ.ආර්.එම්. අබ්දුල් කාදර් මහතා | - | පරිසර හා පුනර්ජනනීය බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා |
| ආචාර්ය බී.එම්.යූ.ඩී. බස්නායක මහතා | - | ලේකම්-පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය |

## අධ්‍යක්ෂ මණ්ඩලය 2013

| | | |
|---|---|---|
| එස්. අමරසිංහ මහතා | - | සභාපති - රාජ්‍ය දැව සංස්ථාව |
| කේ.එච්. හෙට්ටිආරච්චි මහතා | - | ක්‍රියාකාරී අධ්‍යක්ෂක - රාජ්‍ය දැව සංස්ථාව |
| ඒ.කේ.ඒ.වයි. තරංග මහතා | - | භාණ්ඩාගාර නියෝජිත |
| කේ. පී. ආරියදාස මහතා (2013.11.12 දින විශ්‍රාම යන ලදි) | - | වනසංරක්ෂක ජනරාල් |
| අනුර සතුරුසිංහ මහතා | - | වනසංරක්ෂක ජනරාල් |
| මහාචාර්ය හිරාන් අමරසේකර මහතා | - | අධ්‍යක්ෂක |
| චම්පික කරුණාරත්න මහතා | - | අධ්‍යක්ෂක |
| මේරි ඩික්මන් මහත්මිය | - | අධ්‍යක්ෂක |
| පී.ජී. කුමාරසිංහ සිරිසේන මහතා | - | සාමාන්‍යාධිකාරී - රාජ්‍ය දැව සංස්ථාව |

## විගණන හා කළමනාකරණ කමිටුව 2013

| | | |
|---|---|---|
| ඒ.කේ.ඒ.වයි. තරංග මහතා | - | කමිටු සභාපති |
| කේ.පී. ආරියදාස මහතා | - | කමිටු සාමාජික |
| මහාචාර්ය හිරාන් අමරසේකර මහතා | - | කමිටු සාමාජික |

**ප්‍රධාන කාර්යාලය (ලියාපදිංචි ලිපිනය)**

82, "සම්පත්පාය"
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා.

දුරකථන : +94112866600-5
ෆැක්ස් : +94112866623
වෙබ් අඩවිය : www.timco.lk

**විගණක**

විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව
306/72 පොල්දූව පාර,
බත්තරමුල්ල.

**ප්‍රධාන බැංකුකරු**

ලංකා බැංකුව

**මුදල් වර්ෂය**

ජනවාරි 01 දින සිට
දෙසැම්බර් 31 වන දින දක්වා

# කළමනාකරණ මඬුල්ල 2013 - රාජ්‍ය දැව සංස්ථාව

| | | |
|---|---|---|
| සාමාන්‍යාධිකාරි | : පී.පී.කුමාරසිංහ සිරිසේන | Bsc. Mgt(SP), Master of Management (HRM), Master of Business Administration, Post Graduate (A&FM) Dip. Business Management, APFA (ICA), MIOGAF, FMAAT |
| නි.සාමාන්‍යාධිකාරි - මානව සම්පත් හා පරිපාලන | : කේ.සිරිනිවංශ | Bsc., Msc. (Forestry), Dip.(Bus. mgt), Post Grad. Dip. (Forest survey-Netherland), Dip. (Forest products research-Japan) |
| නි.සාමාන්‍යාධිකාරි - මෙහෙයුම් | : එම්.වී.කරුණාරත්න | Bsc. Dev. Stu. (Sp), Post Grad. Dip. (Mech. Wood Tech. & Prod. Mgt. - Finland) |
| නි.සාමාන්‍යාධිකාරි - අලෙවි | : පී.සේනානායක | BA.(Econ./Stat.) Spld - Wood Industry-CSR-REMINI in Italy |
| නි.සාමාන්‍යාධිකාරි - තොරතුරු තාක්‍ෂණ | : ඩී.යූ.දයාරත්න | Bsc. Msc.(Com. Sc) |
| නි.සාමාන්‍යාධිකාරි - පර්යේෂණ, පුහුණු හා සංවර්ධන | : ආචාර්ය එන්.රුවන්පතිරණ | Bsc. Msc. Phd. (Forestry) |
| නි.සාමාන්‍යාධිකාරි - නිෂ්පාදන හා තාක්ෂණ | : එච්.එම්.පී.බී.හේරත් | NDT (Mech.) ,ECGI(UK), MIIESL, Post Grad. Dip. (Mech. Wood Tech. & Prod. Mgt. - Finland) |
| නි.සාමාන්‍යාධිකාරි - අභ්‍යන්තර විගණන | : ඩබ්.ඩබ්.එම්.ජේ.කුරේ | FCA |
| නි.සාමාන්‍යාධිකාරි - මුදල් | : පී.ඩී.එස්. කුමාරසිංහ | Bsc. (Acct. Fin. Mgt.), ACA, ACMA |

## සහකාර සාමාන්‍යාධිකාරීන්

| | | |
|---|---|---|
| ස.සාමාන්‍යාධිකාරි - කලාප 1 | : එස්.එස්.පඬුවාවල | Bsc., Msc. (Forestry), Post Grad. Dip. (Forest survey-Netherland), Post Grad. Dip. (Mech. Wood Tech. & Prod. Mgt. - Finland) |
| ස.සාමාන්‍යාධිකාරි - යාන්ත්‍රික ඉංජිනේරු | : ඩී.එස්.සමරකෝන් | MIE (SL), C. Eng, NDT (Mec) |
| ස.සාමාන්‍යාධිකාරි - නිෂ්පාදන | : ටී.එස්.සී.පුෂ්පකුමාර | Bsc.Post Grad.Dip. (Mech.Wood Tech. & Prod.Mgt) in Finland |
| ස.සාමාන්‍යාධිකාරි - කලාප 11 | : එච්.පී.එස්.නවරත්න | Bsc. Msc. (Forestry), Post Grad. Dip in Forestry for Rural Mgt |
| ස.සාමාන්‍යාධිකාරි - කලාප 111 | : පී.පී.ආර්.සමරවීර | Bsc. Msc. (Forestry) |

## ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්

| | | |
|---|---|---|
| කළමනාකාර - දැව සැපයුම් | : එම්.සී. දේවේන්ද්‍ර | Bsc. Msc (Forestry) |
| කළමනාකාර - මුදල් | : ආර්.ඒ. දයානන්ද | BA, Dip.(Finance & Mgt.) ICASL (L) |
| කළමනාකාර - මුදල් | : ඩී. වික්‍රමසිංහ | Dip.(FA) |
| කළමනාකාර - නීති හා පාලන | : ඩී.කේ.කුරුවිටබණ්ඩාර | MA, Attorney at Law |

## කළමනාකරුවන්

| | | |
|---|---|---|
| කළමනාකාර - මුදල් | : ආර්.එම්.රත්නපාල | H.N.D.A., Post Grad. Dip. in Finance (India)-1st Class, Member A.A.T., Member U.K.A.P. |
| කළමනාකාර - මුදල් | : එච්.ඒ.ජේ.එම්.පීරිස් | ICASL (L), Higher Dip. (Accountancy) |
| කළමනාකාර - නිෂ්පාදන | : ආචාර්ය එම්.පී.එම්. තාරික් | Bsc, Msc, Phd. |
| කළමනාකාර - මිලදීගැනීම් හා නාවික (වැ.බ) | : අරුණ ද සිල්වා | |
| කළමනාකාර - ප්‍රවාහන | : ප්‍රීති නානායක්කාර | |
| කළමනාකාර - පර්යේෂණ, පුහුණු හා සංවර්ධන | : සී.කේ.මුතුමාල | Bsc (Agric.)Hons. Msc (Forestry) |
| කළමනාකාර - විමර්ශණ | : ඒ.පී.තිලකරත්න | |
| කළමනාකාර - ඉරුම්හල් | : ඩබ්.බී. සමන්ත | Bsc. (Gen), Msc. (Forestry), National Dip in Teaching |
| කළමනාකාර - නැවත වනවගා | : ඒ.පී.රත්නසූරිය | |
| කළමනාකාර - විශේෂ ව්‍යාපෘති | : ඒ.එන්.ඩබ්.ඒ.ආනන්ද | |
| කළමනාකාර - ගෘහභාණ්ඩ යන්ත්‍රාගාරය | : මදුර දිසානායක | B.com, Post Grad. Dip in International Affairs |
| | : ජේ.පී.තිසර ගමගේ | Bsc., Msc (Forestry) |

### ප්‍රාදේශීය කළමනාකරුවන්

| | | |
|---|---|---|
| ප්‍රා.ක. - මින්නේරිය | : ආර්. එදිරිසිංහ | |
| ප්‍රා.ක. - බණ්ඩාරවෙල | : පී.කේ.අජිත් චන්දන | Bsc. |
| ප්‍රා.ක. - කොළඹ | : ඩබ්.කීර්ති රෝයි | |
| ප්‍රා.ක. - අනුරාධපුර | : යූ.එස්.එම්.ප්‍රනාන්දු | BA (Sp.) |
| ප්‍රා.ක. - රත්නපුර | : එච්.බී. රජවත්ත | BA |
| ප්‍රා.ක. - නුවරඑළිය | : පී.ගුණවංශ | BA (Sp.), Dip in Forestry |
| ප්‍රා.ක. - මොණරාගල | : යූ.පී.එච්. උළුවඩුගේ | Bsc. |
| ප්‍රා.ක. - නුවර | : ඊ.එම්.එස්.ඒකනායක | |
| ප්‍රා.ක. - යාපනය | : එස්. ශ්‍රී ස්කන්දරාජා | |
| ප්‍රා.ක. - කුරුණෑගල | : ඒ.එස්.විජේසුන්දර | |
| ප්‍රා.ක. - මාතර | : ඩී.එච්.රාජපක්ෂ | Bsc., Msc |
| ප්‍රා.ක. - අම්පාර | : එම්.කේ.පී.වසන්ත රාජ් | |

### සංකීර්ණ භාර කළමනාකරුවන්

| | | |
|---|---|---|
| කළමනාකරු - කල්දෙමුල්ල සංකීර්ණය | : කේ.චන්ද්‍රපාල | BA |
| නි.ප්‍රා.ක. - කල්දෙමුල්ල | : ඩී.එම්. එන් පුෂ්පකුමාර | Bsc. |
| ජ්‍යෙෂ්ඨ ප්‍රා.ක. - කැප්පෙටිපොල | : එම්.පී.ආර්.අබේකෝන් | Dip in Mgt, Dip in Forestry |
| ප්‍රා.ක. - කැප්පෙටිපොල | : ඒ.බී.එම්. වීරසිංහ | BA |

### නියෝජ්‍ය කළමනාකරුවන්

| | | |
|---|---|---|
| නි.කළමනාකාර - පාලන | : එල්.ජේ.ඩී. ද සිල්වා | |
| නි.කළමනාකාර - මානව සම්පත් | : ඊ.ඒ.ඩී.එස්.ඒ.අමරසිංහ | |
| නි.කළමනාකාර - දැව ශ්‍රේණි කිරීම්/වෙන්දේසි | : ටී.එච්.ගුණදාස | |
| නි.කළමනාකාර - වන අපරාධ | : ඩබ්.අයි.සාරංග | Bsc. (Hons.) |
| නි.කළමනාකාර - ආරක්ෂක | : චන්දිම වීරමන් | |
| නි.කළමනාකාර - නිර්මාණ හා තත්වපාලන | : ඊ.එම්.එම්.ප්‍රනාන්දු | |
| පද්ධති විශ්ලේෂක | : ඒ.මාදුවගේ | |
| නි.ප්‍රධාන අභ්‍යන්තර විගණක | : එච්.එම්.එස්. මාධව | Bcom. (Sp) |
| අභ්‍යන්තර විගණක | : ඩබ්.පී.පී.එන්.කේ. ෆොන්සේකා | BLE. (Sp) |

### නියෝජ්‍ය ප්‍රාදේශීය කළමනාකරුවන්

| | | |
|---|---|---|
| නි.ප්‍රා.ක - කොළඹ | : එච්.පී.එස්. දිසානායක | BA |
| නි.ප්‍රා.ක - බණ්ඩාරවෙල | : යූ.වී. කිත්සිරි | Dip in Forestry |
| නි.ප්‍රා.ක - මාතර | : ආර්.විජේතුංග | Bsc. (Agri. Sp.), Msc. (Forestry & Env Mgt) |
| නි.ප්‍රා.ක - අම්පාර | : වයි.බී.එම්. අමීර් | Dip in Forestry |
| නි.ප්‍රා.ක - අම්පාර (ගෘ. නිෂ්පාදනාගාරය) | : ඒ.සී. ජිනේජුදීන් | |
| නි.ප්‍රා.ක - නුවර | : ඩී.ජී.සිරිල් | |
| ප්‍රා.ක. - මොණරාගල | : කේ.ජේ.හේමරත්න | Bsc. (Agri) |
| නි.ප්‍රා.ක - කුරුණෑගල | : ආර්.එම්.එස්.කේ. රත්නායක | |
| නි.ප්‍රා.ක - රත්නපුර | : ඒ.ජී. හේමන්ත කුලරත්න | Dip in Forestry, Dip in Mgt , Dip in English |

# සභාපතිතුමාගේ සමාලෝචනය



**"අප හැම විටම කැපවනුයේ ඉහළ ගුණාත්මකයෙන් යුතු පාලනයක් ඇතිකිරීම සහ වඩා යහපත් ලෙස කටයුතු කිරීමට ආයතනයේ සෑම අංශයක්ම පෙළඹවීම තුළින් ආයතනයේ අරමුණු සාක්ෂාත්කර ගැනීම උදෙසාය."**

රාජ්‍ය දැව සංස්ථාව 45 වසරක අභිමානය සාඩම්බරයෙන් සමරන මෙම සුවිශේෂී වසරේ ගෙවී ගිය කාලය පුරාවට මෙහෙයුම් විෂය පථය පුළුල් කරමින් විජයග්‍රාහී ගමනක මග සලකුණු සනිටුහන්කොට ඇති බව පවසන්නේ හද පිරි සතුටිනි. 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ සංස්ථාවේ මෙහෙයුම් පිළිබඳ අවබෝධයක් ලබාගත හැකි මූල්‍ය කාර්යසාධනයත්, මූල්‍ය තත්වයත් පිළිඹිබු කෙරෙන විගණනය කරන ලද වාර්ෂික ගිණුම් ඇතුළත් වාර්ෂික වාර්තාව එලි දක්වන්නේ සාඩම්බරයෙනි. අප, ජාතියේ විශ්වසනියත්වය දිනූ අනර්ඝතම දැව හා දැවමය භාණ්ඩ සැපයුම්කරු ලෙස පුරෝගාමී නායකත්වයක් උසුලනු ලබයි. ප්‍රාදේශිය කාර්යාල 12ක්, අලෙවි මධ්‍යස්ථාන 54 ක් හා 200 කට අධික දැව හෙළීම් සිදු කරන ක්‍රියාකාරී වැඩබිම් සහ දැව පදම්කිරීමේ හා පරිරක්ෂණය කිරීමේ යන්ත්‍රාගාර වලින් සමන්විත ගෘහභාණ්ඩ නිෂ්පාදනාගාර 03 ක් අප සතුව පවතී. තිරසාර සහ ලාභදායි ව්‍යාපාරයක් ලෙස සාර්ථකත්වයක් අත්පත් කර ගැනීමට දිවයින පුරා ශාඛා ව්‍යාප්තියත්, ඇල්මති පාර්ශවයන් අතර ප්‍රබල සහයෝගිතාවයක්, භාණ්ඩ විවිධාංගිකරණය සහ නවීන තාක්ෂණය පිටුවහල්වූ බව කිවයුතුය.

2012 වර්ෂයේ 6.4% ආර්ථික වර්ධන අනුපාතයට සාපේක්ෂව ශ්‍රී ලංකාව 7.3%ක ආර්ථික වර්ධන අනුපාතයක් 2013 වර්ෂයේ ලඟාකරගත් අතර, අන් අංශවලට සාපේක්ෂව සේවා අංශය මගින් ඊට වැඩි දායකත්වයක් ලබාදුනි. ගෝලිය ආර්ථික වර්ධන අනුපාතය අඩු අගයක් ගත්ත ද ශ්‍රී ලංකාවට නව වෙළඳපොළ විවරවීමත්, රාජ්‍ය මැදිහත්වීමෙන් උද්දමන අනුපාතය ස්ථාවර මට්ටමක පවත්වා ගැනීමත් හේතුවෙන් වේගවත් ආර්ථික වර්ධනයක් කරා ගමන් කරමින් සිටී.

රාජ්‍ය දැව සංස්ථාවේ කාර්ය සාධනයට ප්‍රබලව බලපාන සාදක අතර වන කළමනාකරණය පිළිබඳ ආර්ථික, සමාජයිය, දේශපාලනික සහ ජිවවිද්‍යාත්මක පසුබිම තේරුම් ගැනීමත්, එම අංශ සමබර කරගැනීමත් අවදානම් සහිත සහ අභියෝගාත්මක සංසිද්ධියකි. වන විනාශය අද පවත්නා දැවැන්ත පාරිසරික අර්බුදයකි. දැව හා දැවමය භාණ්ඩ සඳහා ඇති ඉහළ ඉල්ලුම හේතුවෙන් නීත්‍යානුකුල නොවන අයුරින් වන විනාශය සිදුකිරීමට පෙළඹී ඇති වකවානුවක නියමාකාරයේ වන කළමනාකරණයක් තුළින් පමණක් වන සම්පත අනාගත පරපුරේ පරිභෝජනය සඳහා රැකගත හැකිවේ. තිරසාර දැව අස්වනු නෙළීම වන විනාශයට හේතු නොවේ. එනම්, දැව අස්වනු නෙළීමේදි වන වගා භූමියේ නිෂ්පාදන හැකියාව ආරක්ෂා වන පරිදි ඉතා ක්‍රමවත්ව හා විද්‍යානුකුලව කටයුතු කිරීමෙන් සහ වයස්ගත ශාක වෙනුවට නව ශාක රෝපණය කොට නව වනවගා ඇතිකිරීමට කටයුතු කිරීම තුලින් පමණක් සමාජයට දිගුකාලින ප්‍රතිලාභ සලසා ගත හැකිවේ. කෙසේ නමුත්, ශාක යනු සදහටම පවතින ජිවයක් නොවේ. කිසියම් මොහොතක පරිණත ශාක දිරාපත්ව ගොස් ඒ වෙනුවට වේගයෙන් වැඩෙන ළදරු ශාක එම භූමිය ආක්‍රමණය කිරීම තුළින් ස්වභාවිකව ම පරිණත ශාක මිය ගොස් ඒ වෙනුවට නව ශාක ප්‍රතිස්ථාපනය වීම සිදුවේ.

මෙවන් පසුබිමක් තුළ අප සංස්ථාව රුපියල් මිලියන 2,894 ක පිරිවැටුමක් ලබාගත් අතර, පසුගිය වසරේ එම අගය රුපියල් මිලියන 3,270ක් වූ අතර, එය ඉකුත් වසරට සාපේක්ෂව 11% ක පසුබෑමකි. රාජ්‍ය දැව සංස්ථාව ඉපැයූ බදු පෙර ශුද්ධ ලාභය මෙම වසරේ රුපියල් මිලියන 382 ක් වූ අතර, පසුගිය වසරේ එය රු. මිලියන 802 ක් ලෙස වාර්තාවී ඇත. සැලකිය යුතු අගයකින් පිරිවැටුමේ අගය අඩු වීම ආර්ථික, දේශපාලනික සහ සමාජීය වැනි නොවැළැක්විය හැකි හේතු සාධක ගණනාවක ප්‍රතිඵලයකි. රු. මිලියන 1,245 ක ස්කන්ධභාග, මෙහෙයුම් බදු සහ භාණ්ඩාගාරයට ගෙවූ විශේෂ බදු වශයෙන් රාජ්‍ය දැව සංස්ථාව ජාතික ආර්ථිකයට සැලකියයුතු දායකත්වය සපයා ඇත.

සංස්ථාව සතු වටිනාම සම්පත වන්නේ මානව සම්පත බව අපගේ විශ්වාසයයි. 2013 කාලපරිච්ඡේදය තුළදි පෙර වර්ෂ මෙන්ම අප සංස්ථාව විසින් මානව සම්පත පුහුණු හා වෘත්තිය සංවර්ධන වැඩසටහන් තුළින් කුසලතා සහ දක්ෂතා වැඩිදියුණු කොට පාරිභෝගිකයන්ට වඩා කාර්යක්ෂම සහ උපරිම සේවයක් සැපයීම මෙන්ම ආයතනයේ ඉලක්ක මුදුන් පමුණුවා ගැනීමේ අරමුණින් කටයුතු කරන ලදි.

රාජ්‍ය දැව සංස්ථාව හැමවිට උත්සාහ දරනුයේ සංස්ථාවේ සියලුම අංශ තුළ යහපත් පාලනයත් සමග වඩා හොඳ ක්‍රියාපිළිවෙතකට අනුව කටයුතු කිරීම සඳහා ය. අපගේ සාර්ථකත්වයට සාක්ෂි සපයනු වස් “දැව ජවයට නව ජවයක්” යන තේමාව ශක්තිමත් කරමින්, රාජ්‍ය දැව සංස්ථාව මෙම වසරේ දි ජාතික ව්‍යාපාර විශිෂ්ටතා සම්මාන උළෙලේදි යළිත් වරක් කුසලතා සම්මානයකින් පිදුම් ලැබිය. අනාගත පුනර්ජිනය උදෙසා වගකිමෙන් සහ ස්ථාවරත්වයෙන් ද, නිර්මාණශිලි නවෝත්පාදනයන් ද සමගින් ආයෝජනය කිරීමට අපි උත්සුකවන්නෙමු. තවද, දේශයේ සංස්ථාපිත පුරවැසියෙකු ලෙස රුක් රෝපණය තවදුරටත් ශක්තිමත් කිරීම උදෙසා හඳුනාගත් පාසල් කිහිපයක් සඳහා ද්‍රව්‍යමය හා මුදල්මය ආධාර ලබාදෙමින් තරුණ පුරපුරේ ශාක වගාකිරීම සම්බන්ධ ඇල්ම වැඩිකිරීමේ අරමුණින් තුරුජන සිසු බැංකු රුක්රෝපණ වැඩසටහන ක්‍රියාත්මක කරන ලදි. තවද, ,දැයට සෙවණ, ජාතික රුක්රෝපණ වැඩසටහන වෙනුවෙන් කුඩා පැළ 88,000 ක් ලබාදෙන ලදි. එදිනෙදා කසල බැහැර කිරීමේදි ඒවා කඩදාසි, පොලිතින්, කාබනික ද්‍රව්‍ය ලෙස වර්ගිකරණය කොට අපහරණය කිරීමට වගබලා ගනිමු. තවද, සමාජය අතර දැව භාවිතය හා සම්බන්ධ දුර්මත දුරලීමේ අරමුණු පෙරදැරිව, දැයට කිරුළ, ප්‍රදර්ශනය සඳහා ක්‍රියාකාරිව සම්බන්ධ විමු.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් ගරු පරිසර හා පුනර්ජනනිය බලශක්ති අමාත්‍යතුමාටත්, අමාත්‍යාංශ ලේකම්තුමා හා එම කාර්ය මණ්ඩලයටත්, වනසංරක්ෂක ජනරාල්තුමා ඇතුළු එම දෙපර්තමේන්තුවට අනුයුක්ත සියලුම කාර්යය මණ්ඩලයටත්, අනෙකුත් සියලුම රජයේ නිලධාරීන්ටත් අපහට ලබාදුන් ඉමහත් සහයෝගය වෙනුවෙන් කෘතවේදිත්වය පුදකරමි. විවිධ දුෂ්කරතා සහ අභියෝග හමුවේ අපගේ සාමාන්‍යාධිකාරීතුමා ඇතුළු සේවක මණ්ඩලය ඔවුන්ගේ ශක්තීන් හා උපාය කෞශල්‍යයන් අඛණ්ඩව කැපකරමින්, සංස්ථාවේ කාර්ය සාධනය ඉහළ තලයකට නංවාලීමට ගත් ප්‍රසංශනිය කාර්යභාරය වෙනුවෙන් අපගේ විශේෂ ස්තුතිය ඔවුන් වෙතද පුදකර සිටිමු.

2014 නව වර්ෂය ඉතා පහසු වසරක් ලෙස අප අපේක්ෂා නොකරනමුත්, කෙටිකාලින අභියෝග නොසලකා නිරතුරුවම දිගුකාලින අභියෝග කරා යොමුවෙමින්, අපේක්ෂිත ඉලක්ක ලඟාකරගැනීම උදෙසා අපගේ හැකියාවන් උපරිමයෙන් කැපකරමින් විශිෂ්ඨ ප්‍රතිඵල අත්කරදීම පිණිස ඇපකැප වී සිටින්නෙමු.

එස්. අමරසිංහ
සභාපති
රාජ්‍ය දැව සංස්ථාව

# සාමාන්‍යාධිකාරීතුමාගේ සමාලෝචනය



**"අප විසින් ආඩම්බර විය හැකි ගෞරවාන්විත කීර්ති නාමයක් ස්ථාපිත කර ඇත. වෙළඳපොලෙහි අවුරුදු 45ක පලපුරුද්ද සමග ඉතාමත් අනර්ඝ තත්වයේ දැවමය භාණ්ඩ සාධාරණ මිලට සපයන අතර නිත්‍ය පාරිභෝගිකයන් මෙන්ම නව පාරිභෝගිකයන් ද අපගේ සේවය පිළිබඳ අතිශයින් තෘප්තිමත්ය."**

රාජ්‍ය දැව සංස්ථාවෙහි වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම පිළිබඳ මා ඉතාමත් සතුටට පත් වන අතර, මෙම වර්ෂය රාජ්‍ය දැව සංස්ථාව 45 වැනි සංවත්සරය සනිටුහන් කරන බව පවසන්නේද අතිශය සන්තෘප්තියෙනි. සෑම අභියෝගයකට ම සාර්ථකව මුහුණදිමටත්, ගෞරවාන්විත කීර්තිනාමයක් ස්ථාපිත කිරීමටත් හැකි විය. වෙළඳපොලෙහි අවුරුදු 45ක පළපුරුද්ද සමග ඉතාමත් අනර්ඝ තත්වයේ දැවමය භාණ්ඩ සාධාරණ මිලට සපයන අතර, නිත්‍ය පාරිභෝගිකයන් මෙන්ම නව පාරිභෝගිකයන් ද අපගේ සේවය පිළිබඳ අතිශයින් තෘප්තිමත් ය.

දැව සහ දැව ආශ්‍රිත භාණ්ඩ සැපයීමෙහි පුරෝගාමියෙකු වශයෙන් නිෂ්පාදන කර්මාන්තය ඔසවා තැබීම සඳහා රාජ්‍ය දැව සංස්ථාව ඉතා වැදගත් කර්තව්‍යයක් අඛණ්ඩව ඉටුකරනු ලබයි. අපගේ දැක්මට අනුව ජාතියේ විශ්වසනීයත්වය දිනූ අනර්ඝතම දැව හා දැවමය භාණ්ඩ සැපයුම්කරුවීම සහ දැව වෙළඳපොළෙහි සැබෑ නායකත්වය ඉසිලීම වෙනුවෙන් මෙහෙයුම් ක්‍රියාවලියේ වැඩිදියුණුව සඳහා ප්‍රමුඛත්වය ලබා දෙන්නෙමු. රාජ්‍ය දැව සංස්ථාව දිවයින පුරා පැතිරී ගිය ප්‍රාදේශීය කාර්යාල 12ක් සමඟ දේශයේ ප්‍රමුඛයා ලෙස දිගින් දිගට ම ශක්තිමත්ව නැගී සිටී. නව තාක්ෂණය නිෂ්පාදනයට උපයෝගී කර ගනිමින් මිනිසුන්ගේ ජීවිත නඟාසිටුවීම උදෙසා රාජ්‍ය දැව සංස්ථාව අනුපමේය මෙහෙයක් ඉටුකරයි.

වගකීමෙන් යුතු දැව අස්වනු නෙළීම තිරසාර වන කළමනාකරණයකට හේතු වන බව අපගේ විශ්වාසයයි. තිරසාර වන කළමනාකරණය වේගවත් සහ ක්‍රමයෙන් විකාශනය වන සංකල්පයක් වශයෙන්, වර්තමාන සහ අනාගත පරපුරෙහි අභිවෘධිය සඳහා වන සම්පතෙහි ආර්ථික, සමාජීය සහ පාරිසරික වටිනාකම් ආරක්ෂා කිරීමටත් උසස් කිරීමටත් කටයුතු කරයි.

රාජ්‍ය දැව සංස්ථාව රුපියල් මිලියන 3,270 ක පසුගිය වර්ෂයෙහි පිරිවැටුමට සාපේක්ෂව රුපියල් මිලියන 2,894 ක පිරිවැටුමක් මෙම වසරේ උපයා ඇත. මෙම පසුබෑමට ප්‍රධානම හේතුව වශයෙන් සිල්පර, දැව කඳන්, ඉරූ දැව සහ විදුලි කණු විකුණුම් ආදායමෙහි අඩුවීම පෙන්වා දිය හැක. කෙසේ නමුත් රාජ්‍ය දැව සංස්ථාව රුපියල් මිලියන 382ක බදු පෙර ශුද්ධ ලාභයක් පෙර වසරේ රුපියල් මිලියන 802 ක් වූ බදු පෙර ශුද්ධ ලාභයට සාපේක්ෂව උපයා ඇති අතර, ජාතික ආර්ථිකයට රුපියල් මිලියන 1,277ක දායකත්වයක් සැපයීමෙන් පසු ශුද්ධ ලාභය රුපියල් මිලියන 182ක් ද ලෙස වාර්තාගත කොට ඇත. ඊට අනුරූපීව වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය 8% ක් ලෙසද, ස්කන්ධය මත ප්‍රතිලාභ අනුපාතය 11% ක් ද වාර්තා කිරීමට සංස්ථාව සමත් වී තිබේ. කෙසේ වුවත්, සමාලෝචිත මූල්‍ය වර්ෂය තුළ සංස්ථාව විසින් දුර්වල කාර්යසාධනයක් පෙන්නුම් කිරීමට එවකට පැවති සමාජීයය, දේශපාලනික, පාරිසරික සහ ආර්ථික අවාසිදායක තත්වයන් දැඩිව බලපා ඇති බව සටහන් කළ යුතුය.

අපගේ ඉහළ නිෂ්පාදන ප්‍රමිතීන් තවදුරටත් තහවුරු කරමින් 2013 මූල්‍ය වර්ෂය තුළදී, අප ලඟාකරගත් සුවිශේෂී ජයග්‍රහණ පිළිබඳව සනිටුහන් කරනුයේ අතිශය ආඩම්බරයෙනි. රටේ ආර්ථික දියුණුවට දායකත්වය සපයමින්, විශිෂ්ඨ අයුරින් ව්‍යාපාර කටයුතු මෙහෙයවන ව්‍යාපාරික ආයතන හඳුනාගැනීම පිණිස ශ්‍රී ලංකා ජාතික වාණිජ්‍ය මණ්ඩලය මගින් පවත්වන ලද 2013 ජාතික ව්‍යාපාර විශිෂ්ඨතා සම්මාන උළෙලේදී, රාජ්‍ය නිෂ්පාදන අංශයට හිමි විශිෂ්ඨත්ව කුසලතා සම්මානයෙන් පිදුම් ලැබීය. තවදුරටත් අපගේ රඳාපැවැත්ම උදෙසාම නොව, අපගේ ඉදිරි පරපුර වෙනුවෙන් පරිසරය පිළිබඳ සැලකිලිමත්වීමේ හා වගකීමේ අවශ්‍යතාවය හඳුනාගනිමින් "දැයට සෙවණ" ජාතික රුක් රෝපණ වැඩසටහන යටතේ සංස්ථාව සතු තවාන්වල සාදන ලද පැල වර්ග 88,000ක් බෙදා දෙන ලදි. එමෙන් ම තරුණ ප්‍රජාව අතර රුක් රෝපණය පිළිබඳ ඇල්ම වැඩිකිරීමේ අරමුණින් ලෝක පරිසර දිනයට සමගාමීව "තුරුජන සිසු බැංකු" රුක් රෝපණ වැඩසටහන ඵලදායි ලෙස අඛණ්ඩව මේ වසරේදීත් ක්‍රියාත්මක කරන ලදි.

අපගේ භාණ්ඩවල ගුණත්වය පිළිබඳ තවමත් පාරිභෝගිකයන් අතර ගොඩනැගී ඇති කීර්තිනාමය අඛණ්ඩව පවත්වාගෙන යෑම අපගේ අරමුණයි. සේවකයන්ගේ අභිප්‍රේරණය ඉහළ මට්ටමක පවතින බැවින් අපගේ අභිමතාර්ථය වන්නේ තවදුරටත් නිෂ්පාදනයන්ගේ ගුණාත්මක බව හා ඵලදායිතාවය පිළිබඳ මහත් සේ සැලකිල්ලට ගෙන එමගින් රාජ්‍ය දැව සංස්ථාව එහි හිනි පෙත්තට ගෙන ඒමයටයි.

අවසාන වශයෙන් සංස්ථාවේ උන්නතිය පිණිස අඛණ්ඩව කැපවී කටයුතු කරන පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා, නියෝජ්‍ය අමාත්‍යතුමා, අමාත්‍යාංශ ලේකම්තුමා, සභාපතිතුමා, හා ක්‍රියාකාරී අධ්‍යක්ෂතුමා ප්‍රමුඛ අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාරය මා ඉතා අගය කොට සලකන අතර, දැව හා දැව ආශ්‍රිත නිෂ්පාදන සැපයුම්කරු ලෙස අඛණ්ඩව අප වෙත දැඩි පක්ෂපාතීත්වයක් දක්වමින්, අපගේ සාර්ථකත්වයට අත්තිවාරම සපයන්නා වූ පාරිභෝගික හිතවතුන්ට ද, මාගේ කෘතඥතාවය පිරිනමන අතර, අපගේ බැඳීම තවදුරටත් ශක්තිමත් කරගනු වස් හැකි උපරිම ශක්‍යතාවයෙන් ඔබ හට අනර්ඝතම නිෂ්පාදන සැපයීමට ද අපි සැදී පැහැදී සිටිමු.

සාර්ථකත්වයේ මාවත ඔස්සේ වේගවත් හා තිර ගමනක් යෑම පිණිස අචල සහයෝගයක් දක්වන මාගේ කළමනාකරණ මඩුල්ලේ සියලුම සහෘදයන්ට සහ සැමදා ලැදියාවෙන්, දැඩි පරිශ්‍රමයකින් හා කැපවීමකින් ක්‍රියාකරනු ලබන 2,139 කට අධික අපගේ කාර්යය මණ්ඩලයට මාගේ අතිශය ගෞරවය පිරිනමන අතර, නන් අයුරින් සහයෝගය ලැබ දුන් සියලු දෙනාටත් මාගේ හෘදයාංගම ප්‍රණාමය පුදකර සිටිමි.

පී.පී. කුමාරසිංහ සිරිසේන
සාමාන්‍යාධිකාරී
රාජ්‍ය දැව සංස්ථාව

# අපගේ කාර්යභාරයන්

වනාන්තරවලින් දැව කපා ඉවත්කිරීම, එම දැව ඉරූ දැව හා නිමි භාණ්ඩ බවට පරිවර්තනය කිරීම, දැව කඳන්, ඉරූ දැව හා නිමි භාණ්ඩ නිෂ්පාදන අලෙවිය සහ යථෝක්ත කාර්යයන් සඳහා කැලෑ මාර්ග ඉදිකිරීම.

දැව කඳන් කිරීමේ මධ්‍යස්ථාන, ඉරුම් මෝල්, තෙල් කැවීමේ හා පරිරක්ෂණ යන්ත්‍රාගාර, දැව වියළීම හා වියළීමේ උඳුන් හා අවශ්‍ය උපකරණ මිළදීගැනීම, ඉදිකිරීම හා ක්‍රියාකරවීම.

දැව අලෙවි මධ්‍යස්ථාන පවත්වාගෙන යාම.

දැව අතුරු භාණ්ඩ නිෂ්පාදනය හා අලෙවිය.

දැව ආනයනය කිරීම.

නව වනවගා ව්‍යාපෘති ආරම්භ කිරීම, නැවත වනවගා කිරීම, කැලෑ සහ වනවගාවන් විද්‍යාත්මකව කළමනාකරණය කිරීම.

කෘෂිකාර්මික නිෂ්පාදන.

දැව ආශ්‍රිත නිමි හා අර්ධ නිමි භාණ්ඩ නිෂ්පාදන අපනයනය කිරීම.

පෞද්ගලික ඉඩම් වලින් දැව මිලදීගැනීම.

වනාන්තර ආශ්‍රිත නිෂ්පාදන පිරි සැකසුම.

වේවැල් ආනයනය කිරීම.

නියැඳි පරීක්ෂා කිරීම් මගින් දේශිය හා ආනයනය කරන ලද දැව හඳුනා ගැනීම සහ දැව සම්බන්ධ සහතික නිකුත් කිරීම.

දැව කර්මාන්තය ආශ්‍රිත විෂයයන් පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම, සහතික ප්‍රදානය කිරීම සහ පරිසරය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම.

සංස්ථාවට අයත් ඉඩම් හා ගොඩනැගිලිවල සම්පූර්ණ ප්‍රයෝජනය ලබාගැනීම සඳහා සැලසුම් කිරීම සහ ඒ වෙනුවෙන් ආයෝජනය කිරීම.

# අපගේ ව්‍යාපාරික වටිනාකම්

ඉතාමත් පරිසර හිතකාමී සහ වාණිජ වශයෙන් ජීවමාන රාජ්‍ය අංශයේ ආයතනයක් ලෙස අපගේ ස්ථාවරත්වය පවත්වාගෙන යෑම අපගේ ප්‍රමුඛ වගකීම ලෙස හඳුනාගනිමු.

පිවිතුරු සහ හිතකාමී පරිසරයක් සුරක්ෂිත කිරීම සඳහා වනාන්තර සහ දැව ඉවත් කිරීමේ විද්‍යානුකූල කළමණාකරණයට සම්බන්ධ සියළුම ව්‍යවස්ථාපිත රෙගුලාසීන්ට අනුකූලව එය ඉටු කිරීමට අපි කැපවෙමු.

අපගේ ගනුදෙනුකරුවන් සමඟ ආචාරශීලි ව්‍යාපාරික සබඳතා ගොඩනඟා ගනිමින්, ඔවුනට සහ සියළුම ශ්‍රී ලාංකිකයන්ට වටිනාකම් නිර්මාණය කිරීම අපගේ පැවැත්මේ මූලික ම කාරණය ලෙස අපි පිළිගන්නෙමු.

කුසලතා වර්ධනය, වෘත්තිය සංවර්ධනය සහ නිරන්තර අධ්‍යාපනය සහ පුහුණුව තුළින් අපගේ සේවා නියුක්තිකයන්ගේ ඵලදායිතා මට්ටම ඉහළ නැංවීම සඳහා කටයුතු කරන්නෙමු.

අපගේ ගනුදෙනුකරුවන්ට කාර්යක්ෂම සහ ආචාරශීලි සේවයක් සැපයීම සඳහා අපගේ සියළු කාර්යයන්හි දී ඔවුන්ව මූලිකව තබා ගනිමින් කටයුතු කරන්නෙමු.

අපගේ සියළුම මෙහෙයුම් කටයුතු වලදී සහ සේවා සැපයීමේදී පුද්ගලික අවංකභාවය ඉතා ඉහළින්ම තබා ගන්නා බවට සහතික වන්නෙමු.

අපගේ අනාගත පරපුරේ අගනා ජාතික උරුමයන් ලෙස පරිසරය සහ වන සම්පත ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් සියළුම ව්‍යවස්ථාපිත රෙගුලාසි සහ සමාජීය ප්‍රතිමාන අනුගමය කරන්නෙමු.



# අධ්‍යක්ෂක මණ්ඩලය - 2013

| | | |
|---|---|---|
| එස්. අමරසිංහ මහතා | - | සභාපති - රාජ්‍ය දැව සංස්ථාව |
| කේ.එච්. හෙට්ටිආරච්චි මහතා | - | ක්‍රියාකාරී අධ්‍යක්ෂක - රාජ්‍ය දැව සංස්ථාව |
| ඒ.කේ.ඒ.වයි. තරංග මහතා | - | භාණ්ඩාගාර නියෝජිත |
| කේ. පී. ආරියදාස මහතා (2013.11.12 දින විශ්‍රාම යන ලදී) | - | වනසංරක්ෂක ජනරාල් |
| අනුර සතුරුසිංහ මහතා | - | වනසංරක්ෂක ජනරාල් |
| මහාචාර්ය හිරාන් අමරසේකර මහතා | - | අධ්‍යක්ෂක |
| චම්පික කරුණාරත්න මහතා | - | අධ්‍යක්ෂක |
| මේරි ඩික්මන් මහත්මිය | - | අධ්‍යක්ෂක |





පී.ජී.කුමාරසිංහ සිරිසේන
සාමාන්‍යාධිකාරී









එම්.වී.කරුණාරත්න
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(මෙහෙයුම්)

කේ.සිරිනිවංශ
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(මානව සම්පත් හා පාලන)

ඩී.යූ.දයාරත්න
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(තොරතුරු තාක්‍ෂණ)

ජී.සේනානායක
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(අලෙවි)

# ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මඬුල්ල

# 2013

## රාජ්‍ය දැව සංස්ථාව



ඩබ්.ඩබ්.එම්.ජේ.කුරේ
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි
(අභ්‍යන්තර විගනක)



එච්.එම්.පී.බී.හේරත්
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි
(නිෂ්පාදන හා තාක්ෂණ)



ආචාර්ය එන්.රුවන්පතිරණ
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි
(පර්යේෂණ,පුහුණු හා සංවර්ධන)



පී.ඩී.එස්. කුමාරසිංහ
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි
(මුදල්)

# 2013 වර්ෂය සඳහා අධ්‍යක්ෂක මණ්ඩල සමාලෝචනය

රාජ්‍ය දැව සංස්ථාවේ 2013 විගණනය කරන ලද වාර්ෂික ගිණුම් ඇතුලත් වාර්ෂික වාර්තාව එළිදක්වන්නේ හදපිරි සතුටිනි.


## අධ්‍යක්ෂක මණ්ඩලය 2013

| | |
|---|---|
| එස්. අමරසිංහ මහතා | - සභාපති, රා.දැ.ස |
| කේ.එච්. හෙට්ටිආරච්චි මහතා | - ක්‍රියාකාරී අධ්‍යක්ෂක, රා.දැ.ස |
| ඒ.කේ.ඒ.වයි. තරංග මහතා | - භාණ්ඩාගාර නියෝජිත |
| කේ. පී. ආරියදාස මහතා (2013.11.12 දින විශ්‍රාම යන ලදි) | - වනසංරක්ෂක ජෙනරාල් |
| අනුර සතුරුසිංහ මහතා | - වනසංරක්ෂක ජෙනරාල් |
| මහාචාර්ය හිරාන් අමරසේකර මහතා | - අධ්‍යක්ෂක |
| චම්පික කරුණාරත්න මහතා | - අධ්‍යක්ෂක |
| මේරි ඩික්මන් මහත්මිය | - අධ්‍යක්ෂක |


මෙම වර්ෂයේ සංස්ථාව විසින් රු.මිලියන 2,894 ක පිරිවැටුමක් ලඟාකරගත් අතර, (පසුගිය වසරේ පිරිවැටුම රු.මිලියන 3,270 කි) එය පසුගිය වසරට සාපේක්ෂව 11.5% ක පහළයාමකි. මෙම අඩුවීමට බොහෝ කරුණු හේතුවිය. විශේෂයෙන් ප්‍රධාන ආදායම් උපදවන ප්‍රභවයන් වන දැව කඳන් අලෙවිය අඩුවීම, සිල්පර අලෙවියේ අඩුවීම, මෙන්ම අධික සේවක පිරිවැය නොවැළැක්විය හැකි පරිපාලන වියදම් ඉහළයාම, විකුණුම් හා බෙදාහැරීම් වියදම් ඉහළයාම සංස්ථාවේ ආදායම අඩුවීමට සාපේක්ෂව විශාල බලපෑමක් එල්ලකරන ලදි. සංස්ථාවේ මුළුපිරිවැය පසුගිය වසරට සාපේක්ෂව 3% කින් වැඩි වී තිබේ.

දළ ලාභය 23% කින් අඩුවී ඇති අතර, එය රු.මිලියන 1,198 ක් විය.

### පිරිවැටුම (රු. මිලියන)




### දළ ලාභය (රු. මිලියන)





| කාර්යසාධනය | 2013 (රු. මිලියන) | 2012 (රු. මිලියන) |
|---|---|---|
| පිරිවැටුම | 2,894 | 3,270 |
| දළ ලාභය | 1,198 | 1,546 |
| වෙනත් මෙහෙයුම් ආදායම් | 61 | 76 |
| මෙහෙයුම් ලාභය | 124 | 584 |
| අතිරික්ත අරමුදල් ආයෝජන පොලි ආදායම, විදේශ විනිමය හුවමාරු ලාභ/අලාභ ගොඩනැගිලි කුලී | 258 | 218 |
| භාණ්ඩාගාරයට ගෙවූ විශේෂ බදු | 50 | 600 |
| භාණ්ඩාගාර හා ආදායම් බදු වලට පෙර ශුද්ධ ලාභය | 382 | 802 |
| යෙදවූ වත්කම් මත ප්‍රතිලාභ | 8% | 18% |

ආයතන හා පරිපාලන, විකුණුම් හා බෙදාහැරීමේ වියදම් රු.මිලියන 1,135 දක්වා වර්ධනය වූ අතර, පසුගිය වසරේ එය රු.මිලියන 1,038 කි. ආයතන හා පරිපාලන වියදම් වල වැඩිවීම පසුගිය වසරට සාපේක්සව 12%ක් වන අතර, විකුණුම් වලින් එය 23% අගයක් ගනී. නමුත් පසුගිය වසරට සාපේක්ෂව විකුණුම් හා බෙදාහැරීමේ වියදම් ඉහල ගියේ 6% ක් වැනි ප්‍රතිශතයකිනි.


රාජ්‍ය දැව සංස්ථාවේ කෙටිකාලීන අවදානම් සහ අවිනිශ්චිතතා වලට මූලිකව ජාතික ආර්ථික තත්වය සහ පාරිසරික සාධක හේතු වශයෙන් දැක්විය හැක. බොහෝ අමුද්‍රව්‍ය මිළගණන් ඉහල යෑමක් දක්නට ලැබුණු අතර, ඊට රටතුළ පැවති වෙළඳපොළ තත්වය විශාල ලෙස බලපාන ලදී. මේ සියලු බාධක මැඩපවත්වා ගෙන ලාභයෙහි අඛණ්ඩ වර්ධනයක් අත්පත් කරගැනීම සංස්ථාවේ උපායමාර්ගයන් හි තීරණාත්මක අංගයක් වේ. අහිතකර වෙළෙඳපොළ තත්වයන් නිසා අමුද්‍රව්‍ය මිළගණන් සැලකිය යුතු ලෙස වැඩිවී ඇති අතර, අමුද්‍රව්‍ය හිඟ බවත්, ඉහළ නිෂ්පාදන පිරිවැයත් සංස්ථාවේ නිෂ්පාදන ක්‍රියාවලියට සෘජුවම බලපෑ ප්‍රධාන සාධක විය.

## වෙනත් මෙහෙයුම් ආදායම් (රු. මිලියන)





2013 වසර අවසානයේ දී රාජ්‍ය දැව සංස්ථාව සතුව 2139 ක් වූ ස්ථිර සේවක පිරිසක් සේවයේ යෙදුනු අතර (2012 : 2,187) මුළු සේවක පිරිවැය රු.මිලියන 1,117 (2012 : රු.මිලියන 1,065) ක් දක්වා වර්ධනය විය. 2012 වර්ෂයට සාපේක්ෂව එය 5% ක ඉහලයාමකි.

## මෙහෙයුම් ලාභය (රු. මිලියන)




2013 වර්ෂය තුල දී රු.මිලියන 388 එකතු කළ අගය මත බදු ලෙස හා ජාතිය ගොඩනැගීමේ බදු ලෙස දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවන ලද අතර, මීට අමතරව අනෙකුත් බදු හා ආදායම් බද්ද සඳහා ද සංස්ථාව බදු මුදල් නිසි කළට ගෙවනු ලබයි. එමෙන්ම විශේෂ බදු වශයෙන් රජයේ භාණ්ඩාගාරයට රු.මිලියන 50ක් ලබාදීමට ද කටයුතු කරන ලදී.

## භාණ්ඩාගාර හා ආදායම් බදු පෙර ශුද්ධ ලාභය (රු. මිලියන)




ආයතන හා පරිපාලන වියදම් සහ විකුණුම් හා බෙදාහැරීමේ වියදම් අඩු කිරීමෙන් පසු විශේෂ භාණ්ඩාගාර බදු සහ ආදායම් බදු පෙර ශුද්ධ ලාභය රු.මිලියන 382 ක් දක්වා පහල ගිය අතර, 2012 වසරේ එය රු.මිලියන 802 ක් ලෙස වාර්තා විය. කෙසේවෙතත් වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය 2013 වසරේ 8% වූ අතර 2012 වසරේ 18% ක් විය.

# නිෂ්පාදනය

| දැව විශේෂය | පූර්ණ හෙලිම් (හෙක්ටයාර) | | තුනී කිරීම් (හෙක්ටයාර) | |
|---|---|---|---|---|
| | 2013 | 2012 | 2013 | 2012 |
| තේක්ක | 600.0 | 558.5 | - | 87.8 |
| යුකැලිප්ටස් | 26.0 | 152.7 | 352.2 | 336.8 |
| පයිනස් | 124.6 | 83.3 | - | - |
| කායා | - | - | - | 10.6 |
| ඇකේෂියා | 27.0 | 35.5 | - | - |

## රජයේ කැලෑවලින් දැව හෙලිම්

වන සංරක්‍ෂණ දෙපාර්තමේන්තුව විසින් වන කළමනාකරණ සැලැස්මකට අනුව හෙලිම් සඳහා තේක්ක, පයිනස් සහ යුකැලිප්ටස් වැනි වනවගා නිදහස් කරනු ලබන අතර 2012 හා 2013 වර්ෂ වල හෙලිම් සඳහා නිදහස් කර ඇති හෙක්ටයාර් ප්‍රමාණය ඉහත දක්වා ඇත.

## ඉරූ දැව පරිවර්තනය කිරීම

2012 වර්ෂයේ ඉරූදැව නිෂ්පාදනය ඝන මීටර් 4,955 ට සාපේක්‍ෂව 2013 වර්ෂය තුළදී ඉරූදැව ඝන මීටර් 4,117 ක් ඉරුම්හල් මගින් නිෂ්පාදනය කර ඇති අතර, ඝන මීටර් 2,487 ක් දිවයින පුරා පිහිටා ඇති දැව අලෙවි ගබඩා මගින් අලෙවි කර ඇත.

## විදුලි කණු සහ සිල්පර පරිරක්‍ෂණය කිරීම


2013 වර්ෂය තුලදී සිල්පර 73,526 ක්, විදුලිකණු 31,887 ක් හා අලිවැටකණු 26,475 ක් රාජ්‍ය දැව සංස්ථාවේ කල්දෙමුල්ල, කැප්පෙටිපොල හා බුස්ස පරිරක්‍ෂණාගාර වලින් පරිරක්‍ෂණය කර ඇත. පසුගිය වසරට සාපේක්‍ෂව 2013 වසරේ සිල්පර සහ අලිවැටකණු පරිරක්‍ෂණයේ සැලකිය යුතු පසුබෑමක් දක්නට ඇත.

## ගෘහභාණ්ඩ නිෂ්පාදනය

රාජ්‍ය දැව සංස්ථාවේ අම්පාර, කල්දෙමුල්ල හා බුස්ස ගෘහභාණ්ඩ නිෂ්පාදනාගාර වලින් රුපියල් මිලියන 211.5 ක් වටිනා ගෘහභාණ්ඩ සලකා බලන වර්ෂය තුලදී නිෂ්පාදනය කර ඇත.ඒ අතර රුපියල් මිලියන 194.6 ක් වටිනාකමින් යුත් ගෘහභාණ්ඩ රාජ්‍ය දැව සංස්ථාවේ රත්මලාන, බණ්ඩාරවෙල, රත්නපුර, තලල්ල, බුස්ස හා අම්පාර ගෘහභාණ්ඩ ප්‍රදර්ශනාගාර වලින් අලෙවි කර ඇත.

# අපගේ ආවරණ කලාප

ප්‍රාදේශිය කාර්යාල 12ක්, දිවයින පුරා ක්‍රියාත්මක වන දැව අලෙවි ගබඩා 54ක්, කල්දෙමුල්ල, අම්පාර සහ බූස්ස යන ස්ථානයන් හි ගෘහභාණ්ඩ නිෂ්පාදනාගාර 3ක්, මහනුවර, රත්නපුර, තලල්ල, අම්පාර, කල්දෙමුල්ල සහ බූස්ස, යන ස්ථානයන්හි ගෘහභාණ්ඩ ප්‍රදර්ශනාගාර 6 ක්ද කැප්පෙටිපොළ, කල්දෙමුල්ල සහ බූස්ස යන ස්ථානවල දැව පරීක්ෂණාගාර 03ක්, ලී මෝල් 06ක් අම්පාර, මහනුවර, බූස්ස, කල්දෙමුල්ල, රත්මලාන සහ තලල්ල යන ස්ථානවලත්, බණ්ඩාරවෙල ලී මෝල් 04 ක්, රත්නපුර ලී මෝල් 02ක්, කැප්පෙටිපොළ ලී මෝල් 04ක් සහ කුරුණෑගල ලී මෝල් 02 ක් ද ආදි වශයෙනුත් පවත්වා ගනිමින් රටේ සෑම කොටසක්ම ආවරණය වන පරිදි, රටේ සමස්ථ ජනකොට්ඨාශ වෙත සේවා සැපයිය හැකි පරිදි අපගේ මෙහෙයුම් ව්‍යුහය ඉතාමත් හොඳින් සැලසුම් කර ඇත.



## අම්පාර ප්‍රාදේශිකය




මඩකලපුව අලෙවි ගබඩාව
පදියතලාව අලෙවි ගබඩාව
අම්පාර ප්‍රාදේශීය කාර්යාලය
අම්පාර අලෙවි ගබඩාව
අම්පාර ලි මෝල
අම්පාර ප්‍රදර්ශනාගාරය



## අනුරාධපුර ප්‍රාදේශිකය




වවුනියාව අලෙවි ගබඩාව
මැදවච්චිය අලෙවි ගබඩාව
අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලය
අනුරාධපුර අලෙවි ගබඩාව
තලාව අලෙවි ගබඩාව



## බණ්ඩාරවෙල ප්‍රාදේශිකය




බොරලන්ද අලෙවි ගබඩාව
බණ්ඩාරවෙල ප්‍රාදේශීය කාර්යාලය
බණ්ඩාරවෙල ලි මෝල



## කොළඹ ප්‍රාදේශිකය




- නයිනමඩම අලෙවි ගබඩාව
- මීරිගම අලෙවි ගබඩාව
- කඩවත අලෙවි ගබඩාව
- ඔරුගොඩවත්ත අලෙවි ගබඩාව
- කොළඹ ප්‍රාදේශිය කාර්යාලය
- පන්නිපිටිය අලෙවි ගබඩාව
- පිළියන්දල අලෙවි ගබඩාව
- කල්දෙමුල්ල නව අලෙවි ගබඩාව
- කල්දෙමුල්ල අලෙවි ගබඩාව
- කල්දෙමුල්ල ලී මෝල
- රත්මලාන අලෙවි ගබඩාව
- රත්මලාන ප්‍රදර්ශනාගාරය
- රත්මලාන ලී මෝල
- එගොඩඋයන අලෙවි ගබඩාව
- මොරටුමුල්ල අලෙවි ගබඩාව
- විල්ලෝරාවත්ත අලෙවි ගබඩාව



## යාපනය ප්‍රාදේශිකය




- යාපනය ප්‍රාදේශිය කාර්යාලය
- යාපනය අලෙවි ගබඩාව
- නල්ලූර් අලෙවි ගබඩාව
- කිලිනොච්චි අලෙවි ගබඩාව




## මහනුවර ප්‍රාදේශිකය



- දඹුලුඔය අලෙවි ගබඩාව
- මාතලේ අලෙවි ගබඩාව
- පල්ලෙකැලේ අලෙවි ගබඩාව
- මහනුවර ප්‍රාදේශිය කාර්යාලය
- මහනුවර ප්‍රදර්ශනාගාරය
- නෙළුන්දෙනිය අලෙවි ගබඩාව
- ඇත්ගාල අලෙවි ගබඩාව
- ඇත්ගාල ලී මෝල




## කුරුණෑගල ප්‍රාදේශිකය





## මොණරාගල ප්‍රාදේශිකය




## මාතර ප්‍රාදේශිකය




## නුවරඑළිය ප්‍රාදේශිකය




## පොළොන්නරුව ප්‍රාදේශිකය




## රත්නපුර ප්‍රාදේශිකය



## 2012-2013 වර්ෂවල නිෂ්පාදනය, අලෙවිය හා ආදායම

| | | නිෂ්පාදන ප්‍රමාණය | | අලෙවි ප්‍රමාණය | | පිරිවැටුම | |
|---|---|---|---|---|---|---|---|
| | | 2013 | 2012 | 2013 | 2012 | 2013 රු. මිලියන | 2012 රු. මිලියන |
| කඳන් | ඝ.මී | 106,122 | 132,859 | 96,560 | 118,679 | 1,770.8 | 1,867.4 |
| ඉරූ දැව | ඝ.මී | 4,117 | 4,955 | 2,487 | 3,323 | 166.9 | 201.4 |
| සිල්පර | ඒකක | 73,526 | 117,306 | 64,938 | 111,019 | 443.8 | 729.0 |
| විදුලි කණු | ඒකක | 31,887 | 30,469 | 29,413 | 37,094 | 208.6 | 255.5 |
| වැට කණු | ඒකක | 131,774 | 203,511 | 145,051 | 192,224 | 87.7 | 62.9 |
| දර | ඝ.මී | 85,156 | 104,316 | 86,922 | 110,412 | 8.9 | 8.5 |
| කම්බි කණු | ඒකක | 88,685 | 79,608 | 83,927 | 86,728 | 2.7 | 5.0 |

## ඉලක්ක හා සපුරාගැනීම් පිළිබඳ සමාලෝචනය සහ අධීක්ෂණය

සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් හා සියලුම ප්‍රාදේශිය කළමනාකරුවන් හා සංස්ථාවේ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්ගේ සහභාගිත්වයෙන් මාසිකව කළමනාකරණ රැස්වීම් පවත්වනු ලබන අතර, එහිදි සත්‍ය කාර්යසාධනය, නිෂ්පාදනය සහ අලෙවි ඉලක්ක සමඟ සසඳා බලනු ලැබේ. මෙම රැස්වීම් වලදි සියලුම බාධක හා ගැටළු අදාල ප්‍රාදේශිය කළමනාකරුවන් සමඟ සාකච්ජා කර හඳුනාගනු ලබන අතර, ඒ සම්බන්ධ විවිධ තිරණ හා විකල්ප ක්‍රියාමාර්ග යෝජනා කර පසුව එම යෝජනා ඇගයීමට ලක්කර ක්‍රියාත්මක කරනු ලැබේ. තවද සංස්ථාවේ අරමුණු හා ඉලක්ක ළඟාකර ගැනීමේ අභිලාෂයෙන් හා අපේක්ෂිත මුදල් ප්‍රවාහය ලඟාකරගෙන මූල්‍යමය අතින් ශක්තිමත් ආයතනයක් බවට තහවුරු කිරීමේ අරමුණින් නව අවස්ථාවන්, නව අදහස් හා කළයුතු වෙනස්කම් සම්බන්ධයෙන් ද සාකච්ජා කරනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කළේ.



එස්.අමරසිංහ
සභාපති
රාජ්‍ය දැව සංස්ථාව.

# රාජ්‍ය දැව සංස්ථාවේ විගණන හා කළමනාකරණ කමිටුවේ වාර්තාව 2013

## රාජ්‍ය දැව සංස්ථාවේ විගණන හා කළමනාකරණ කමිටුවේ සාමාජිකයන්

ඒ.කේ.ඒ.වයි. තරංග මහතා - කමිටු සභාපති

කේ. පි. ආරියදාස මහතා - කමිටු සාමාජික

මහාචාර්ය හිරාන් අමරසේකර මහතා - කමිටු සාමාජික

2013 වර්ෂයට අදාලව පහත සඳහන් කරුණු අදාල රැස්වීම්වලදී සාකච්ජා කර ඇති අතර, එහිදී ගන්නා ලද තීරණ අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය සඳහා නිර්දේශ සහිතව ඉදිරිපත් කරන ලදී.

1. මාසික මූල්‍ය හා භෞතික කාර්යසාධනය
2. වාර්ෂික ගිණුම්
3. වාර්ෂික අයවැය හා සංශෝධිත අයවැය
4. අභ්‍යන්තර විගණන හා විගණකාධිපතිගේ විගණන විමසුම් හා පිළිතුරු
5. පිරිස් හා පාලන කාර්යයන්
6. නීති කටයුතු
7. සේවක ණය, අත්තිකාරම් සහ ටෙන්ඩර් පිරිනැමීම

ඒ.කේ.ඒ.වයි. තරංග මහතා

සභාපති - විගණන හා කළමනාකරණ කමිටුව.





# ව්‍යාපාරික සාරාංශය


# මූල්‍ය හා නිෂ්පාදන කාර්යසාධනය

පසුගිය වාර්තා අනුව වසර හතක සංස්ථාවේ මූල්‍ය ස්ථාවරත්වය පවත්වාගෙන යාම පිළිබඳව හා මුදල් තත්ත්වය ඉහළ නැංවීම දැක්වෙන සංක්ෂිප්තය.


වසර හතක් තුළ මූල්‍ය කාර්යසාධනයේ සංක්ෂිප්තය, මුදල් ප්‍රවාහය, මූල්‍යමය වත්කම් හා වගකීම්, ප්‍රාග්ධන වියදම් සහ ලාභ ආදියෙන් සමන්විත වේ. සංස්ථාව ලබා ඇති ලාභ හා වියදම් පෙන්නුම් කරන දර්ශකයන් මගින් ආයෝජන සැලසුම් හා ක්‍රියාකාරී සැලසුම් මනා මුදල් පාලනයක් ඇතිව ක්‍රියාත්මක කර ඇති බවට සාක්ෂි දරනු ඇත. පසුගිය වසර තුළ මුදල්මය වශයෙන් ලබා ඇති දියුණුව තුළින් සංස්ථාවේ මූල්‍ය ස්ථාවරත්වය හා තිරසාරත්වය පිළිබඳව ඉදිරි කාලය සඳහා පියවර ගෙන ඇති බව තහවුරු වේ. තවද මුදල් අංශයේ සහ මෙහෙයුම් අංශයේ සියලු අරමුණු සාක්ෂාත් කරගැනීම තුළින් ආයතනික සැලැසුම් අනුව කටයුතු කර ඇත.

## ආදායම් වර්ධන ප්‍රවණතා විශ්ලේෂණය

එකතු කල අගය මත බදු සහිත (රු. ‘000)





එකතු කල අගය මත බදු රහිත (රු. ‘000)





## ලාභ වර්ධන ප්‍රවණතා විශ්ලේෂණය


දළ ලාභය (රු. ‘000)




ආදායම් හා භාණ්ඩාගාර බදු ගෙවීමට පෙර ශුද්ධ ලාභය (රු. ‘000)




## මෙහෙයුම් ලාභය (රු. 000)





| වර්ෂය | ලාභය | ආදායමෙන් % |
|---|---|---|
| 2007 | 276,326 | 12% |
| 2008 | 441,067 | 16% |
| 2009 | 565,737 | 18% |
| 2010 | 615,230 | 19% |
| 2011 | 444,077 | 16% |
| 2012 | 583,994 | 18% |
| 2013 | 123,940 | 4% |

## නිෂ්පාදනය වර්ධනය වීමේ ප්‍රවණතා විශ්ලේෂණය


කඳන් නිෂ්පාදනය (ඝ.මී)





ඉරූ දැව නිෂ්පාදනය (ඝ.මී)





සිල්පර නිෂ්පාදනය (ඒකක)





විදුලි සම්ප්‍රේෂණ කණු නිෂ්පාදනය (ඒකක)




ගෘහභාණ්ඩ නිෂ්පාදනය (රු. මිලියන)




අලි වැට කණු නිෂ්පාදනය (ඒකක)




## අගය එකතු කිරීම්



## ප්‍රාග්ධන ආයෝජන 2013

| විස්තරය | රු. |
|---|---|
| කල්දෙමුල්ල සංකීර්ණය නව ගොඩනැගිල්ල | 67,589,386 |
| කඳන් ඔසවනය - කුරුණෑගල | 21,098,575 |
| කඳන් ඔසවනය - මොණරාගල | 21,098,575 |
| ඉරුම් හල හා පදම් කිරීමේ නව ගොඩනැගිල්ල - බුස්ස සංකීර්ණය | 18,287,693 |
| "ඩෝසන්" කඳන් ඔසවනය - අනුරාධපුරය | 16,490,000 |
| කතරගම නව සංචාරක බංගලාව - මොණරාගල | 14,564,948 |
| "වුඩ් මැක්" නව දැව ඉරුම් යන්ත්‍රය - නුවර | 6,913,958 |
| පටි කියත් ඉරුම් යන්ත්‍රය - රත්නපුර | 6,913,958 |
| ෆින්ගර් ජොයින්ට් යන්ත්‍රය - බුස්ස ගෘහභාණ්ඩ නිෂ්පාදනාගාරය | 5,527,634 |
| පටි කියත් යන්ත්‍රය - බුස්ස | 5,312,500 |
| දැව ඇහුරුම් කිරීමේ ගොඩනැගිල්ල, ඇත්ගාල - නුවර | 5,166,012 |
| දැව ඇහුරුම් කිරීමේ ගොඩනැගිල්ල, ඔරුගොඩවත්ත - කොළඹ | 5,117,751 |
| සම්මන්ත්‍රණ ශාලාව නවීකරණය - ප්‍රධාන කාර්යාලය | 4,855,936 |
| අම්පාර නව ගොඩනැගිල්ල | 4,451,018 |

## ආයෝජන

| ආයෝජන | 31-12-2012<br>රු. | 31-12-2013<br>රු. |
|---|---|---|
| රාජ්‍ය ආයතනවල තාවකාලික අතිරික්ත අරමුදල් ගිණුම | 298,546,189 | 338,010,495 |
| මහජන බැංකුව | 724,072,649 | 811,508,552 |
| ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ මණ්ඩලය | 500,000 | 500,000 |
| ලංකා බැංකුව | 258,133,134 | 509,082,847 |
| රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | 73,924,940 | 81,474,846 |
| සී/ස ලංකා ටිම්බර් ප්ලාන්ටේෂන් සමාගම | 30,000,000 | 30,000,000 |
| එකතුව | 1,385,176,912 | 1,770,576,740 |

# දශකයක තොරතුරු


(නිරපේක්ෂ සංඛ්‍යා)

| | | 2004 | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| මුළු වාර්ෂික ආදායම | රු.'000 | 1,274,323 | 1,529,079 | 2,106,155 | 2,531,611 | 2,986,925 | 3,445,141 | 3,616,164 | 3,103,744 | 3,563,390 | 3,213,547 |
| වාර්ෂික දළ ලාභය | රු.'000 | 574,859 | 899,729 | 966,095 | 1,050,896 | 1,210,845 | 1,351,695 | 1,365,285 | 1,237,640 | 1,546,107 | 1,197,518 |
| පොළී සහ ආදායම් බදුවලට පෙර ශුද්ධ ලාභය | රු.'000 | 124,836 | 457,750 | 480,641 | 488,535 | 647,039 | 810,612 | 877,623 | 603,499 | 801,681 | 382,337 |
| මුළු සේවක පිරිවැය | රු.'000 | 488,212 | 596,684 | 774,751 | 841,831 | 852,879 | 898,652 | 901,910 | 953,498 | 1,065,052 | 1,117,036 |
| වාර්ෂික ප්‍රාග්ධන වියදම් | රු.'000 | 5,013 | 2,051 | 13,523 | 95,745 | 141,327 | 112,909 | 237,332 | 180,546 | 162,509 | 332,870 |
| වර්ෂාවසාන ජංගම නොවන වත්කම් | රු.'000 | 953,611 | 1,372,833 | 1,579,613 | 1,338,570 | 1,523,553 | 1,793,467 | 1,801,988 | 1,739,893 | 1,479,880 | 1,658,535 |
| වර්ෂාවසාන ජංගම වත්කම් | රු.'000 | 911,048 | 852,622 | 962,569 | 1,545,428 | 1,407,022 | 2,079,543 | 2,341,020 | 2,177,892 | 2,929,185 | 3,153,777 |
| වර්ෂාවසාන ජංගම වගකීම් | රු.'000 | 162,762 | 285,475 | 528,005 | 690,558 | 455,460 | 1,028,979 | 1,034,258 | 497,229 | 804,102 | 1,050,258 |
| වර්ෂාවසාන ජංගම නොවන වගකීම් | රු.'000 | 271,066 | 285,339 | 341,581 | 370,816 | 362,399 | 364,553 | 399,057 | 399,953 | 409,030 | 384,831 |
| වර්ෂාවසාන ස්කන්ධය | රු.'000 | 1,430,831 | 1,654,641 | 1,672,595 | 1,822,624 | 2,112,716 | 2,479,478 | 2,709,694 | 3,020,602 | 3,195,933 | 3,377,223 |
| ඒකාබද්ධ අරමුදලට දායකත්වය | රු.'000 | 37,000 | 50,000 | 75,000 | 150,000 | 75,000 | 50,000 | 413,490 | 75,000 | 600,000 | 50,000 |
| වර්ෂාවසාන සේවක සංඛ්‍යාව | සංඛ්‍යාව | 2,995 | 2,846 | 2,751 | 2,634 | 2,499 | 2,457 | 2,346 | 2,267 | 2,187 | 2,139 |
| වර්ෂාවසාන අතිරික්ත අරමුදල් ආයෝජන ශේෂය | රු.'000 | - | 1,047,004 | 1,267,102 | 834,037 | 777,101 | 858,717 | 605,235 | 764,328 | 298,546 | 338,010 |


## ප්‍රධාන ක්‍රියාකාරී දර්ශක

| | | 2004 | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ස්කන්ධයට ආදායම් බදු වලට පෙර ශුද්ධ ලාභය | % | 8.72 | 27.66 | 28.74 | 26.80 | 30.63 | 32.69 | 32.39 | 19.98 | 25.08 | 11.32 |
| මුළු වත්කම් වලට පොළී හා බදුවලට පෙර ශුද්ධ ලාභය | % | 6.69 | 20.57 | 18.91 | 16.94 | 22.08 | 20.93 | 21.18 | 15.40 | 18.18 | 7.94 |
| ජංගම අනුපාතය | වාර ගණන | 5.60 | 2.99 | 1.82 | 2.24 | 3.09 | 2.02 | 2.26 | 4.38 | 3.64 | 3.00 |
| එක් සේවකයෙකුට සේවක පිරිවැය | රු. .000 | 163 | 210 | 282 | 320 | 341 | 366 | 384 | 421 | 487 | 522 |
| ස්කන්ධයට වත්කම් අනුපාතය | වාර ගණන | 1.30 | 1.34 | 1.52 | 1.58 | 1.39 | 1.56 | 1.53 | 1.30 | 1.38 | 1.42 |
| වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය | % | 6.69 | 20.57 | 18.91 | 16.94 | 22.08 | 20.93 | 21.18 | 15.40 | 18.18 | 7.94 |
| මුළු පිරිවැටුම් වර්ධනය | % | (10.16) | 19.99 | 37.74 | 20.20 | 17.99 | 15.34 | 4.96 | (14.17) | 14.81 | (9.82) |


මුළු වාර්ෂික ආදායම (රු.'000)





පොලී සහ ආදායම් බදුවලට පෙර ශුද්ධ ලාභය (රු.'000)




වර්ෂාවසාන අතිරික්ත අරමුදල් ආයෝජන ශේෂය (රු.'000)




ජංගම අනුපාතය (වාර ගණන)




වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය %




ස්කන්ධයට වත්කම් අනුපාතය (වාර ගණන)




# තිරසාර අනාගතයක් වෙනුවෙන් . . . . . . . . . .

*"සේවකයින් සමාජය හා පරිසරය සමග එකමුතුවී ඇතිකරගන්නා බැඳීම තිරසාර සංවර්ධනයකට මග පාදයි."*

තිරසාර ව්‍යාපාර සංකල්පය යනු කිසියම් ආයතනයක් ලාභ උපයමින් පරිසර හිතකාමී ලෙස එහි නිෂ්පාදිත සහ නිෂ්පාදන ක්‍රියාවලිය සහ අනෙකුත් ක්‍රියාවලි වර්තමාන පාරිසරික අවශ්‍යතා වලට අනුව පවත්වාගෙන යැමයි. තවදුරටත් මෙය පරිසරයේ පවත්නා සම්පත් තුළින් උපරිම ඵල නෙලාගනිමින් භාණ්ඩ නිර්මාණය කිරීමක් ලෙස හැඳින්විය හැක.

වැඩිමනක් ලෙස විග්‍රහ කිරීමේදී ව්‍යාපාර ආයතනයක් ආචාරධර්ම ආරක්ෂාකරමින් ආර්ථික වර්ධනය කරා අඛණ්ඩ කැපවීමේන්, සේවකයන්ගේ සහ ඔවුන්ගේ කුටුම්බවල ජීවන තත්වය උසස් කරමින් අභ්‍යන්තර මෙන්ම බාහිර සමාජයේ උන්නතිය වෙනුවෙන් දායකවීම තිරසාර සංවර්ධනය වේ. එනම්, භාණ්ඩ හා සේවා, සේවකයින්, සමාජය සහ පරිසරය යන සාධක අතර ඇති අන්තර් සම්බන්ධතාවය ද පිළිබිඹු කරයි. රාජ්‍ය දැව සංස්ථාව වගකීම් සහිත සංස්ථාපිත පුරවැසියෙකු ලෙස මිනිසුන්ගේත්, සමාජයේ සහ පරිසරයේ අභිවෘද්ධිය වෙනුවෙන් සමාජ සංවර්ධනයට බලපෑ හැකි අයහපත් ක්‍රියාවලින්ගෙන් තොර ගමනක යෙදීම මූලික අරමුණු කොට ගෙන ඇත.

රාජ්‍ය දැව සංස්ථාවේ අභිමතාර්ථය වන්නේ ව්‍යාපාර පරිසරය තුළ සමාජය සමග හිතකර සම්බන්ධතාවයක් පවත්වාගැනීම සහ මෙහෙයුම් ක්‍රියාවලිය තුළින් පරිසරයට සහ සමාජයට වන අයහපත් බලපෑම වගකීමෙන් යුතුව කළමනාකරණය කිරීමයි. රාජ්‍ය දැව සංස්ථාවේ ක්‍රියාකාරකම් වලින් පෙන්නුම් කරනුයේ මෙහෙයුම් අතර සමාජීය, ආර්ථික සහ පාරිසරික සාධකයන් අතර ඇති බැඳියාව පිළිබඳ නිදර්ශනයන් ය. යථෝක්ත වර්ෂය තුළ රාජ්‍ය දැව සංස්ථාව විසින් ක්‍රියාවට නංවන ලද තිරසාර සංවර්ධන වැඩසටහන් පිළිබඳ සටහනක් පහතින් වේ.



**භාණ්ඩ හා සේවා**

- ද්‍රව්‍ය ලබාගැනීමේ සිට නිමි ද්‍රව්‍ය උපයෝජනය කොට බැහැර කිරීම දක්වා තිරසාර සැපයුම් දාමයක් භාවිතා කිරීම.
- ඉහළ ගුණත්වයේ භාණ්ඩ හා සේවා සැපයීම.
- ආයෝජන යෙදවීම සහ ඵලදායී ප්‍රතිලාභ ලබාගැනීම සඳහා සැලසුම් ක්‍රියාත්මක කිරීම.
- නව නිපැයුම් සහ ක්‍රමවේද හඳුන්වා දීම.
- පාරිභෝගිකයින් සහ සැපයුම්කරුවන් අතර ගනුදෙනු අවංක භාවයකින් සිදුකිරීම.

**සේවකයන්**

- ආරක්ෂක ක්‍රමෝපායන් සහ ප්‍රතිපත්ති වැඩිදියුණු කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- අඛණ්ඩතාවය හා විවිධත්වය උදෙසා කැපවීම අභිප්‍රේරණය කිරීම
- සේවක පුහුණු හා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- සේවක තෘප්තිය ඉහල නැංවීම
- සේවකයින් හා ඔවුන්ගේ යැපෙන්නන්ගේ සුරක්ෂිත බව තහවුරු කිරීම.

**පරිසරය**

- සදාචාරාත්මක පැවැත්මක් සඳහා පිළිවෙත් සහ ප්‍රතිපත්ති සංස්ථාපනය කිරීම.
- පරිසර කළමනාකරණය සහ සම්පත් සංරක්ෂණය සඳහා පෙලඹවීම.
- පරිසරයට වන අහිතකර බලපෑම් අවම කිරීම.
- ස්වභාවික සම්පත් උපරිම ලෙස උපයෝජනය සහ අනාගත පරපුර උදෙසා සංරක්ෂණය.
- කැලිකසළ බැහැර කිරීම කළමනාකරණය.

**සමාජය**

- පෞරාණික ගෘහභාණ්ඩ සඳහා ජනතා උද්යෝගය දිරිමත් කිරීම.
- දැව සංරක්ෂණය සහ දැව කර්මාන්තය පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීම.

## භාණ්ඩ හා සේවා

*"කුසලතා සහ තාක්ෂණය තුලින් අනර්ඝ තත්වයේ භාණ්ඩ හා සේවා සමාජයට දායාද කිරීම සඳහා අපි කැපවී සිටින්නෙමු"*

තිරසාර නිෂ්පාදිතයක් යනු කිසියම් නිෂ්පාදනයක සම්පූර්ණ ජීව කාලය තුලදී එහි ක්‍රියාකාරිත්වය පරිසර හිතකාමී වීමයි. එනම්, අමුද්‍රව්‍ය ලබාගැනීමේ සිට නිමි ද්‍රව්‍ය උපයෝජනය කොට ඉවත් කිරීම දක්වා කිසිදු ආකාරයක ස්විර හානියක් පරිසරයට සිදු නොවිය යුතුය. අනර්ඝ තත්වයේ භාණ්ඩ හා සේවා සමාජයට දායාද කිරීම සඳහා අපගේ කුසලතා සහ තාක්ෂණය සම්පූර්ණයෙන්ම යොදවා ඇත්තෙමු. රාජ්‍ය දැව සංස්ථාව විශ්වාස කරන ආකාරයට තිරසාර සංවර්ධනය යනු වර්තමාන අවශ්‍යතා සපුරාගනිමින් අනාගත පරපුරටත් ඔවුන්ගේ අවශ්‍යතා ඉටුකරගැනීමට අවශ්‍ය සම්පත් ආරක්ෂා කරමින් පරිභෝජනය කිරීම වේ.

### 1.1 සාම්ප්‍රදායික ගෘහභාණ්ඩ අංශය

වර්තමානයේ මිහිදන් වෙමින් පවතින ශ්‍රී ලාංකීය දැව කැටයම් කලාවත්, පාරම්පරික ගෘහභාණ්ඩත් යලි වෙළඳපොලට හඳුන්වා දෙමින් රාජ්‍ය දැව සංස්ථාව පාරම්පරික ගෘහභාණ්ඩ කලාවේ පෙර ගමන්කරු වී ඇත. පෞරාණික ගෘහභාණ්ඩ එහි මූලික පෙනුම සහ ගුණාත්වය එලෙසින් ම රැකෙන පරිදි ප්‍රතිනිර්මාණය කරන්නෙමු. පාරම්පරික දැව භාණ්ඩවල රමණීයත්වය සහ නිර්මාණශීලිත්වය පිළිබඳ පොදු ජනතාව අතර ඇල්මක් ඇතිකිරීම සහ සංරක්ෂණය පිළිබඳ දැනුවත් කිරීම මෙහි මූලික අරමුණවේ.

### 1.2 දැව වලින් උපරිම ප්‍රයෝජනයක් ලබාගැනීම

දැව අපතය යනු සම්පත් උපරිම අයුරින් උපයෝජනය නොවීමයි. දැව අපතය පාරිසරික වශයෙන් ගත්කල විශාල හානියකි. එනම්, හිඟ ස්වභාවික සම්පත් එහි උපරිම උපයෝජනය සඳහා යොදා නොගැනීමයි. එම නිසා දැව භාවිතයේ දී උපරිම ලෙස උපයෝජනයට අවශ්‍ය නවීන තාක්ෂණය, නවීන ක්‍රමෝපායන් සහ නවීන උපකරණ භාවිතය තුළින් සම්පත් උපරිම ලෙස පරිභෝජනය පිළිබඳ අපගේ විශේෂ අවධානයක් යොමු වී ඇත.

## 1.3 මෘදු දැව සඳහා දිගුකාලීන පැවැත්මක්

තාක්ෂණය උසස්ම ආකාරයෙන් යොදා දැව පරිරක්ෂණය කොට මෘදු දැව සවිශක්තියෙන් සහ කල්පැවැත්මෙන් යුතු දැව බවට පත් කරමින් මිල අධික මෙන්ම වටිනාකමින් වැඩි දැව භාවිතයට පිළියමක් ලෙස වෙළඳපොළට ඉදිරිපත් කරන අතර, එමගින් දැව භාවිතය ඉහළයාමක් අපේක්ෂා කෙරේ.

## 1.4 දැව හඳුනාගැනීමේ හා සහතිකකිරීමේ සේවය

රාජ්‍ය දැව සංස්ථාවේ පර්යේෂණ අංශය වෙත දැව වල ගුණත්වය හා දැව දේපළ මත සහතික නිකුත් කිරීමේ අධිකාරි බලය 2008 පෙබරවාරි 25 වැනි දින අංක:1538/7 දරන විශේෂ ගැසට් පත්‍රය මගින් පවරන ලදි. නියත බර, තෙතමනය, අන්තර්ගතය, හැකිළීම හා බෝරෝන් ප්‍රතිකාරය සඳහා දැව වල තත්වය පරීක්ෂා කිරීමට එම අංශයේ පහසුකම් ඇත.

## 1.5 දැව තාක්ෂණ පුහුණු ආයතනය මගින් සපයන සේවා හා එහි මෙහෙයුම්

ජාතියේ ගුණාත්මක හා වඩා විශ්වාසනීයම දැව හා දැව ආශ්‍රිත නිෂ්පාදන සපයන ප්‍රමුඛයා ලෙස කැපවුණු පුරෝගාමී වෘත්තිය ආයතනය වශයෙන් රාජ්‍ය දැව සංස්ථාව ඉතා වැදගත් සන්ධිස්ථානයකට එමින් 2006 දී රත්මලාන කල්දෙමුල්ල දැව තාක්ෂණ පුහුණු ආයතනය පිහිටුවීමට පියවර ගන්නා ලදි. වන හා දැව තාක්ෂණය භාවිතා කරන්නන්ගේ කාර්යයන් ශක්තිමත් කිරීම තුළින් ඔවුන්ගේ ධාරිතාවය ඉහළ නැංවීමටත් දැනුම යාවත්කාලීන කර ශ්‍රී ලංකාවේ ජාතික සංවර්ධන අරමුණ ඉටුකර ගැනීමටත් දැව තාක්ෂණ පුහුණු ආයතනය පිහිටුවා ඇත.

## සේවකයින්

*“සංස්ථාව කෙරෙහි මනා බැඳීමකින් යුතු සේවක පිරිස සංස්ථාවේ අභිවෘද්ධියටත් සංවර්ධනයටත් බලපාන තීරණාත්මක සාධකයකි.”*

මානව සම්පත යනු සංවිධානයක් සතුව පවතින මිනිසුන් හා ඵලදායී නිෂ්පාදන කටයුතුවලට යොමුකළ හැකි ඔවුන් සතුව ඇති ශක්තින්, දැනුම, කුසලතාවන් හා අත්දැකීම් වේ. මානව සම්පත යනු ආයතනයට අඛණ්ඩ ප්‍රතිලාභ ලබාදෙන ආයතනය සතු වටිනාම සම්පතයි. රාජ්‍ය දැව සංස්ථාව නිෂ්පාදන අංශයේ ප්‍රමුඛ ආයතනයක් වශයෙන් නිෂ්පාදන ඵලදායීතාවය, කාර්යක්ෂමතාව, පාරිභෝගිකයන් අභිමුඛ බව සහ කුසලතා වැඩිදියුණු කරගැනීම සංස්ථාවට තරඟකාරී වාසි ලබාගැනීමට මහත් පිටුවහලකි. තිරසාර සංවර්ධන වැඩසටහන් මගින් සේවකයන් ප්‍රශස්ත මට්ටමකට පමුණුවන අතර, නියත වූ ඔපමට්ටමක් සේවකයින්ට මෙන්ම සංස්ථාවට ද ලබාදේ. සේවක සම්බන්ධතාවය මෙන්ම සේවකයින් ආයතනය පිළිබඳ ඇති ඇල්ම ඉහළයෑමෙන් ආයතනයත් සේවකයිනුත් යන දෙපාර්ශවයටම ඉහළ ප්‍රතිලාභ ලඟා කරගත හැක.

මනා ශක්තිමත් සේවක සම්බන්ධතාවය මෙන්ම සේවකයින් ආයතනය පිළිබඳ ඇති ඇල්ම ඉහළනංවා ගැනීම සඳහා පහත දැක්වෙන උපායමාර්ග සංස්ථාව අනුගමනය කරනු ලබයි.

- ශක්තිමත් තිරසාර දැක්මක් සහ උපායමාර්ග - තිරසාර සංවර්ධනයක වැදගත්කමත් සංස්ථාවේ අනාගත ගමන් මග පිළිබඳ ස්ථිර සහ පැහැදිලි අර්ථකථනයක් ආයතනයේ සේවකයින් වෙත ලබාදීම.
- තිරසාරකත්වය පිළිබඳ දැනුවත්කම සහ අවබෝධය වැඩිදියුණු කිරීම.
- ආයතනික වශයෙන් සහ ගෘහස්ථ වශයෙන් සේවක කැපවීම හැසිරවීම.
- ජයග්‍රහණ - හිතකර තරඟකාරීත්වය, ප්‍රතිලාභ සහ පිළිගැනීම.

| | 2009 | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|---|
| මුළු සේවක පිරිවැය (රු.මි) | 898.65 | 901.91 | 953.5 | 1065 | 1117 |
| සේවක සංඛ්‍යාව | 2457 | 2346 | 2267 | 2187 | 2139 |

### වයස් කාණ්ඩ අනුව විශ්ලේෂණය

| වයස් කාණ්ඩය | සේවක සංඛ්‍යාව |
|---|---|
| 18-25 | 27 |
| 26-35 | 313 |
| 34-40 | 431 |
| 41-45 | 324 |
| 46-50 | 291 |
| 51-55 | 436 |
| 55ට වැඩි | 317 |

### සේවා කාණ්ඩ අනුව සේවක විශ්ලේෂණය

| සේවා කාණ්ඩය | සේවක සංඛ්‍යාව |
|---|---|
| ජ්‍යෙෂ්ඨ කළමණාකාර | 9 |
| මධ්‍ය කළමණාකාර | 64 |
| කනිෂ්ඨ කළමණාකාර | 145 |
| කළමණාකාර සහකාර- ශිල්පීය නොවන | 657 |
| කළමණාකාර සහකාර- ශිල්පීය | 35 |
| ප්‍රාථමික කාණ්ඩය | 1245 |
| අනියම් සහ පුහුණු | 32 |

## ස්ත්‍රී පුරුෂ භාවය අනුව සේවක විශ්ලේෂණය

| ස්ත්‍රී පුරුෂභාවය | සේවක සංඛ්‍යාව |
|---|---|
| පුරුෂ | 1658 |
| ස්ත්‍රී | 481 |

## 2.1 සේවක සුරක්ෂිතතාව පිළිබඳ පිළිවෙත් සහ ක්‍රියාමාර්ග

1942, අංක:45 දරන කර්මාන්තශාලා අඥාපනත සහ 1934, අංක:19 දරන සේවක වන්දි අඥාපනතට අනුව රාජ්‍ය දැව සංස්ථාව විසින් පහත දැක්වෙන ආරක්ෂක උපකරණ පහසුකම් තම සේවකයන්ට සපයනු ලබයි.

උපකරණ :- හිස්වැසුම්, සපත්තු, අත්වැසුම්, ශ්‍රවණ ආවරණ හා මුඛවාඩම් වැනි ආරක්ෂක උපකරණ

මීට අමතරව ලබන වසරේ සිට සංස්ථාව විසින් ආරක්ෂිත නිල ඇඳුමක් සේවකයින් සඳහා සැපයීමට කටයුතු යොදා ඇත.

## 2.2 සේවක පුහුණු වැඩසටහන්

පුහුණු හා සංවර්ධන අවස්ථාවල වැදගත්කම හඳුනාගැනීම නිසා සංස්ථාව වාර්ෂික අයවැයෙන් පුහුණු හා සංවර්ධන වැඩසටහන් සඳහා සැලකියයුතු මුදල් ප්‍රතිපාදන වෙන්කරනු ලබයි. එය පිරිවැයක් ලෙස නොව මානව ප්‍රාග්ධනය මත කරන්නා වූ ආයෝජනයක් ලෙස සංස්ථාව සලකනු ලබයි. එවැනි මානව සම්පත් ප්‍රතිපත්ති තුළින් නිරායාසයෙන්ම සේවක සංවර්ධනයට පෙළඹවීමක් වන අතර, එය කුසලතා රහිත සේවකයින්ට පමණක් නොව කුසලතා සහිත සේවකයින්ට ද සිය හැකියාවන් වැඩිදියුණු කරගැනීමට හැකියාව ලැබේ.

මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්තියට අනුව සංස්ථාව දිගු කාලයක් තිස්සේ එහි සේවකයින්ට විවිධාකාර පුහුණු වැඩසටහන් ලබාදෙමින් සිටියි. 2013 වසරේදි සේවකයින් 277 දෙනෙක් දැව තාක්ෂණ හා පුහුණු ආයතනය මගින් පුහුණු කරන ලදි. මානව සම්පත් ප්‍රතිපත්තිය අනුව රාජ්‍ය දැව සංස්ථාව පුහුණු අවස්ථා සපයනු ලබන්නේ කළමනාකරණ මට්ටමේ සේවකයින්ට පමණක් නොව වඩු කාර්මිකයින්, ඔප දමන්නන් හා බර යන්ත්‍ර ක්‍රියාකරුවන් වැනි අනෙකුත් සේවකයින්ට ද අධ්‍යාපන ආයතන ගණනාවක් තුළින් කුසලතා, ආකල්ප හා දැනුම වැඩිකර ගැනීමටත් එමගින් සංස්ථාවට උපරිම දායකත්වය ලබාදීමටත් අවස්ථාව දී ඇත.

සංස්ථාව විසින් විවිධාංගීකරණය කරන ලද පුහුණු අවස්ථා කල්දෙමුල්ල දැව තාක්ෂණ පුහුණු ආයතනය සහ බාහිර ආයතන හරහා සපයනු ලබයි.

## 2013 දි දැව තාක්ෂණ පුහුණු ආයතනය මෙහෙයවන ලද පුහුණු පාඨමාලා

| පාඨමාලාව | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|
| කළමනාකරණ සහකාර පුහුණු | 62 |
| කියත් සකසු පාඨමාලා | 21 |
| කළමනාකරණ පුහුණුවන්නන් අනුස්ථාපනය | 30 |
| කර්මාන්තශාලා සේවකයන් සදහා තත්වපාලන වැඩමුළුව | 08 |

## බාහිර අධ්‍යාපන ආයතන මගින් පවත්වනු ලැබූ පුහුණු වැඩසටහන්

| පාඨමාලාව | පාඨමාලා සංඛ්‍යාව |
|---|---|
| පරිගණක | 10 |
| බදු/සේ.අ.අ. සහ සේ.භා.අ/මූල්‍ය ප්‍රකාශන | 3 |
| ආරක්ෂක | 1 |
| ද්‍රව බලපද්ධතිය (Hydraulic) පුහුණු පාඨමාලා | 1 |
| Boiler පුහුණු පාඨමාලා | 1 |

## 2.3 මානව සම්පත් භාවිතය පිළිබඳ ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග

මානව සම්පත් ප්‍රතිපත්ති සංග්‍රහය ක්‍රියාත්මක කරනු ලබන්නේ වැඩිදියුණු කරන ලද සේවාවක් කාර්ය මණ්ඩලයට සැපයීමේ පරමාර්ථයෙනි. පහත දැක්වෙන මානව සම්පත් දර්ශක සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශනය සපයයි.

### 2.3.1 සේවක උසස්වීම්

ආකෘතිමය හා සංවිධිත උසස්වීම් සැලසුම් සංස්ථාවේ කුසලතා පිරි සේවකයින් සංවර්ධනය හා රඳවාගැනීමටත් තාක්ෂණික හැකියා, කුසලතා හා කාර්යසාධනයන් ඇගයීමටත් ඉහවල් වේ.

### 2.3.2 සේවක ස්ථාන මාරුවීම්

වාර්ෂික සේවක ස්ථාන මාරුවීම් ක්‍රියාපිළිවෙත (පටිපාටිය) සකස්කර ඇත්තේ වඩාත් ඵලදායි වුත්, ව්‍යාපාර වර්ධනයට හිතකර වුත් ආකාරයට ය. තවද මෙම ප්‍රතිපත්තියෙන් සේවක දුක් ගැනවිලි හඳුනාගැනීම හා ඒවා සංස්ථාවටත් සේවකයාටත් යහපත් වන අයුරින් විසඳීම ද ඉලක්ක වී ඇත.

### 2.3.3 පුද්ගල ණය

පුද්ගල ණය සපයනු ලබන්නේ ආපදා, පාපැදි, ගෘහභාණ්ඩ, විදුලි උපකරණ, පරිගණක/ලැප්ටොප් සහ වාහන මිලදීගැනීමට සහනදායි පොලී අනුපාතයන්ට වන අතර,

ඔවුන්ගේ රෙදිපිළි හා උත්සව අත්තිකාරම් සේවකයින්ට සපයනු ලබන්නේ ඔවුන්ගේ පුද්ගලික අවශ්‍යතා ඉටුකිරීමට පොලී අයකිරීමකින් තොරවය.

### 2.3.4 අතිකාල

අපගේ අතිකාල ක්‍රමවේදය සකසා ඇත්තේ සංස්ථාවේ පිරිවැය කාර්යක්ෂමතාවයට අනුව වන අතර, සේවකයාට ද වඩා වාසිදායකවන අයුරිනි.

### 2.3.5 දුක්ගැනවිලි හැසිරවීම

දුක්ගැනවිලි හැසිරවීමේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනුයේ සේවක දුක්ගැනවිලි සාධාරණ ක්‍රමවේදයකට විසඳීමේ අරමුණෙනි. සේවකයින් දුක්ගැනවිලි විසඳීම සඳහා සංස්ථාව සාමාන්‍යයෙන් විවෘත ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරනු ලබයි. ඒ අනුව සේවකයින්ට නිරන්තරයෙන් මෙම දුක් ගැනවිලි හැසිරවීමේ ක්‍රමවේදයෙන් මහත් පහසුවක් ලැබිය හැක.

### 2.3.6 සෞඛ්‍ය රක්ෂණාවරණය

අපි දිවයිනේ පිළිගත් රක්ෂණ ආයතනයක් හරහා අපගේ සේවකයින් වෙනුවෙන් පරිපූර්ණ සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කරනු ලබන්නෙමු. මෙම සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ සේවකයින් මෙන්ම ඔවුන්ගේ පවුල්වල අය පහත ආකාරයට ආවරණය වේ.

- තනි පුද්ගල සේවකයින් (අවිවාහක) සඳහා යැපෙන්නන් ලෙස දෙමාපියන් ආවරණය වේ.
- විවාහක සේවකයින් සඳහා කලත්‍රයා සහ ළමයින් ආවරණය වේ.

මෙම යෝජනා ක්‍රමය තුළින් නේවාසික ප්‍රතිලාභ, බාහිර ප්‍රතිකාර, අසාධ්‍ය රෝග, සාමාන්‍ය හා හදිසි අනතුරු මරණ සඳහා මුදල් පිරිනැමීම හා පූර්ණ අකර්මන්‍යතා ආදිය ආවරණය වේ. මෙම රක්ෂණ පැකේජය සඳහා සංස්ථාව 2013 වසරේදී රු.45,435,277/-ක් වියදම් කර ඇත. සේවකයා මෙම රක්ෂණාවරණ පැකේජය ලබාගෙන නොමැති නම් සංස්ථාවෙන් ලබාදෙන සෞඛ්‍ය දීමනා පැකේජය ලබාගැනීමේ හැකියාව ඇත.

### 2.3.7 තේ සහ දිවා ආහාර දීමනා

සංස්ථාවේ සෑම සේවකයෙකුටම රු.200/- ක දෛනික තේ සහ දිවා ආහාර දීමනාවක් ලබාදේ.

### 2.3.8 සපත්තු දීමනාව

සංස්ථාවේ සෑම සේවකයෙකුටම රු.2,250/- ක වාර්ෂික පාවහන් දීමනාවක් ලබාදෙයි.

### 2.3.9 ශීත දීමනාව

නුවරඑළිය ප්‍රාදේශිකයේ සේවය කරන සේවකයින්ට විශේෂ දේශගුණික තත්වය හේතුවෙන් ඔවුන්ගේ මූලික වැටුපෙන් 10%ක් ශීත දීමනාවක් ලෙස ගෙවනු ලබයි.

### 2.3.10 බස්ගාස්තු දීමනාව

මාසිකව සේවකයාගේ දෛනික බස් ගාස්තුවෙන් අඩක් ගෙවනු ලබයි.

### 2.3.11 වාර්ෂික දීමනාව

රු.12,500/-ක් වන වාර්ෂික ප්‍රසාද දීමනාවක් සෑම සංස්ථා සේවකයෙකුටම ලබාදේ.

## 2.4 සේවක වැඩසටහන්

සේවකයින්ගේ රැකියා සුරක්ෂිතභාවය පිළිබඳ වගකීම දරන අතර, අප ඔවුන්ව අගයකොට සලකනු ලබයි. කාර්යසාධනය සහ අඛණ්ඩ ක්‍රියාකාරීත්වය තුළින් ඉහළ මට්ටමේ තෘප්තියක් පවත්වා ගැනීම අප අවබෝධ කරගෙන ඇත. එවැනි අරමුණක් මනසේ තබාගෙන අප පහත ආකාරයේ වැඩසටහන් වාර්ෂිකව සංවිධානය කරනු ලැබේ.

- වාර්ෂික ක්‍රීඩා සැණකෙළි/අළුත් අවුරුදු වැඩසටහන්
- ස්වාභාවික ආපදාවන්ට ලක්වුවන්ට සහනදායී වැඩසටහන්
- සේවකයින්ගේ දරුවන් සඳහා ශිෂ්‍යත්ව වැඩසටහන්
- ශිල්ප ව්‍යාපාර හා ධර්ම දේශනා වැඩසටහන්

## 2.5 අනෙකුත් සේවා

- සේවකයන් වෙනුවෙන් නියම ආකාරයෙන් සේවක භාරකාර අරමුදලට සහ සේවක අර්ථසාධක අරමුදලට දායකවීම් බැර කරනු ලැබේ.
- පාරිතෝෂික ගෙවීම් සිදුකිරීම නෛතික අවශ්‍යතාවයක් ලෙස නොව සේවකයන්ගේ සුභ සිද්ධිය වෙනුවෙන් කරන ගෙවීමක් ලෙස සලකා කටයුතු කිරීම.
- කාලීන අවශ්‍යතාවයක් ලෙස සලකා ගර්භනී නිවාඩු, කිරිපැය වැනි අවස්ථා අනුමත කිරීම.
- සුභසාධක යෝජනාක්‍රමය ලෙස ආපන ශාලා පහසුකම් සැලසීම.
- සහනදායී මිල ගණන් වලට සංස්ථාවෙන් නඩත්තු කරන නිවාඩු නිකේතන පහසුකම් ලබාදීම.

## පරිසරය

"අපගේ සියලුම ක්‍රියාවන් තිරසාර ලෙස සහ පරිසර හිතකාමී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු පිළිවෙත් සහ ක්‍රියාමාර්ග ස්ථාපිත කිරීමට අපි ඇපකැපවී සිටින්නෙමු."

භාරදූර වගකීමක් සහිත වූ ආයතනයක් වශයෙන් තිරසාර සංවර්ධනය තුළින් සමාජයට දායකත්වය ලබාදීම රාජ්‍ය දැව සංස්ථාවේ අරමුණයි. සමාජ දායකත්වය ලෙස සලකනු ලබන්නේ කිසියම් වූ පාරිසරික වාසියක් හෝ දියුණුවක් අපගේ භාණ්ඩ භාවිතයෙන් සමාජයට අත්වේද යන්නයි. දෛනික අභියෝග වලට මුහුණදෙමින් හා තරඟකාරීව ක්‍රියාකරමින් සාධනීය ව්‍යාපාරික ආයතනයක් ලෙස සිය වගකීම ආයතනය විසින් මැනවින් ඉටුකර ඇත. රාජ්‍ය දැව සංස්ථාව පරිසර සංරක්ෂණය සම්බන්ධයෙන් ජනතා රුචිය වැඩිකිරීමට කටයුතු කරන අතර, උපරිම දායකත්වයක් ලබාදෙමින් සමාජයේ තිරසාර සංවර්ධනයක් ඇති කිරීමට කටයුතු කරමින් පවතී. ව්‍යාපාර කටයුතු දියුණු කිරීමේදී පරිසර හිතකර සාධක ක්‍රියාත්මක කිරීමට සුදුසු පිළිවෙත් සහ ක්‍රියාමාර්ග ස්ථාපනය කිරීමට අපි ඇපකැපවී සිටින්නෙමු. එලෙසම පරිසරයට සිදුවන හානිය අවම වන ලෙස තිරසාර සංවර්ධනයක් ලඟා කරගැනීම සමාජ වගකීමක් සහිත වූ ආයතනයක් ලෙස අප සතු වගකීම හොඳින් අවබෝධ කරගෙන සිටිමු.

### 3.1 පරිසර සුරැකීමේ වැඩසටහන් සහ රුක්රෝපණ වැඩසටහන්

- ලෝක පරිසර දිනය සංකේතවත් කිරීමට වැඩසටහන් ගණනාවක් පවත්වන ලදි.
- තුරු ජන සිසු බැංකු, රුක් රෝපණ වැඩ සටහන එලදායී ලෙස අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදි. හඳුනාගත් පාසැල් සඳහා ද්‍රව්‍යමය හා මූල්‍යාධාර (බීජ පැළ, උදළු, විල්බැරෝ) ආදිය පිරිනමන ලදි. ඉහත වැඩසටහන් තුළින් වන වගාව සඳහා තරුණ පරම්පරාවේ ඇල්ම ඉහළ නංවන ලදි. මෙමගින් දැව කුලය පිළිබඳව පැහැදිලි අදහසක් දීමට හා එම ශාඛ පරිනතභාවයට ළඟා වූ විට නිවැරදිව උපයෝජනය කරගැනීමට මහෝපකාරී වේ.
- "දැයට සෙවණ" වැඩසටහන මගින් බීජ පැල 88,000ක් ලබාදෙමින් ක්‍රියාකාරී සහභාගිත්වය.





### 3.2 කැලිකසළ බැහැර කිරීම කළමනාකරණය

පරිසරයට වඩාත් ලෙන්ගතු රාජ්‍ය ආයතනයක් ලෙස එදිනෙදා කැලිකසළ පරිසරයට හානිවීම අවම වන අයුරින් කළමනාකරණය කරනු ලබයි. ඒවා කඩදාසි, පොලිතින් සහ කාබනික අපද්‍රව්‍ය ලෙස වර්ගීකරණය කිරීමෙන් වෙන්වෙන් වශයෙන් එක්රැස් කොට ක්‍රමානුකූලව බැහැර කරනු ලබයි. පර්යේෂණ අරමුණින් භාවිතා කරන රසායනිකයන් ද සුපරීක්ෂාකාරීව කළමනාකරණය කරන අතර, බැහැර කිරීම් අවමකර ගැනීමට මේ වනවිටත් ක්‍රියාමාර්ග ගෙන ඇත.

## සමාජය

"ප්‍රජාව සමඟ ඔවුන්ගේ ජීවන ගුණත්වය සහ ඉඩ ප්‍රස්ථාවන් ඉහළ නැංවීමටත් යහපත් සබඳතා ඇතිකර ගැනීමටත් අනුග්‍රහය ලබාදෙන්නේ සංස්කෘතිය, ජීවන රටාව මෙන්ම උරුමයන් ද ආරක්ෂා වන අයුරින්ය."

සමාජය යනු, පොදු සාම්ප්‍රදායක් සහිත වූ වටිනාකම්, සංස්ථාපිතයන්. සාමූහික ක්‍රියාකාරකම් සහ අභිරුචියන් සහිත වූ ජාතියක්, සංගමයක් හෝ පුළුල් වූ ජන එකතුවක් ලෙස හැඳින්විය හැක. සංස්ථාව ඉතාමත් වැදගත් කාර්යභාරයක් සමාජීය සහයෝගීතාව වැඩි දියුණු කිරීම සම්බන්ධයෙන් ඉටුකරන අතර, සංස්කෘතික වැඩසටහන්, යොවුන් ක්‍රියාකාරකම්, ශිෂ්‍ය සහ සමාජීය ක්‍රියාකාරකම් මීට ඇතුළත් වේ. ප්‍රජාව සමග ඔවුන්ගේ ජීවන ගුණත්වය සහ ඉඩ ප්‍රස්ථාවන් ඉහළ නැංවීමටත් යහපත් සබඳතා ඇතිකර ගැනීමටත් අනුග්‍රහය ලබාදෙන්නේ ඔවුන්ගේ සංස්කෘතිය, ජීවන රටාව මෙන්ම උරුමයන් ද ආරක්ෂා වන අයුරින් ය.

රාජ්‍ය දැව සංස්ථාව විසින් 2013 වසරේදී සමාජීය සුභසිද්ධිය උදෙසා ඉටුකරන ලද විශේෂ වැඩසටහන් පහත දැක්වේ.

## 4.1 කළමනාකරණ දිනපොත - 2013

වගකීමක් සහිත වූ සංස්ථාපිත පුරවැසියෙක් වශයෙන්, අප විසින් 2013 වසරේ කළමනාකරණ දිනපොත ,ශ්‍රී ලංකාවේ පෞරාණික දැවමය ගෘහභාණ්ඩ, යන තේමාව යටතේ ගෘහභාණ්ඩවල සුන්දරත්වය, ඓශ්වර්යය සහ පෞරාණික ගෘහභාණ්ඩ සංරක්ෂණයේ වැදගත්කම පිළිබඳ ජනතාව දැනුවත් කිරීමේ අරමුණින් මුද්‍රණය කිරීමට කටයුතු කරන ලදි.

## 4.2 දැයට කිරුළ අධ්‍යාපනික හා වෙළඳ ප්‍රදර්ශනය

''දැයට කිරුළ'' අධ්‍යාපනික හා වෙළඳ ප්‍රදර්ශනය අම්පාර නගරයේදී පැවැත් වූ අතර සංස්ථාවේ ප්‍රදර්ශන කුටිය විවිධ වූ සිත් ඇදගන්නා වූ සංරචක වලින් යුක්ත වූ අතර, නරඹන්නන්ට විනෝදය පමණක්ම නොව අධ්‍යාපනික වටිනාකමක් ද ගෙනදෙන්නක් විය. දැව සංස්ථාව විසින් දැව අස්වැන්නේ සිට අවසන් භාණ්ඩ නිෂ්පාදනය දක්වා පියවර පිළිබඳ දළ අවබෝධයක් නරඹන්නට ලබාදුන් අතර, ලී මෝල් ආකෘති, දැව පදම් කිරීමේ ආකෘති සහ දැව සංරක්ෂක අංශ වශයෙන් දැනුම ලබා දුනි. මෙමගින් දැව කර්මාන්තය පිළිබඳව ජනතාව දැනුවත් කෙරුණු අතර විඩියෝ දර්ශන, කෙටි චිත්‍රපට වැනි ශ්‍රව්‍ය දෘශ්‍ය ආධාරක මගින් ද සංස්ථාවේ විශේෂ කාර්යයන් පිළිබඳ ජනතාව දැනුවත් කරන ලදි.

ඉහත සෑම වැඩසටහනකින් ම අප අරමුණු කරන ලද්දේ දැව කර්මාන්තය පිළිබඳ මිනිසුන් තුළ ඇති අසතුටුදායි වූ සමාජ ආකල්ප වෙනස් කිරීමට සහ තිරසාර පරිසර කළමනාකරණය තුළින් කර්මාන්තයේ අනාගතය දීප්තිමත් කිරීමයි.

## 4.3 සංස්ථාවේ විද්‍යුත් සහ මුද්‍රිත ප්‍රකාශන

මුද්‍රිත ලිපිලේඛණ 100කට අධික ප්‍රමාණයක් 2013 වසරේ අඛණ්ඩව ප්‍රකාශයට පත් කරන ලදි. විශේෂයෙන්ම, ,විදුසර, විද්‍යා ප්‍රභන්ධය සහ විජය පුවත්පත් අප වෙනුවෙන් වටිනා ලිපිලේඛණ පළ කිරීම සඳහා අවස්ථා සලසා දී ඇත. විජය, පුවත්පත ලිපි ලේඛණ 66ක් ප්‍රකාශයට පත්කර ඇති අතර, සෑම දැන්වීමකම වනවගාව පිළිබඳ තොරතුරු, භෞතික සහ යාන්ත්‍රික දැව වස්තූන්, දැව ශරීරය පිළිබඳ තොරතුරු සහ දැව උපයෝගිතාව පිළිබඳ තොරතුරු රැසක් අඩංගු වී ඇත. මෙම ලිපි තුළ පර්යේෂණ අංශය මගින් කරන ලද පර්යේෂණවල යාවත්කාලීන තොරතුරු ද ඇතුළත් වී ඇත.

ප්‍රසිද්ධ රූපවාහිණී නාලිකා වන “Eye” නාලිකාව, ස්වර්ණවාහිනිය සහ ,අයි.ටී.එන්, නාලිකාවන් සංස්ථාව වෙනුවෙන් විධිමත් සාකච්ජා පැවැත්වීම සඳහාත් අප නිෂ්පාදන පිළිබඳ ජනතාව දැනුවත් කිරීම සඳහාත් අවස්ථාවන් ලබාදුනි.

## සම්මාන හා විශේෂ ගෞරව තිළිණ.

("සෑම ආකාරයකටම අපගේ විශිෂ්ඨ කැපවීම පෙන්නුම් කිරීම නිසා අප සම්මානයට පාත්‍ර වූ වගයි.")




ජාතික වාණිජ්‍ය මණ්ඩලය මගින් පැවැත්වූ 2013 ජාතික ව්‍යාපාර විශිෂ්ඨත්ව සම්මාන උළෙලේදී රාජ්‍ය දැව සංස්ථාව රාජ්‍ය අංශයේ නිෂ්පාදන වෙනුවෙන් පිදෙන විශිෂ්ඨ කුසලතා සම්මානයෙන් පිදුම් ලබන ලදී.







2009



2010




2011



2012



2009 2010 2011

ජාතික වාණිජ මණ්ඩලය පිරිනමන රන් සම්මානයෙන් අඛණ්ඩව 2009, 2010 හා 2011 වසර තුළදී රාජ්‍ය දැව සංස්ථාව පිදුම් ලබන ලදී.

හරිත මැකෝ සම්මානය 2008 - ශ්‍රී ලංකා ජනමාධ්‍ය සංගමය

වන හා පරිසර අධ්‍යාපනයට වූ දායකත්වය වෙනුවෙන් සම්භාවනා හා ඇගයීම් මැකෝ සම්මානය 2010 ශ්‍රී ලංකා ජනමාධ්‍ය සංගමය.

2009 "දැයට කිරුළ" ප්‍රදර්ශනයේ වඩාත් නිර්මාණශීලි ප්‍රදර්ශන කුටිය.



# අවදානම් කළමනාකරණය

*"නිෂ්පාදන ක්‍රියාවලිය, නිෂ්පාදිත, නව නිර්මාණ, බෙදාහැරීම, මූල්‍ය ඇතුළු සියලු අංශවල අවදානම් කළමනාකරණය පිළිබඳ අපගේ අවදානය නිරන්තරයෙන් යොමුකර ඇත."*

අවදානම් හඳුනාගැනීම, ඇගයීම සහ ප්‍රමුඛස්ථානයේ අනුපිළිවෙල අනුව සැකසීම තුළින් නොයෙකුත් සිදුවීම් මගින් ඇතිවන අලාභ අවමකරගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම අවදානම් කළමනාකරණය යනුවෙන් හඳුන්වාදිය හැක. රාජ්‍ය දැව සංස්ථාව විසින් නිසි ලෙස අවදානම් කළමනාකරණය කරමින් එහි අරමුණු හා පරමාර්ථ සාක්ෂාත් කරගැනීමේ ප්‍රයත්නයක නියැලෙමින් සිටී. සීග්‍රයෙන් වෙනස් වන වර්තමාන පරිසරය තුළ ඇතිවන අවදානම් කළමනාකරණය කිරීම අනාගත පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය කටයුත්තකි. අවදානම් සම්පූර්ණයෙන් ඉවත් කළ නොහැක. නමුත් ඒවා අවමකර ගත හැක. එමනිසා අවදානම් අවමකිරීම පිළිබඳ වැඩි අවධානයක් යොමුකිරීම සඳහා සංස්ථාව විසින් නොයෙකුත් ක්‍රියාමාර්ග දියත් කොට ඇත.

අවදානම් කළමනාකරණ උපාය මාර්ග ස්ථාපිත කිරීම මගින් අවදානම් හඳුනාගැනීමට, ඇගයීමට සහ කළමනාකරණය කිරීමට ව්‍යුහගත සහ පැහැදිලි ප්‍රවේශයක් ලැබේ. නිෂ්පාදන ක්‍රියාවලිය, නිෂ්පාදිත, නිර්මාණ, බෙදාහැරීම හා මූල්‍ය ඇතුළු සියලු අංශවල අවදානම් කළමනාකරණය පිළිබඳ අපගේ අවදානය නිති යොමුකර ඇත. අවදානම් කළමනාකරණ උපාය මාර්ග ගොඩනැංවීමට පහත ආකෘතිය භාවිතා කරනු ලැබේ.

1. අවදානම හඳුනාගැනීම
2. අවදානම් විශ්ලේෂණය කිරීම
3. අධීක්ෂණය හා සමාලෝචනය
4. අවදානම් ප්‍රතිකාර

,සංස්ථාව තුල නියමිත වේලාවට යෝග්‍ය උපායමාර්ග ගෙන අවදානම් කළමනාකරණය වෙනුවෙන් අවශ්‍ය කටයුතු සලසා ඇත.,

## මූල්‍ය අවදානම් කළමනාකරණය

| අවදානම හඳුනාගැනීම | ආයතනයේ පරමාර්ථ | අවදානම් ප්‍රතිකාර |
|---|---|---|
| 01. ද්‍රවශීලතාවය හා මූල්‍ය කළමනාකරණය | යහපත් ද්‍රවශීලතා මට්ටමක් පවත්වා ගෙන යාම. ක්‍රමවත් මූල්‍ය සැලසුම් හා පාලන පද්ධතියක් ස්ථාපිතකිරීම. | උපාය මාර්ග - අවදානම් අවම කිරීම<br><br>මුදල් ප්‍රවාහ පුරෝකථනය සහ ප්‍රමාණවත් මුදල් සහ මුදල් සමාන වත්කම් ශේෂ පවත්වාගැනීම.<br><br>සංස්ථාව සතුව අවශ්‍ය වූ විටක ඇප ලෙස භාවිතා කොට අනාගත මූල්‍ය අවශ්‍යතා සපුරා ගැනීම සඳහා ප්‍රමාණවත් වත්කම් පවත්ගැනීම.<br><br>සංස්ථාවේ ප්‍රතිපත්තිමය තීරණ ගැනීම මධ්‍යගත කොට ඇත.<br><br>ක්‍රමවත් ණය අයකරගැනීමේ ප්‍රතිපත්තියක් තුළින් බොල් ණය සහ ණයගැති ශේෂ ඉහළයාම වැලැක්වීම.<br><br>වියදම් පාලනය කිරීම සඳහා උචිත බලතල ස්ථාපිත කිරීම. |

| | | |
|---|---|---|
| 02. පොළී අනුපාතය මත අවදානම | පොලී අනුපාත වෙනස්වීමෙන් ඇතිවන බලපෑම් අවම කරගැනීම. | උපයා මාර්ග - අවදානම් අවම කිරීම<br><br>බැංකු සමග සාකච්ඡා කොට එකඟතාවයකට පැමිණ සංස්ථාවේ ආයෝජනයන් මත ඉහල පොලී අනුපාත ලබාගැනීම සඳහා කටයුතු කිරීම<br><br>සැපයුම්කරුවන්ගෙන් පොලී රහිතව යම්කිසි කාල සීමාවකට යටත්ව ණයට භාණ්ඩ ලබාගැනීමටත් එමගින් අධික පිරිවැය සහ පොලී අනුපාත වල උච්චාවචනයන් වළක්වා ගැනීමටත් ක්‍රියාකිරීම.<br><br>අවම තෝලන මට්ටමක් පවත්ගැනීම.<br><br>ඵලදායී ලෙස කාරක ප්‍රාග්ධන කළමනාකරණය<br><br>මූල්‍ය අවදානම් කළමනාකරණ ශිල්ප ක්‍රම ස්ථාපනය. |

## ව්‍යාපාරික අවදානම් කළමනාකරණය

| අවදානම හඳුනාගැනීම | ආයතනයේ පරමාර්ථ | අවදානම් ප්‍රතිකාර |
|---|---|---|
| 03. ණය අවදානම් | ණයගැතියන්ගෙන් ණය අයකර ගත නොහැකිව ඇතිවන අවදානම් අවම කිරීම | උපාය මාර්ග - අවදානම් වළක්වා ගැනීම.<br>අඩමාන ණය වෙන්කිරීම සහ විමර්ශනය සඳහා සංස්ථාව විසින් විධිමත් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරනු ලබයි.<br><br>ණයගැතියන් සඳහා වාර්ෂිකව බොල් සහ අඩමාන ණය වෙන්කිරීම් කරනු ලබයි.<br><br>බොහෝවිට මුදල් මත පමණක් විකුණුම් සිදුකිරීමට වගබලා ගන්නා අතර, ණයට විකුණුම් සිදුකරනුයේ සංස්ථාවේ ණයට විකුණුම් ප්‍රතිපත්ති අනුගමනය කරමින් ය.<br><br>සියලු ලැබිය යුතු හා ගෙවිය යුතු ණයගැති හා ණයහිමි ගිණුම් පිළිබඳ නිරන්තර අවධානය යොමුකර ඇත.<br><br>තනි පුද්ගලයින් සඳහා බොහෝවිට ණයට විකුණුම් කරනු නොලබන අතර නව අලෙවිකරණ උපක්‍රමයක් ලෙස රාජ්‍ය සේවකයන් සඳහා පමණක් සහනදායී පොළී අනුපාතයන්ට ''ප්‍රසාද අභිමානි'' ක්‍රමය යටතේ භාණ්ඩ ණයට විකුණනු ලැබේ.<br><br>රාජ්‍ය ආයතන සඳහා පමණක් ණයට විකුණුම් සිදුකරයි. බොහෝවිට මහා භාණ්ඩාගාර හුවමාරුව යටතේ ගිණුම් පියවීම සිදුකරගනු ලබයි.<br><br>සංස්ථාවේ පාරිභෝගිකයන්ගේ ණය පියවීමේ හැකියාව සම්බන්ධව අගය කිරීමේ ක්‍රියාකාරී පිළිවෙතක් නිබඳව අනුගමනය කරන අතර, පාරිභෝගිකයන් සඳහා ණය ප්‍රතිපත්ති ස්ථාපිත කිරීමක් සිදුකරනු ලබයි. නිරතුරුව අධීක්ෂණය කළ හැකි හා ණය අයකරගැනීමේ ප්‍රතිපත්ති ස්ථාපිත කිරීම. |

| | | |
|---|---|---|
| 04. වත්කම් අවදානම් | වත්කම් වලින් සිදුවන අලාභ අවම කරගැනීම. එනම්, විශේෂයෙන් යන්ත්‍ර සූත්‍ර ක්‍රියාවිරහිතවීම්, ගින්නෙන්, හදිසි අනතුරු වලින් සේවකයන්ගෙන් හා සොර සතුරු උවදුරු වලින් වත්කම් වලට ඇතිවිය හැකි හානි අවම කිරීම. | උපාය මාර්ග - අවදානම් වළක්වාගැනීම<br><br>සියලුම අවදානම් අංශයන් ආවරණය වන පරිදි රක්ෂණාවරණයන් වත්කම් සඳහා ලබාගැනීම.<br><br>සැලසුම්ගත නඩත්තු කිරීමේ වැඩසටහනක් යටතේ වත්කම් නඩත්තුව සිදුකිරීම.<br><br>වත්කම් වල සියලු කටයුතු වෙනුවෙන් විශේෂ ප්‍රතිපත්ති බලතල පනවා ඇත. එමෙන්ම අභ්‍යන්තර විගණන කටයුතු නිසි වේලාවට සිදු කිරීම. |
| 05. අභ්‍යන්තර පාලනයන් | ක්‍රමවත් සහ විධිමත් අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වා ගැනීම තුළින් සංස්ථාවේ වත්කම් සුරක්ෂිත කිරීම සහ දැනට පවත්නා ක්‍රියාවලිය තුළ පවත්නා දුර්වලතා සහ ඒවායේ අවදානම් අවම කිරීමට උචිත පියවර ගැනීම. | උපාය මාර්ග - අවදානම් අවම කිරීම.<br>නිරන්තරව කාල සටහනකට අනුව නියමාකාරයෙන් අභ්‍යන්තර විගණනයන් සිදුකිරීම වෙනුවෙන් අභ්‍යන්තර විගණන අංශය කැපවීමෙන් කටයුතු කිරීම.<br><br>රාජ්‍ය අංශයේ ව්‍යාපාරික ආයතනයක් ලෙස සුදුසු පාලන පද්ධතියක් පවත්වාගැනීම. විශේෂයෙන් මුදල් ගෙවීම්, සැපයුම්කරුවන් තෝරාගැනීම, සේවකයින් බඳවාගැනීමේ ක්‍රියාවලි පිළිබඳ වැඩි අවධානයක් යොමුකිරීම.<br><br>සියලුම මූල්‍ය ක්‍රියාකාරකම් මූල්‍ය පනත් විධිවිධානයන්ට සහ පවත්නා නීති හා රෙගුලාසි අනුව සිදුකරනු ලබයි. |
| 06. මානව සම්පත | සේවක පිරිවැටුම අවම මට්ටමක පවත්වා ගැනීම.<br><br>බාධාවන්ගෙන් තොරව මෙහෙයුම් කටයුතු කාර්යක්ෂමව ඉටුකර ගැනීම.<br><br>පුහුණුවීම් සහ යහපත් පිළිවෙත් තුළින් අනුවර්තනාවය.<br><br>යෝග්‍ය සහ කාර්ය ඵල ජනිත කරන සේවකයින් සංස්ථාව වෙත ආකර්ෂණය සහ සංස්ථාව තුළ රඳවාගැනීම.<br><br>යහපත් වැඩ පරිසරයක් ආයතනය තුළ පවත්වාගැනීම. | උපයා මාර්ග - අවදානම් වලක්වා ගැනීම.<br><br>යහපත් සහ මිත්‍රශීලි වැඩ පරිසරයක් හැම සේවක මට්ටමක් අතර ම පවත්වාගැනීම.<br><br>විවිධ ආකාරයේ සේවක ප්‍රතිලාභ ලබාදීම.<br><br>අවශ්‍ය අවස්ථාවලදී සේවකයින් විශේෂ සහ පොදු පුහුණු පාඨමාලා සඳහා යොමු කරනු ලැබේ.<br><br>රාජ්‍ය ආයතනයක් ලෙස විශේෂ ප්‍රතිපත්ති මාලාවකට අනුව නව සේවකයින් බඳවා ගනුලැබේ. |

**අවදානම් කළමනාකරණය යනු ප්‍රවේශමෙන් කළයුතු ක්‍රියාවලියකි.,**

| | | |
|---|---|---|
| 07. තාක්ෂණය සහ නිෂ්පාදිත වල ගුණාත්මකභාවය සම්බන්ධ අවදානම් | නවීන තාක්ෂණය සහ තත්ව ප්‍රමිති පිළිබඳ, වැඩි අවධානයක් යොමුකිරීම මඟින් ආයතනය තුළ යල්පැනගිය ක්‍රම භාවිතය නිසා ඇතිවන ගැටළු මගහරවා ගැනීම.<br><br>භාණ්ඩ හා සේවා නියමිත ගුණාත්මකභාවයෙන් නොපැවතිම අවම කිරීම.<br><br>අදාල නීතිරීති වලට අනුකූලව සැලසුම් ක්‍රියාත්මක කිරීම. | උපයා මාර්ග - අවදානම් වලක්වා ගැනීම.<br>දිගුකාලීන සැලසුම් වලට අනුව යල්පැනගිය යන්ත්‍ර වෙනුවට නව යන්ත්‍ර නිෂ්පාදනයට භාවිතා කිරීම.<br><br>අපගේ නිෂ්පාදන ජාතික සහ අන්තර්ජාතික මට්ටම් හා ගැලපෙන බවට අදාල ආයතනයන්ගේ සහතික ලබාගැනීම.<br><br>පර්යේෂණ හා සංවර්ධන අංශය මගින් පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම් සංස්ථාවේ අභිවෘද්ධිය උදෙසා සිදුකිරීම.<br><br>නිෂ්පාදන ගුණත්වය ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය පර්යේෂණ කටයුතු වෙනුවෙන් විද්‍යාගාර පහසුකම් සැපයීම.<br><br>බාහිර හා අභ්‍යන්තර විගණනයන් මගින් නිරතුරුව සොයාබැලීම. |
| 08. තොග කළමනාකරණ අවදානම් | තොග නොමැතිවීමෙන් සිදුවන අලාභ වළක්වාගැනීම.<br><br>සෙමින් චලනය වන තොග එක්රැස්වීමෙන් සිදුවන අලාභ අවම කිරීම.<br><br>යල්පැනගිය තොග එක්රැස්වීමෙන් සිදුවන අලාභ අවම කිරීම.<br><br>ගුණත්වයෙන් අඩු අමුද්‍රව්‍ය තොග ලබාගැනීමෙන් සහ භාවිතයෙන් සිදුවන අලාභ අවම කිරීම.<br><br>තොග රඳවා ගැනීමේ පිරිවැය අවම කිරීම. | උපාය මාර්ග - අවදානම් අවම කිරීම.<br>මාසික විකුණුම් පුරෝකථනයන් සහ වාර්ෂික අයවැයගත නිෂ්පාදන ඉලක්ක පිළිබඳ සැලකිල්ලට ගෙන නිෂ්පාදන සැලසුම් කමිටු රැස්වීමේදී මාසික නිෂ්පාදන ඉලක්ක තීරණය කෙරේ.<br><br>සෙමින් චලනයවන නිෂ්පාදිත අලෙවි කරගැනීම සඳහා විවිධ අලෙවිකරණ උපක්‍රම යෙදීම. උදා:- "ප්‍රසාද අභිමානී ගෘහභාණ්ඩ ණය යෝජනා ක්‍රමය" වැනි අලෙවිකරණ උපාය මාර්ග.<br><br>නිෂ්පාදන ක්‍රියාවලිය විවිධ මට්ටම් වලදී තත්ව පරීක්ෂණයන්ට භාජනය කොට නිමිභාණ්ඩ පාරිභෝගිකයන් අතට පත්වීම දක්වා ගුණත්වය සහතික කිරීම.<br><br>නියමිත ප්‍රමිතියෙන් තොර නිෂ්පාදිත වෙන්කොට ඒවා සංස්ථාවේ කීර්ති නාමයට හානි නොවන පරදි විකිණීමට හෝ ක්‍රමවත් අයුරින් බැහැර කිරීමට කටයුතු යෙදීම.<br><br>නිරතුරුව තොග විශ්ලේෂණය කොට සෙමින් චලනය වන තොග හඳුනාගෙන ඒවා ආදායම් ඉපැයීම සඳහා යොදාගැනීම.<br><br>නිරතුරුව තොග රඳවාගැනීමේ කාලය පිළිබඳ සැලකිලිමත්වීම.<br><br>කාලයෙන් කාලයට විශ්ලේෂණය කොට සෙමින් චලනය වන තොග සඳහා සුදුසු ක්‍රියා මාර්ග ගැනීම. සුදුසු ගබඩා පහසුකම් සහ ගබඩා කිරීමේ ක්‍රම සැලසීම. |

| | | |
|---|---|---|
| 09. වෙළඳපොල තරඟකාරීත්වය | අඩු ගුණත්වයෙන් යුත් ආනයනික දැව හා දැවමය භාණ්ඩ හේතුවෙන් වෙළඳපොල තරඟකාරීත්වය ඉහලයාමෙන් ඇතිවිය හැකි වෙළඳපොල කොටස අඩුවීම වැළැක්වීම.<br><br>ප්‍රධාන නිෂ්පාදිතවල විකුණුම් ආදායම ඉහලනංවා ගැනීම. (එනම්, දැව කඳන්, ඉරූදැව, සිල්පර, විදුලි කණු, අලිවැට කණු වැනි ආදායම්)<br><br>නවෝත්පාදනය තුළින් වෙළඳපොළ කොටස ඉහළ නැංවීම. | උපාය මාර්ග - අවදානම් අවම කිරීම.<br>පවතින තත්ව පාලන ප්‍රමිති වලට අනුකූල වන බවට හැමවිටම තහවුරු කර ගැනීම.<br><br>විවිධ පුවත්පත් දැන්වීම් සහ ප්‍රවර්ධන වැඩසටහන් මගින් තවදුරටත් රාජ්‍ය දැව සංස්ථාවේ කීර්ති නාමය ශක්තිමත් කිරීමට කටයුතු කිරීම.<br>• රාජ්‍ය සේවකයින් සඳහා ලබාදෙන ''ප්‍රසාද අභිමානී'' ගෘහභාණ්ඩ ණය ක්‍රමය, යටතේ අවුරුදු 2ක ණය ආපසු ගෙවීමේ කාලයකට යටත්ව 10% පොලී අනුපාතිකය මත භාණ්ඩ ලබාදිම.<br>• 2013 වර්ෂයේ සිට ණයපත් ක්‍රමය හරහා ගනුදෙනු කිරීම ආරම්භ කිරීම.<br>නව දැව ගබඩා සහ නව ප්‍රදර්ශනාගාර සහ නවීකරණය කරන ලද ප්‍රදර්ශනාගාර ජාලයක් දිවයින පුරා ඇතිකිරීම.<br><br>නවෝත්පාදන වෙනුවෙන් පර්යේෂණ පැවැත්වීම මෙන්ම නව සංකල්ප ආයතනය තුළට ගෙන ඒම මගින් පාරිභෝගික ආකර්ශණය වැඩිකර ගැනීම.<br><br>වෙළඳපොළ පර්යේෂණයන් තුළින් පාරිභෝගිකයන්ගේ අපේක්ෂාවන් හඳුනාගැනීම. |
| 10. ප්‍රාග්ධන ආයෝජන | වත්මන් සහ අනාගතයේ සැලසුම් කොට ඇති ආයෝජන වලින් සිදුවන අලාභ අවම කිරීම. | උපාය මාර්ග - අවදානම් වලක්වාගැනීම.<br>වත්කම් වල ආයෝජන කිරීමේදී නියමිත පරිදි සැලසුම් කොට සංස්ථාවේ අයවැයට අනුකූලව කටයුතු කිරීම.<br><br>පවත්නා සියලුම වත්කම් උපරිම ලෙස උපයෝජනය.<br><br>ප්‍රාග්ධන ආයෝජන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී රාජ්‍ය අංශයේ ව්‍යාපාරයක් ලෙස වගකීමෙන් කටයුතු කිරීම. |
| 11. තොරතුරු පද්ධතිය | නිවැරදි තොරතුරු හිඟ බව, තොරතුරුවල සුරක්ෂිත බව, දෘඩාංග, සන්නිවේදන පද්ධති හා බැඳි පවතින අවදානම් අවම කිරීම.<br><br>තාක්ෂණික ප්‍රතිපත්ති නිරන්තරව යාවත්කාලීන කොට නව තාක්ෂණික පරිසරයට ගැලපෙන අයුරින් පවත්වාගැනීම.<br><br>සංස්ථාව තුළ තොරතුරු සුරක්ෂිතභාවය මැන බලන මිනුම්වල ඒකීයතාවය සහ ප්‍රමිතියට අනුකූල බව හැම විටම තහවුරු කරගැනීම. | උපාය මාර්ග - අවදානම් වළක්වාගැනීම.<br><br>නිරතුරුව තොරතුරු තාක්ෂණික ප්‍රතිපත්තිවලට අනුකූලවීම.<br><br>දත්ත උපස්ථ පිටපත් නිතර එක්රැස්කොට බාහිර ස්ථානවල ගබඩා කිරීම.<br><br>වැදගත් දත්ත සම්බන්ධ දෘඩ තැටියේ ආදර්ශයක් තබාගැනීම.<br><br>නඩත්තු කිරීම් සහ අනෙකුත් සේවා සඳහා වාර්ෂිකව සැපයුම්කරුවන් සමඟ ගිවිසුම් වලට එළඹීම.<br><br>දන්නා වෛරස අනාවරණය කර නිශ්දෙනය කරන පිළි වෛරස මාදුකාංග, අනෙකුත් මෘදුකාංග නිසි කලට යාවත්කාලීන කිරීම.<br>හැමවිටම රහස් සංකේත භාවිතා කිරීමට පෙළඹවීම තුළින් තොරතුරු වලට බාහිර පුද්ගලයින් අනවසරයෙන් ඇතුළත්වීම වැළැක්වීම. |

| | | |
|---|---|---|
| 12. පරිසරය | සංස්ථාවේ මෙහෙයුම් වලින් පරිසරයට සිදුවන අහිතකර ප්‍රතිවිපාක අවම කිරීම.<br><br>සංස්ථාවේ පාරිසරික ප්‍රතිපත්තිවලට අනුව කටයුතු කිරීම. | උපාය මාර්ග - අවදානම වලක්වා ගැනීම.<br>පාරිසරික ප්‍රතිපත්ති තීරණය කරන ආයතනවල ප්‍රතිපත්ති වලට අනුකූල බව තහවුරු කර ගැනීම.<br><br>පරිසරය කෙරෙහි ඇල්මැති පාර්ශවයන් සමග ශක්තිමත් සම්බන්ධතාවයක් ඇති කර ගැනීම. |
| 13. නීති හා රෙගුලාසි | නීති හා රෙගුලාසි වලට අනුකූල නොවීමෙන් සිදුවන අලාභ වලක්වා ගැනීම.<br><br>නීති හා රෙගුලාසි වල වෙනස්වීමෙන් ඇතිවන බලපෑම් කල්තියා හඳුනාගෙන සංස්ථාවට ඇතිවන බලපෑම් අවම කිරීම.<br><br>නෛතික පරිසරය තුල ඇතිවන වෙනස්කම් වලට සාර්ථකව මුහුණදීම සඳහා ශක්තිමත්. ඵලදායි සහ නම්‍යශීලි ව්‍යුවහක් ඇති කිරීම. | උපාය මාර්ග - අවදානම වලක්වා ගැනීම.<br>නීති හා රෙගුලාසි වලට අනුකූල වෙමින් කටයුතු කිරීම.<br><br>අධ්‍යක්ෂවරු සහ අදාල බලධාරීන්ගේ උපදෙස් මත කටයුතු කිරීම.<br><br>නීති ප්‍රතිපත්ති නැඹුරුතාවය පිළිබඳ අධීක්ෂණය කිරීම.<br><br>නීති හා රෙගුලාසි සමග ගනුදෙනු කිරීමේදී වඩාත් සැලකීමෙන් කටයුතු කළයුතුවේ., |
| 14. කීර්තිනාමය | අපගේ කීර්තිනාමයට සහ නිෂ්පාදනයන්ගේ ගුණත්වයට හානි සිදුවන ක්‍රියාවලින් වැළකීම.<br><br>මෙහෙයුම් කාර්යක්ෂමතාවය, මූල්‍ය කටයුතුවල විනිවිදභාව තුළින් ඇල්මැති පාර්ශවයන් සමග ශක්තිමත් සම්බන්ධතාවයක් ගොඩනගා ගැනීම. | උපයා මාර්ග - අවදානම් අවම කිරීම.<br>අයවැයගත ඉලක්ක අනුව මාසිකව අයවැය ඉලක්ක වෙත ළඟාවන අයුරින් ක්‍රියාකිරීම සහ සංස්ථාවේ කාර්ය සාධන අපේක්ෂිත ඉලක්ක හා ගැලපේද යන්න තහවුරු කරගැනීම.<br><br>නිෂ්පාදන ගුණාත්මකභාවය සහ ප්‍රමිතීන්ට අනුකූල බව තහවුරු කරගැනීම.<br><br>ඇල්මැති පාර්ශවයන් සමග යහපත් ඵලදායි සන්නිවේදන ක්‍රම තුළින් ගනුදෙනු සිදුකිරීම.<br><br>සංස්ථාවේ ප්‍රතිරූපය තව තවත් ඉහළ නැංවීම සඳහා බාහිර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.<br>උදා:- රුක් රෝපණ වැඩසටහන |





# විගණකාධිපති වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } ටීඑම් /අයි /එස්ටීසී/එෆ්/2013 ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2014 නොවැම්බර් 12 දින

14 NOV 2014

13 NOV 2014

සභාපති

රාජ්‍ය දැව සංස්ථාව.

**රාජ්‍ය දැව සංස්ථාවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
වැඩබලන විගණකාධිපති.

පිටපත් :- 1. ලේකම් - පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය.

2. ලේකම් - මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, .- இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. TM2/L/MEPA/1/13/28    ඔබේ අංකය / உமது இல. / Your No.    දිනය / திகதி / Date 2014 නොවැම්බර් 12 දින

සභාපති,

රාජ්‍ය දැව සංස්ථාව.

**රාජ්‍ය දැව සංස්ථාවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

රාජ්‍ය දැව සංස්ථාවේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ අංක 29 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සංස්ථාවේ සභාපති වෙත 2014 මැයි 19 දින නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, .- இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත්වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංස්ථාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

----------------------------------------------

මෙම වාර්තාවේ 2:2 ජේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කල මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය දැව සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත

පහත සඳහන් ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

(අ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16**

i. පිරිවැය රු. 794,855,634 ක්වූ සමාලෝචිත වර්ෂය අවසානයේ ශුද්ධ අගය රු.83,525ක් වූ වත්කම් අයිතම 6,705ක් හා වර්ෂය අවසානයට ශූන්‍ය අගයයන් පෙන්නුම් කළ සංස්ථාව විසින් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවති රු. 5,827,394ක් වූ දේපල, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

ii. ස්ථාවර වත්කම් සම්බන්ධව අනුගමනය කරනු ලබන ක්ෂය ක්‍රමය සෑම මුදල් වර්ෂයක් අවසානයේදීම සමාලෝචනය කළයුතු අතර, ඊට ලැබෙන ආර්ථික ප්‍රතිලාභ රටාවේ සැලකිය යුතු වෙනසක් වේනම් එම රටාව නිරූපනය වන ලෙසට ක්ෂය ක්‍රමය වෙනස් කළ යුතුය. එසේ වුවත් සංස්ථාව මෙම නියමයන්ට අනුව කටයුතු කර නොතිබුණි.

iii. දේපල, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කරනවිට එම වත්කම් පන්තියම මුළු මුනින්ම ප්‍රත්‍යාගණනය කළ යුතු වුවත් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් පවරාගත් සියළුම ඉඩම් ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශන දැක්වීමට කටයුතු කර නොතිබුණි.

**(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 37**

වගකීමේ ප්‍රමාණය නිශ්චිතව ඇස්තමේන්තු කළ හැකිවිට සහ වගකීම නිශ්චිත වන විට අසම්භාව්‍ය වගකීම් සඳහා වෙන්කිරීම් කළ යුතු වුවත් වැඩ තහනම්කළ නිලධාරියෙකුගේ චෝදනාවලට ඔහු නිවැරදිකරු වීම නිසා සංස්ථාවට ගෙවීමට සිදුවී තිබුණ රු. 1,957,174 ක් හිඟ වැටුප් සඳහා ප්‍රතිපාදන වෙන්කර නොතිබුණි.

**(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 40**

සංස්ථාවේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලෙන් කොටසක් බාහිර පාර්ශවයන්ට කුළියට දී තිබු නමුත් (2013 දෙසැම්බර් 31 දිනට ගොඩනැගිල්ලේ ශුද්ධ වටිනාකම රු.5ක් වූ හෙයින්) බදුකුලී උපයන කොටස හා සංස්ථාව භාවිතයට ගන්නා කොටස වෙන් වෙන්ව තක්සේරු කර පිළිවෙලින් ආයෝජන වත්කම් හා දේපල , පිරියත හා උපකරණ ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි

**2.2.2 නොසැසඳු පාලන ගිණුම්**

2013 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද ගිණුම් ශේෂයන් හා ඊට අදාළ උපලේඛන හා සැසඳීමේදී පහත සඳහන් වෙනස්කම් දක්නට ලැබුණි.

| විස්තරය | ගිණුම අනුව ශේෂය (රු) | උපලේඛන අනුව ශේෂය (රු) | වෙනස වැඩිවීම/(අඩුවීම) (රු.) |
|---|---|---|---|
| කල්දෙමුල්ල යාන්ත්‍රික ඉංජිනේරු අංශය තොග සහ අමතර කොටස් ගිණුම | 20,796,319 | 20,689,413 | 106,906 |
| බූස්ස ගෘහභාණ්ඩ සංකීර්ණය විශ්‍රාම පාරිතෝෂික වෙන්කිරීම | 3,973,635 | 3,734,080 | 239,555 |
| බූස්ස දැව සංකීර්ණය විශ්‍රාම පාරිතෝෂික වෙන්කිරීම | 11,133,346 | 12,015,148 | (881,802) |

**2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්**

සමාලෝචිත වර්ෂයේ අවසානයට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු ස්කන්ධභාගය මූල්‍ය ප්‍රකාශන වලට අනුව රු.661,562,629 ක් වුවද එම දෙපාර්තමේන්තුවේ වාර්තා අනුව සංස්ථාවෙන් ලැබිය යුතු ස්කන්ධභාගය රු 706,610,518 ක් වූයෙන් රු. 45,047,889 වෙනසට හේතුන් විගණනයට පැහැදිලි නොකෙරුණි.

**2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ). ශ්‍රමාභිමානී රැස්වීම සඳහා සහභාගීවූ සේවකයින්ට ආහාරපාන හා ටී ෂර්ට් සඳහා දරන ලද රු. 1,100,000 ක වියදම තහවුරු කිරීම සඳහා සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

(ආ) සෙල්ල කතරගම සංචාරක බංගලාව ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවේ පළමු අතිරේක වැඩ සඳහා හා දෙවන අතිරේක වැඩ සඳහා පිළිවෙලින් රු. 743,295 ක් සහ රු. 1,113,062 ක් ගෙවා තිබුණද, මිනුම්, වැඩ වාර්තා හෝ බිල්පත් කිසිවක් ඉදිරිපත් කර නොතිබුණි.

**2.2.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

සෙල්ලකතරගම සංචාරක බංගලාවේ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව සඳහා ගෙවීම් කිරීමේදී තථ්‍ය වියදම ඉක්මවා රු. 2,174,394 ක් වැඩිපුර ගෙවා තිබුණි.

**2.3 ලැබිය යුතු ගිණුම් හා ගෙවිය යුතු ගිණුම්**

**වෙළඳ ණයගැතියන් හා අනෙකුත් ලැබිය යුතු ගිණුම් පිළිබඳ පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

(අ) ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වලට අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු වෙළඳ ණයගැතියන් රු 475,392,716 ක් විය. මෙයින් රු. 12,442,454 ක් වර්ෂ 4ක ට වැඩි කාලයක්ද, රු. 5,105,542 ක් වර්ෂ 3 කට වැඩි කාලයකද, රු.45,134,668 ක් වර්ෂ 2 කට වැඩි කාලයකද පැරණි ණය ශේෂ විය.

(ආ) 2009 වර්ෂයට පෙර සිට රජයේ දෙපාර්තමේන්තුවකින් අයවිය යුතු රු. 568,500 ක් හා 1983 වර්ෂයේ සිට පෞද්ගලික සමාගකින් අයවිය යුතු රු.11,873,954 ක් 2014 අගෝස්තු අවසානය දක්වා අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර මෙම ණය අයකර ගැනීමේ හැකියාවද අවිනිශ්චිතවේ.

(ඇ) රාජ්‍ය ආයතන 35 කින් වර්ෂ 1 සිට 2 දක්වා කාලයක සිට අයවිය යුතුව තිබුණු ණය ප්‍රමාණය රු. 48,830,545 ක් වූ අතර පෞද්ගලික ආයතනයකින් 2012 වර්ෂයේ සිට අයවිය යුතුව තිබුණු ණය ශේෂය රු. 108,329 ක් ද විය.

(ඈ) 2010 හා 2012 වර්ෂය තුළදී බොල්ණය ලෙස කපාහල අගයන් පිළිවෙලින් රු 1,780,932 ක් හා රු. 3,877,002 ක් වු අතර, ඒ සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) ප්‍රසාද අභිමානී නැමති යෝජනා ක්‍රමය යටතේ රාජ්‍ය සේවකයන් ණය පදනම මත ගෘහභාණ්ඩ ලබාගත් නිලධාරීන් 27 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 693,435 ක ණය වසර 1 සිට 4 දක්වා කාලයක සිට පරිශේෂව පැවති අතර, එම ණය ශේෂයන් අදාළ පාර්ශවයන්ගෙන් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) ප්‍රාදේශීකයන් 7කට අදාළව 2010 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා කාලයට අයත් රු.555,346 ක විවිධ ණයගැති ණය ශේෂයන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(උ) දැව සැපයුම්කරුවන්හට ගෙවන ලද අත්තිකාරම් මුදල් ගබඩා සැපයුම් නිමකර අවසාන ගෙවීම් කිරීමේදී අඩුකර ගෙවීම් කල යුතු වුවද එසේ කටයුතු නොකිරීම නිසා ප්‍රාදේශික 3 කට අදාළව 2010 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා වු කාලය වෙනුවෙන් රු. 1,358,192 තවදුරටත් අයවිය යුතුව තිබුණි.

(ඌ) සංස්ථාව විසින් 1988 වර්ෂයේදී කතරගම අෂ්ඨපල අරමුදලට රු. 2,000,000 ක පොළී රහිත ණය මුදලක් ලබාදී තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී එයින් රු. 38,000 මුදලක් අයවී තිබුණ අතර තව දුරටත් රු. 1,037,000 ක් අය වීමට තිබුණි.

**වෙළද ණයහිමියන් හා වෙනත් ගෙවිය යුතු ගිණුම් සම්බන්ධව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට වන ජීවී දෙපාර්තමේන්තුවට හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු ස්කන්ධභාග මුදල් පිළිවෙලින් රු. 335,619 ක් හා රු.661,562,629 ක් වු අතර එම මුදල නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වසර 01 සිට 05 දක්වා වු කාලයක සිට ආපසු ගෙවිය යුතු රු .6,565,130 ක් වු ටෙන්ඩර් තැන්පතු හා රු.12,508,011 ක් වු ආරක්ෂිත තැන්පතු වලින් වගකීම් කාලය ඉක්මගිය තැන්පතු ආදායමට ගැනීමට හෝ අදාළ වගකීම් නිදහස් කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ඇ) විවිධ සැපයුම් හා ඉදිකිරීම් අවසානයේදී රඳවා තබාගත් රු. 4,674,305 ක් වු තැන්පතු මුදල් තුළ වසරකට වඩා පැරණි ශේෂ ඇතුළත්ව තිබු අතර ඒවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) වසරකට වඩා පැරණි ගැන්ග් නේල් තැන්පතු රු. 2,295,360 ක මුදල් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති ,රීති,රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

නීති ,රීති,රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති ,රීති,රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 104 (3) | ඉකුත් වර්ෂවල සහ සමාලෝචිත වර්ෂයේ සිදුවී තිබුණ සිද්ධීන් 07කට අදාළ පොදු 283 ආකෘතිය මගින් වාර්තා ඉදිරිපත් කිරීමේ දීර්ඝ ප්‍රමාදයන් නිරීක්ෂණය විය |
| (ii) මුදල් රෙගුලාසි. 104 (4) | වාහන අනතුරු 3 ක් සම්බන්ධයෙන් පූර්ණ වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 110 | පාඩු හා හානි ලේඛනයක් විගණිත දිනය වූ 2014 ජුලි 31 දින දක්වාම පවත්වාගෙන ගොස් නොතිබුණි |
| (iv) මුදල් රෙගුලාසි 571 (2) | භාණ්ඩ සැපයුම් කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් විසින් තැන්පත් කරන ලද වර්ෂ 2 ඉක්මවූ තැන්පතු රු.3,319,300ක් සම්බන්ධයෙන් මෙම රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ VIII වැනි පරිච්ඡේදයේ 10 වගන්තිය සහ 1997 මැයි 23 දිනැති අංක 118 (අ) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | ආයතන සංග්‍රහයේ විධිවිධානවලට වලට අනුකූල නොවන පරිදි 2013 වර්ෂයේ ජනවාරි සිට ජුනි දක්වා දැව සංස්ථාවේ විධායක නිලධාරීන් අට (08) දෙනෙකුට රු. 227,256 ක 1/20 දීමනාවක් "කරුණා සහගත ගෙවීම" ලෙස ගෙවා තිබුණි. |
| (ඇ) ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතනය මගින් 2007 උපදේශන සේවා අත්පොත | |
| (i) 2.2.1 වගන්තිය | උපදේශන ආයතනය තෝරාගැනීමට පත් කරනු ලබන තාක්ෂණික හා ඇගයීම් කමිටුව පත්කළ යුතු වන්නේ අදාළ රේඛීය අමාත්‍යාංශ ලේකම් වරයා විසින් වුවද අදාළ කමිටුව පත්කිරීමේදී මෙම උපදෙස් පිළිපැද නොතිබුණි. |

| | |
|---|---|
| (ii) 2.6.3 වගන්තිය | උපදේශන සේවා ආයතන තෝරා ගැනීමේදී කමිටු පිහිටුවීමේදී සංස්ථාව මෙකී වගන්තියෙහි උපදෙස් අනුව ක්‍රියාකර නොතිබුණි. |
| **(ඇ)** 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ | |
| ( i) 2.8.1 වගන්තිය | ප්‍රසම්පාදන කටයුතු වලදී සහ ඉදිකිරීම් කොන්ත්‍රාත් සඳහා ටෙන්ඩර් කැඳවීමට පෙර තාක්ෂණික ඇගයීම් කමිටු පත් කළ යුතු වුවද ටෙන්ඩර් කැඳවා මිල ගණන් ලැබීමෙන් පසුව සංස්ථාව විසින් ඇගයීම් කමිටුව පත්කර තිබුණි. |
| (ii) 2.8.4 වගන්තිය | i. විශාල වටිනාකම් සහිත තාක්ෂණික උපකරණ මිලදී ගැනීමේදී ඒ පිළිබඳ විශේෂඥ දැනුම ඇති බාහිර පුද්ගලයකු තාක්ෂණික ඇගයීම් කමිටුව සඳහා පත්කල යුතු වුවද සංස්ථාව විසින් එවැනි පුද්ගලයෙකු කමිටුව සඳහා පත් කර නොතිබුණි.<br><br>ii. ප්‍රසම්පාදන තාක්ෂණික ඇගයීම් කමිටුවකට සිටිය යුතු උපරිම සාමාජිකයන් සංඛ්‍යාව 05 ක් වුවද, ප්‍රසම්පාදන කටයුතු වලදී එම සීමාව ඉක්මවා සහභාගීකරගත් සාමාජිකයින් සඳහා රු.26,000 ක් ගෙවා තිබුණි. |
| (ඉ) 2009 මැයි 26 දිනැති අංක 39 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය සහ බඳවා ගැනීම් පරිපාටිය | i. චක්‍රලේඛ උපදෙස්වලට පටහැනිව සංස්ථාවේ ඉහළ කළමනාකරණ නිලධාරීන් 16 දෙනෙකු සඳහා වැටුප් වර්ධක ලබාදී 2014 අප්‍රේල් 30 දින වන විට රු.398,320ක මුදලක් ගෙවා තිබූ අතර වැඩිපුර ගෙවා තිබූ වැටුප් වර්ධක වල එකතු වටිනාකම මත ගනන් බලන ලද රු. 19,916ක් වූ සියයට 5 ක විශේෂ දීමනාවක් හා රු. 59,748 ක්වූ සියයට 15 ක දීමනාවක්ද ගෙවා තිබුණි.<br><br>ii. නිලධාරීන් දෙදෙනෙකු සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව කුසලතා මත වැටුප් වර්ධක ලබාදී ඒ වෙනුවෙන් රු. 368,200 ක් ගෙවා තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසානයේදී ආයතනයේ මෙහෙයුම් කටයුතු වලින් රු. 339,127,677 ක ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපී ඉකුත් වර්ෂයේ ශුද්ධ ලාභය රු.201,681,308 ක් වූයෙන් රු. 137,446,369 ක ශුද්ධ ලාභයේ වැඩිවීමක් පෙන්නුම් කෙරුණි. සමාලෝචිත වර්ෂයේදී භාණ්ඩාගාරයට ගෙවන ලද ගාස්තු (Levy) පෙර වර්ෂයට සාපේක්ෂව රු. මිලියන 550 කින් අඩුවී තිබීම බඳු පෙර ශුද්ධ ලාභයේ වැඩිවීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂයේ තථ්‍ය මෙහෙයුම් හා ද්‍රවශීලතා අනුපාතයන් පහත දැක්වේ.

| | | 2013 | 2012 |
|---|---|---|---|
| (අ) මෙහෙයුම් අනුපාත | | සියයට | සියයට |
| දළ ලාභ අනුපාතය | (සියයට) | 41.38 | 47.29 |
| ශුද්ධ ලාභ අනුපාතය | (සියයට) | 11.48 | 6.17 |
| (ආ) ද්‍රවශීලතා අනුපාත | | | |
| ජංගම අනුපාත | | 3: 1 | 3.74: 1 |
| ක්ෂණික අනුපාත | | 2.06: 1 | 2.75: 1 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(i) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී විකුණුම් පිරිවැටුම සියයට 11.5කින්ද දළ ලාභ අනුපාතය සියයට 5.91 කින්ද අඩුවී තිබුණි.

(ii) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී වෙනත් මෙහෙයුම් ආදායම් සියයට 19.28 කින් අඩුවී තිබුණද භාණ්ඩාගාරයට ගෙවූ ගාස්තු සියයට 91.67 කින් අඩුවී තිබීම නිසා ශුද්ධ ලාභ අනුපාතය සියයට 5.31 කින් වැඩිවී තිබුණි. භාණ්ඩාගාරයට ගෙවූ ගාස්තු ප්‍රමාණාත්මකව අඩුවීම හේතු කොටගෙන ඉකුත් වර්ෂයේදී සියයට 6.17ක් වූ ශුද්ධ ලාභ අනුපාතය සමාලෝචිත වර්ෂයේදී සියයට 11.48 දක්වා වර්ධනය වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්ය සාධනය**

සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලස්මට අනුව, සංස්ථාව විසින් ඉරු දැව අලෙවියෙන් හා සිල්පර අලෙවියෙන් පිළිවෙලින් රුපියල් මිලියන 429ක් හා රුපියල් මිලියන 825ක් වශයෙන් එකතුව රුපියල් මිලියන 1,254ක අලෙවි ආදායමක් ඉපයීමට සැලසුම් කර තිබූ නමුත් සත්‍ය අලෙවි ආදායම රුපියල් මිලියන 623ක් හෙවත් සැලසුම් කළ ආදායමෙන් සියයට 50.3ක් පමණක් විය. සංස්ථාව විසින් උපාය මාර්ගික අලෙවි වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වීම මෙන්ම තාත්වික පදනමකින් තොරව ඇස්තමේන්තු පිළියෙල කර තිබීමද මෙම තත්ත්වයට මූලිකව බලපා තිබුණි.

**4.2 මතභේදයට තුඩුදෙන ගණුදෙණු**

**(අ) රඹකැන් ඔය ජලාශයට යටවන භූමියේ දැව ඉවත් කිරීමේදී හොඳ තත්වයේ පවතින දැව දෙවන ශ්‍රේණියේ හෝ ඉන් පහළ දැව ලෙස වර්ගකර මංසල අලෙවිය සඳහා අඩු මිල ගණන් යටතේ අලෙවි කිරීම සහ රඹකැන් ඔය ව්‍යාපෘතිය අනුමත සීමාවෙන් පිටතින් ගස් කැපීම මඟින් සිදුකර තිබූ අක්‍රමිකතා හා වන අපරාධ හේතුවෙන් රජයට රු. 35,169,565 ක පාඩුවක් සිදු වී තිබුණි.**

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

**(i)** කොන්ත්‍රාත් කරුවන් රාජ්‍ය දැව සංස්ථාව සමඟ එළඹෙන ලද ගිවිසුම අනුව දැව ගබඩා සැපයීම සිදු නොකිරීම, කොන්ත්‍රාත්කරුවන්ගේ ලිඛිත ඉල්ලීම් නොමැතිව ඇතැම් අවස්ථාවල ගිවිසුම් කොන්දේසිවලට පටහැනිව කොන්ත්‍රාත්කරුවන්ගේ ඉල්ලීම් මතද මංසල මිල ගණන් පහත දැමීම සහ සංස්ථා ගබඩා වලට සැපයිය යුතු දෙවන පන්තියෙන් ඉහළ සහ විශේෂ ශ්‍රේණිවල දැව මංසල අලෙවිය සඳහා ඇති දැව ලෙස වර්ග කර අලෙවිකර තිබීම මෙම අක්‍රමිකතා වලට මූලිකව හේතු වී තිබුණි.

**(ii)** සහකාර කළමනාකරු සහ කළමනාකරු (අම්පාර) යන නිලධාරීන් විසින් කොන්ත්‍රාත්කරුවන්ට වාසිදායක වන පරිදි සාවද්‍ය ලෙස මිල අඩු කිරීම් නිර්දේශයන් ප්‍රධාන කාර්යාල නිලධාරීන්ට ලබා දී තිබුණු අතර මෙම සාවද්‍ය නිර්දේශයන් ප්‍රධාන කාර්යාල නිලධාරීන් අනුමත කර තිබීම හේතුවෙන් හොඳ තත්ත්වයේ දැව අඩු මිල ගණන් මත අලෙවි වී තිබුණි.

**(iii)** නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මෙහෙයුම් නිර්දේශකල පරිදී, වැඩ බිම්වල හු විෂමතා නොමැති බැවින් යන්ත්‍ර සූත්‍ර භාවිතා කර සංස්ථා යෝජනා ක්‍රමයක් මඟින් දැව හෙලීමට කටයුතු නොකර කොන්ත්‍රාත්කරුවන්ට වාසි වන පරිදි වැඩබිම අති දුෂ්කර ලෙස සලකා මිල ගණන් අඩු කර තිබුණි. එසේම කොන්ත්‍රාත්කරුවෙකු විසින් වැඩබිම දුෂ්කර බැවින් මංසල අලෙවියේ මිල ගණන් අඩු කරන ලෙස 2009 ජුනි 17 දින ඉල්ලීමක් කර තිබුණු අතර එම ඉල්ලීම කිරීමටත් පෙර මිල කමිටුව විසින් කොන්ත්‍රාත්කරුගේ ඉල්ලීම මත 2009 ජුනි 16 දින මිල පහත දමා තිබුණි.

**(iv)** දැව ශ්‍රේණි කිරීමේදී හොඳ තත්වයේ කඳන් හා උප ශ්‍රේණියේ කඳන් යනුවෙන් වර්ග කිරීමේදී හොඳ තත්වයට නොවැටෙන සියළුම දැව උප තත්ත්වය ලෙස ශ්‍රේණි ගත කර තිබුණි. උදාහරණ ලෙස දෝෂ සියයට 5 ක් තිබූ කඳන් හා දෝෂ සියයට 95 ක් තිබූ කඳන් යන දෙකම එකම මිලක් යටතේ අලෙවි කර තිබුණි.

**(v)** අවස්ථා හයකදී බුරුත කඳන් ගබඩා සැපයීම කළ යුතු බවට දන්වා තිබුණද එසේ කටයුතු නොකර මංසල අලෙවියට යොමු කර තිබුණි.

**(vi)** රඹකැන් ඔය ව්‍යාපෘතියේ අනුමත සීමාවට පිටතින් ගස් හෙලීම සිදුකර තිබුණ අතර මුල් අදියරේදී හෙලීම් සිදු කළ යුතු සීමාව ඉක්මවා ගස් හෙලා ඇති බවත් විශේෂයෙන්ම මොනරාගල දිස්ත්‍රික් මායිම ඉක්මවා දිගු දුරක් විවිධ වර්ගවල ගස් කපා ඇති බවත් වාරිමාර්ග ඉංජිනේරුගේ ප්‍රකාශ වලින් තහවුරු විය. අම්පාර දිස්ත්‍රික් ලේකම්වරයාගේ ප්‍රකාශය අනුව මෙය "පරිපාලන ක්‍රියාවලියකදී සිදුවූ අතපසුවීමක් නොව, හිතාමතා සංවිධානාත්මකව සිදු කල බරපතල වන අපරාධයක්" බවත්, පරිසර අමාත්‍යාංශය ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයාගේ 2011 සැප්තැම්බර් 17 දිනැති අංක 01/01/03/03/27/10 දරන වාර්තාවේ 21(1) ඡේදය අනුව " මෙම ජලාශයට යට නොවෙන සීමාවේ මෙන්ම ඉවත් කිරීමට අවසර නොතිබූ සීමාවේ කුඹුක්, බුරුත වැනි ඉහළ වටිනාකමකින් යුතු ගස් කපා ඉවත් කර තිබුණි. මෙතෙක් අවසර දි නොමැති මොනරාගල දිස්ත්‍රික් සීමාව ඉක්මවාද හෙලීම් කටයුතු කර තිබුණි."

**4.3** ආර්ථික නොවූ ගනු දෙනු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

**(අ)** 2001 වර්ෂයේ රු. 468,000 ක මූලික වියදමක් දරා සංස්ථාව විසින් බද්ධ ව්‍යාපාරයක් ආරම්භ කර රු. 30,000,000 ක් සමාගමක ආයෝජනය කර තිබුණද මේ දක්වාම කිසිදු ප්‍රතිලාභයක් සංස්ථාව වෙත ලැබී නොතිබුණි.

(ආ) උපදේශන සේවාවන් සඳහා මිල ගණන් ඉදිරිපත් කරන ලද ආයතන අතුරෙන් සුදුසු ආයතනයක් තෝරාගැනීමේදී උපදේශන සේවා මෙහෙයුම් අත්පොතෙහි සඳහන් උපදෙස් සලකා බැලීමකින් තොරව අඩුම ලංසුවට ටෙන්ඩර් ප්‍රදානය නොකිරීම හේතුකොට ගෙන සංස්ථාවට රු. 1,738,000 ක මූල්‍යමය අලාභයක් සිදුවී තිබුණි.

## 4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2011 මාර්තු 08 දිනැති අංක ඩීඑම්එස්/ඊ2/58/4/371/1/1 දරන ලිපියේ උපදෙස් වලට පටහැනිව භාණ්ඩාගාර අනුමැතිය රහිතව කළමනාකාරිත්ව පුහුණුවන්නා තනතුර සඳහා 26 දෙනෙකු බඳවා ගෙන තිබුණි. එසේම සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන් 14 දෙනෙකුද සම්මුඛ පරීක්ෂණයට කැඳවා එයින් අයදුම්කරුවන් 3 දෙනෙකු හට සම්මුඛ පරීක්ෂණයේදී ව්‍යාජ ලෙස ලකුණු ලබාදී එම තනතුරුවලට බඳවා ගෙන තිබුණි.

## 4.6 වාහන උපයෝජනය

රාජ්‍ය දැව සංස්ථාව විසින් 2012 වර්ෂයේදී රු. 9,296,000 ක් වැයකර සභාපතිවරයා වෙනුවෙන් මිලදීගෙන තිබුණු ජීප් රථයක් අවස්ථා හතරකදී (04) අනතුරු වලට භාජනය වී තිබුණ අතර එම අනතුරු හතරෙන් අනතුරු තුනක් සභාපති වරයා විසින් රිය පැදවීමේදී සිදුවී තිබුණි. සභාපති වරයා විසින් වාහනය ධාවනය කිරීමේදී සිදුවී තිබුණු අනතුරු දෙකකට අදාළ අලාභයන් පිලිවෙලින් රු.60,788 ක් හා 294,276ක් විය. එසේ වුවත් එම අලාභයන් මුදල් රෙගුලාසි ප්‍රකාරව අයකරගැනීමට කටයුතු කර නොතිබුණි. එසේම අවසන් වරට 2013 ජනවාරි 20 දින රථයට සිදුවූ අනතුර නිසා මෙම රථය දැඩිලෙස හානියට පත්ව තිබුණද එයින් සංස්ථාවට සිදු වූ අලාභය 2014 අගෝස්තු අවසානය දක්වා ගණනය කර නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 5.1 සංයුක්ත සැලැස්ම හා උපක්‍රමික සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති අංක PED 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 5.1.1 වගන්තියට පටහැනිව 2013-2017 සංයුක්ත සැලැස්ම විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේ 2013 දෙසැම්බර් 17 දින දීය.

(ආ) 2013-2017 කාලපරිච්ඡේදය ආවරණයවන පරිදි සංස්ථාවේ අරමුණු හා ඉලක්කයන් කරා ලඟාවීමට සමාලෝචිත වර්ෂය තුළදී අනුගමනය කළ යුතු උපාය මාර්ගයන් දක්වා තිබුණු නමුත් සංයුක්ත සැලැස්ම පිළියෙල කිරීම ප්‍රමාද වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා සැලසුම් කළ උපායමාර්ග ක්‍රියාත්මක කිරීමට අපොහොසත්වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වූ වැඩසටහන් 50 කින් 2013 වර්ෂයේදී ලඟා කරගත් කාර්යසාධනය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) 1957 අංක 49 දරන කාර්මික සංස්ථා පනත හා 2011 ජූනි 26 දිනැති අංක 1190/7 හා 1982 පෙබරවාරි 05 දිනැති අංක 178/10 දරන අතිවිශේෂ ගැසට් පත්‍ර මඟින් සංස්ථා කාර්යභාරය පුළුල් කිරීම යටතේ දක්වා ඇති පහත සඳහන් අරමුණු සංයුක්ත සැලැස්මෙහි අරමුණු තුළ ඇතුළත් නොවූ අතර එම අරමුණු ඉටුකර ගැනීමට සංස්ථාව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(i) කෘෂිකාර්මික නිෂ්පාදන ආරම්භ කිරීම
(ii) දැව ආශ්‍රිත නිමි හා අර්ධ නිමි නිෂ්පාදන අපනයනය කිරීම
(iii) වේවැල් ආනයනය කිරීම

## 5.2 ප්‍රසම්පාදන සැලැස්ම

පිළියෙල කරතිබූ ප්‍රසම්පාදන සැලැස්මේ තොරතුරු අය වැයගත තොරතුරු සමඟ වෙනස්කම් තිබුණු නමුත් ප්‍රසම්පාදන සැලැස්ම සමාලෝචනය කර යාවත්කාලීන කර නොතිබුණි.

## 5.3 අයවැය ලේඛනමය පාලනය

සංස්ථාව විසින් පිළියෙල කරන ලද අය වැය සහ තථ්‍ය අගයයන් අතර සියයට 4 සිට සියයට 251 දක්වා ප්‍රමාණාත්මක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අය වැය ලේඛනය ඵලදායි මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 5.4 නොවිසඳී ඇති විගණන ඡේද

බංගලාවත්ත වැපල්ටන් වාණිජ තුනී බිම් කට්ටියේ අනවසර හෙලීම් සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරු සහ සංස්ථා නිලධාරීන් සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියා මාර්ග නිර්දේශ කිරීම සඳහා පත් කරන ලද ඒකාබද්ධ කමිටුවේ වාර්තාව ලද පසුව ඉදිරි කටයුතු සිදු කරන බවට සංස්ථාවේ සභාපතිවරයා විසින් 2013 ජූනි 28 දින දන්වා සිටියද 2014 ජූලි 31 දින වන විටත් ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි.

**6. පද්ධති හා පාලන**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සංස්ථාවේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) අය වැය

(ආ) තොග පාලනය

(ඇ) ස්ථාවර වත්කම් කලමනාකරණය

(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය


(ඉ) ප්‍රසම්පාදනය

(ඊ) ගිණුම්කරණය

(උ) මානව සම්පත් කලමනාකරණය

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

වැඩ බලන විගණකාධිපති



# වාර්ෂික ගිණුම්

# විස්තිරණ ආදායම් ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන් | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|---|
| පිරිවැටුම | 2 | 2,893,651,289 | 3,269,514,359 |
| විකුණුම් පිරිවැය | 3 | (1,696,133,479) | (1,723,407,642) |
| මෙහෙයුම් මත දළ ලාභය | | 1,197,517,810 | 1,546,106,717 |
| වෙනත් ආදායම් | 6 | | |
| මෙහෙයුම් | 6.2 | 61,498,711 | 76,187,627 |
| මෙහෙයුම් නොවන | 6.1 | 258,397,070 | 217,687,637 |
| මුළු ශුද්ධ ආදායම | | 1,517,413,591 | 1,839,981,981 |
| විකුණුම් හා බෙදාහැරීමේ වියදම් | 4 | (483,276,150) | (454,741,376) |
| පරිපාලන වියදම් | 5 | (651,800,681) | (583,559,297) |
| භාණ්ඩාගාර බදුවලට පෙර ශුද්ධ ලාභය | | 382,336,761 | 801,681,308 |
| භාණ්ඩාගාරයට ගෙවූ බදු | | (50,000,000) | (600,000,000) |
| භාණ්ඩාගාර බදුවලට පසු ලාභය | | 332,336,761 | 201,681,308 |
| වර්ෂය සඳහා ආදායම් බදු | 7 | (150,222,702) | (37,029,955) |
| ආදායම් බදුවලට පසු ලාභය | | 182,114,059 | 164,651,354 |
| වෙනත් විස්තීර්ණ ආදායම් | | - | - |
| **වර්ෂය සඳහා මුළු විස්තිරණ ආදායම** | | **182,114,059** | **164,651,354** |

# මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

දෙසැම්බර් 31 දිනට

| | සටහන් | 2013 රු. | 2012 රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල, පිරියත හා උපකරණ | 8 | 906,902,528 | 708,405,958 |
| අස්පෘශ්‍ය වත්කම් | 9 | 2,237,142 | 2,839,450 |
| ජීව විද්‍යාත්මක වත්කම් | | 3,184,890 | - |
| භාණ්ඩාගාර තැන්පත් | | 2,966,000 | 2,966,000 |
| සේවක ඇප තැන්පත් | | 44,231,056 | 41,134,306 |
| ආයෝජන | 10.1 | 567,085,340 | 520,071,129 |
| පෙර ගෙවුම් සේවක ප්‍රතිලාභ | | 46,927,158 | 48,204,913 |
| විලම්භිත බදු වත්කම් | 7.2 | 33,396,804 | 51,736,743 |
| කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ | | 51,603,590 | 104,521,423 |
| මුළු ජංගම නොවන වත්කම් | | 1,658,534,509 | 1,479,879,922 |
| **ජංගම වත්කම්** | | | |
| වෙළඳ තොග | 11 | 988,883,042 | 770,970,524 |
| වෙළඳ සහ වෙනත් ණයගැතියෝ | 12 | 890,708,037 | 1,138,101,907 |
| අයකරගත හැකි ආදායම් බදු | 17 | - | 29,473,789 |
| ස්ථිර තැන්පතු වල ආයෝජන | 10.2 | 1,203,491,399 | 865,105,783 |
| මුදල් හා බැංකු ශේෂය | 13 | 70,694,647 | 125,532,889 |
| මුළු ජංගම වත්කම් | | 3,153,777,126 | 2,929,184,893 |
| **මුළු වත්කම්** | | **4,812,311,635** | **4,409,064,815** |
| **ස්කන්ධය හා බැරකම්** | | | |
| **ස්කන්ධය සහ සංචිත** | | | |
| අනුමත ප්‍රාග්ධනය | | 75,000,000 | 75,000,000 |
| දායක ප්‍රාග්ධනය | 14 | 41,503,668 | 41,503,668 |
| අයභාර සංචිත | | 3,110,175,859 | 2,935,644,568 |
| | | 3,151,679,527 | 2,977,148,236 |
| සේවක ණය චක්‍රීය අරමුදල | 15 | 225,543,133 | 218,784,628 |
| මුළු ස්කන්ධය | | 3,377,222,660 | 3,195,932,864 |
| **ජංගම නොවන බැරකම්** | | | |
| විශ්‍රාම පාරිතෝෂික අරමුදල | 16 | 340,599,947 | 367,895,815 |
| සේවක ඇප තැන්පත් | | 44,231,056 | 41,134,306 |
| මුළු ජංගම නොවන බැරකම් | | 384,831,003 | 409,030,121 |
| **ජංගම බැරකම්** | | | |
| ආදායම් බදු | 17 | 88,581,787 | - |
| ණයහිමියෝ සහ උපචිත වියදම් | 18 | 961,676,185 | 804,101,830 |
| මුළු ජංගම බැරකම් | | 1,050,257,972 | 804,101,830 |
| **මුළු බැරකම්** | | **1,435,088,975** | **1,213,131,951** |
| **මුළු ස්කන්ධය හා බැරකම්** | | **4,812,311,635** | **4,409,064,815** |

රාජ්‍ය දැව සංස්ථාවේ ක්‍රියාකාරකම් සම්බන්ධ මෙම ප්‍රකාශනය 1971 අංක 38 දරණ මුදල් පනතේ විධි විධාන වලට අනුකූලව ඉදිරිපත් කරනු ලැබේ.

සභාපති - අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්
රාජ්‍ය දැව සංස්ථාව

සාමාන්‍යාධිකාරී
රාජ්‍ය දැව සංස්ථාව

දිනය : 2014-07-07

# ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශනය

| | දායක ප්‍රාග්ධනය | සේවක ණය වක්‍රිය අරමුදල | රඳවාගත් ලාභ | එකතුව |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| 2012 ජනවාරි 01 වන දිනට ශේෂය | 41,503,668 | 208,105,464 | 2,770,993,214 | 3,020,602,346 |
| වර්ෂය තුල කරන ලද ගැලපුම් | - | 915,971 | - | 915,971 |
| වර්ෂය සඳහා මුළු විස්තිරණ ආදායම | | | 164,651,354 | 164,651,354 |
| වර්ෂය සඳහා සේවක ණය පොළිය | - | 9,763,193 | - | 9,763,193 |
| 2013 ජනවාරි 01 දිනට ශේෂය | 41,503,668 | 218,784,628 | 2,935,644,568 | 3,195,932,864 |
| වර්ෂය තුල කරන ලද ගැලපුම් | - | (824,263) | - | (824,263) |
| වර්ෂය සඳහා මුළු විස්තිරණ ආදායම | - | | 182,114,059 | 182,114,059 |
| වර්ෂය සඳහා සේවක ණය පොළිය | - | 7,582,768 | (7,582,768) | - |
| 2013 දෙසැම්බර් 31 වන දිනට ශේෂය | **41,503,668** | **225,543,133** | **3,110,175,859** | **3,377,222,660** |

# මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2013 | 2012 |
|---|---|---|
| | රු. | රු. |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය | | |
| ගනුදෙනුකරුවන්ගෙන් ලැබුනු මුදල් | 3,100,220,273 | 3,002,183,743 |
| සැපයුම්කරුවන්ට හා සේවකයින්ට ගෙවූ මුදල් | (2,692,082,754) | (2,480,260,536) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් | 408,137,519 | 521,923,207 |
| ආදායම් බදු | (13,827,187) | (216,105,005) |
| භාණ්ඩාගාරයට ගෙවූ විශේෂ බදු | (50,000,000) | (600,000,000) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | **344,310,332** | **(294,181,798)** |
| | | |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය | | |
| ස්ථාවර වත්කම් මිලදී ගැනීම | (329,685,077) | (162,337,308) |
| ජීව විද්‍යාත්මක වත්කම් සංවර්ධනය | (3,184,890) | - |
| ආයෝජන | (385,399,827) | 349,222,033 |
| ආයෝජන වලින් ලද ආදායම | 247,383,991 | 132,563,949 |
| වත්කම් විකිණීමෙන් ලද මුදල් | 9,112,038 | 4,751,835 |
| කෙරීගෙන යන වැඩ | 52,917,833 | (45,911,084) |
| සේවක ණය වක්‍රීය අරමුදල | 9,707,359 | 9,763,193 |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | **(399,148,574)** | **288,052,618** |
| | | |
| මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය | | |
| මුදල් හා මුදල් සමාන වත්කම්වල ශුද්ධ අගය වැඩිවීම | (54,838,242) | (6,129,180) |
| වර්ෂය ආරම්භයේ දී මුදල් හා මුදල් සමාන වත්කම් - සටහන 13 | 125,532,889 | 131,662,069 |
| වර්ෂය අවසානයේදී මුදල් හා මුදල් සමාන වත්කම් - සටහන 13 | **70,694,647** | **125,532,889** |

# රාජ්‍ය දැව සංස්ථාව

## ගිණුම් සඳහා සටහන්

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

01. ගිණුම්කරණ ප්‍රතිපත්ති.

1.1 වාර්තාකරණ ආයතනය

1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ, 1968, අප්‍රේල් මාසයේ දී, රාජ්‍ය දැව සංස්ථාව සංස්ථාවක් ලෙස ස්ථාපනය කරන ලදි.

1.1.1 මූල්‍ය ප්‍රකාශන සඳහා අනුමැතිය ලද දිනය

2014, ජුලි මස 07 වන දින අධ්‍යක්ෂ මණ්ඩලයේ දී සම්මත කරගන්නා ලද අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවට අනුකූලව 2013 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට අනුමැතිය ලබා දී ඇත.

1.1.2 මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ හා නිකුත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුය.

1.1.3 සේවක සංඛ්‍යාව

2013 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ සේවක සංඛ්‍යාව 2139 කි. (2012 වර්ෂයේ 2187 කි)

1.2 ඉදිරිපත් කිරීමේ පදනම

1.2.1 අනුකූලතාවය පිළිබඳ ප්‍රකාශය

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය මගින් ප්‍රකාශ කරන ලද නිර්දේශිත රීතීන් වලට හා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (ලංකා ගිණුම්කරණ ප්‍රමිත සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත) වලට අනුකූලව සංස්ථාවේ 2013 දෙසැම්බර් 31 දිනට හා එම කාලපරිච්ඡේදයෙන් අවසන් වසර සඳහා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, විස්තිරණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සමග ගිණුම් සඳහා සටහන් පිළියෙල කර ඇත.

1.2.2 අගය කිරීමේ පදනම

ඓතිහාසික පිරිවැය පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශනයන් පිළියෙල කරනු ලැබේ.

1.2.3 භාවිතා වන හා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන මුදල් ඒකකය

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර, එය සංස්ථාවේ ගනුදෙනු කරන මුදල් ඒකකය වේ. විශේෂයෙන් සඳහන් කොට නොමැති නම්, සියලුම මූල්‍ය තොරතුරු ආසන්නතම රුපියල දක්වා වටයා ඉදිරිපත් කර ඇත.

1.2.4 ඇස්තමේන්තු හා නිගමන

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකාරිත්වයට නොයෙකුත් ඇස්තමේන්තු, නිගමන හා උපකල්පන පදනම් කරගැනීමට සිදුවන අතර, ඒවා ගිණුම්කරණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී හා වාර්තා කරන වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම්වල අගයන් කෙරෙහි බලපෑම් ඇති කරවයි. ඇස්තමේන්තු සහ මූලික උපකල්පන අතීත අත්දැකීම් සහ යම් අවස්ථාවන් යටතේ සාධාරණයැයි විශ්වාස කරන විවිධ වෙනත් කරුණු මත පදනම් වී ඇත. සත්‍ය ප්‍රතිඵලය, ඇස්තමේන්තු නිගමනයන් හා තිරණවලට වඩා වෙනස් විය හැකිය. ඇස්තමේන්තු හා උපකල්පන නිරතුරුවම සමාලෝචනය කරනු ලැබේ. සංශෝධනය කරනු ලබන ගණකාධිකරණ ඇස්තමේන්තු එම ඇස්තමේන්තු සංශෝධනය කරන ලද කාලපරිච්ඡේදයට හා ඒවා බලපානු ලබන ඉදිරි කාලපරිච්ඡේද සඳහා ගලපනු ලැබේ.

1.2.5 විදේශ විනිමය ගනුදෙනු

විදේශ විනිමය ගනුදෙනු ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කරනුයේ ගනුදෙනු සිදුවූ දිනට පැවති විනිමය වටිනාකම අනුව වේ.

1.2.6 බදුකරණය

ගිණුම් ප්‍රකාශනවල වාර්තා වන ආදායම් සහ වියදම් පදනම් කරගෙන 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන සහ පසුකාලීන සංශෝධන වලට අනුකූලව ගණනය කිරීමෙන් පසුව ආදායම් බදු සඳහා වෙන්කිරීම් කර ඇත.

1.3 වත්කම් සහ වටිනාකම ගණනය කිරීම

1.3.1 දේපල, පිරියත හා උපකරණ

දේපල, පිරියත හා උපකරණ පිරිවැයෙන් සමුච්චිත ක්ෂය සහ සමුච්චිත හානිවූ වටිනාකම අඩුකර අගය කර ඇත. (ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් සාධාරණ අගය මත) වත්කම මිලදී ගැනීමේදී එය සෘජුව ආරෝපිත වියදම් දේපල, පිරියත හා උපකරණ පිරිවැයට ඇතුළත්වේ. දේපල,

පිරියත හා උපකරණවල වෙනස් කොටස්වල විවිධ ඵලදායි ජීවකාල ඇත්නම් ඒවා දේපල, පිරියත හා උපකරණවල වෙනම අයිතම ලෙස ගිණුම්ගත කරයි. සියලු දේපල, පිරියත හා උපකරණ පළමුව පිරිවැයට හඳුනාගනී. ඉඩම් හා ගොඩනැගිලිවල සාධාරණ අගය සහ ඉදිරියට ගෙනඑන ලද අගය අතර සැලකියයුතු වෙනසක් ඇත්නම් ඒවා වෘත්තිය සුදුසුකම්ලත් තක්සේරුකරුවන් විසින් ප්‍රත්‍යාගණනය කරනු ලබයි. දේපල, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කරන විට මුළු වත්කම් පන්තියම ප්‍රත්‍යාගණනය කරනු ලැබේ. ප්‍රත්‍යාගණනයෙන් වැඩිවන වත්කම්වල ඉදිරියට ගෙනඑන ලද වටිනාකම ප්‍රත්‍යාගණන සංචිත ගිණුමට බැර කරනු ලැබේ.

වත්කම් ප්‍රත්‍යාගණනය නිසා උද්ගත වන වටිනාකම් අඩුවීම් එම වත්කමේ පෙර අවස්ථාවකදී කරන ලද වත්කම් ප්‍රත්‍යාගණනය නිසා උද්ගත වූ වටිනාකම් වැඩිවීම ඇතුළත් ප්‍රත්‍යාගණන සංචිතයට හිලව්කරනු ලැබේ. අනෙක් සෑම වටිනාකම් අඩුවීමක් ම විස්තිරණ ආදායම් ප්‍රකාශනයට ගැලපීම් කරනු ලැබේ.

1.3.2 වත්කම් විකිණීමෙන් ඇති වූ ලාභ/අලාභ

වත්කම් විකිණීමෙන් ඇති වන ලාභයක් හෝ අලාභයක් (ශුද්ධ විකිණීමේදී ලැබීම් හා වත්කමේ ධාරණ වටිනාකමේ වෙනස ලෙස ගණනය කරන ලද) වත්කම විකුණනු ලබන වර්ෂයේ ආදායම් ප්‍රකාශනයේ වෙනත් මෙහෙයුම් ආදායම්/වියදම් යටතේ දක්වනු ලබයි.

1.3.3 පසු පිරිවැය

ස්ථාවර ස්වභාවයෙන් ව්‍යාපාරය පවත්ගෙන යාමට හෝ ව්‍යාපාරයේ ඉපැයුම් ධාරිතාව වර්ධනය කිරීම සඳහා වත්කම් පවරාගැනීම, දීර්ඝ කිරීම හෝ වැඩි දියුණු කිරීම සඳහා වැයවන පසු වියදම්, ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලබන අතර, එවැනි වියදම් වත්කමේ ඉදිරියට ගෙනයනු ලබන වටිනාකමෙන් හඳුනාගැනේ. එමෙන්ම දේපල හා උපකරණවල එදිනෙදා නඩත්තු පිරිවැය ආදායම් ප්‍රකාශනයෙන් යෙදවූ වටිනාකම් ලෙස හඳුනාගැනේ.

1.3.4 ඉවත් කිරීම්

දේපල, පිරියත හා උපකරණ ඉවත් කිරීමේදී හෝ ඒවා පාවිච්චි කිරීම තුළින් ඉදිරි ප්‍රතිලාභයක් අත්නොවන විට ඒවායේ ඉදිරියට ගෙනඑන ලද වටිනාකම ගිණුම් වලින් ඉවත් කරනු ලැබේ. මෙසේ වත්කම් ඉවත් කිරීමේදී උද්ගත වන ලාභ හෝ පාඩු විස්තිරණ ආදායම් ප්‍රකාශනයට ගලපනු ලබන අතර, ලාභ ආදායමක් ලෙස සලකනු නොලැබේ.

1.3.5 ක්ෂයවීම

දේපල, පිරියත හා උපකරණවල සියලුම අංගයන් එහි ඇස්තමේන්තුගත ඵලදායි ජීව කාලය පුරා සරල රේඛීය පදනම මත විස්තිරණ ආදායම් ප්‍රකාශනයට කපාහරිනු ලබයි. ඉඩම් ක්ෂය නොකරනු ලබන අතර, අදාල ක්ෂය කිරීම් අනුපාත පහත පරිදි වේ.

| | |
|---|---|
| ස්ථිර ගොඩනැගිලි | 2.5% |
| අර්ධ ස්ථිර ගොඩනැගිලි | 30% |
| යන්ත්‍රෝපකරණ | 10% |
| වාහන | 20% |
| මාර්ග හා දුම්රිය මාර්ග | 5% |
| බදු ඉඩම් | 5% |
| මාර්ග ඉදිකිරීම් | 10% |
| ගෘහභාණ්ඩ හා සවිකිරීම් | 15% |
| කාර්යාල උපකරණ | 15% |
| විවිධ වත්කම් | 20% |
| පරිගණක | 20% |

වනසංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් සංස්ථාව වෙත පවරාගෙන ඇති ඉඩම් පැහැදිලි ඔප්පු නොමැතිකම නිසා ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතින්ට අනුව ප්‍රත්‍යාගණනය කර නොමැති අතර, ඉදිරියේදී එම ඉඩම් සඳහා තක්සේරු වාර්තා ලබාගෙන ප්‍රත්‍යාගණන කටයුතු කරනු ඇත

1.3.6 අස්පෘෂ්‍ය වත්කම්

අස්පෘෂ්‍ය වත්කම්වලට පරිඝනක මෘදුකාංග මිලදීගැනීම සඳහා වැය වූ පිරිවැය ඇතුලත් වේ. එමෙන්ම මෙවැනි අස්පෘෂ්‍ය වත්කම් හඳුනාගනු ලබන්නේ එහි පිරිවැය විශ්වාසදායි ලෙස මැනිය හැකිනම් සහ එහි අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ සංස්ථාව වෙත ලැබීමේ ප්‍රවණතාවයක් පවතී නම් පමණි. අස්පෘෂ්‍ය වත්කම් පිරිවැයෙන්, සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හානි වූ වටිනාකම් අඩුකර වටිනාකම අගය කර ඇත. විශේෂිත වත්කමකට අදාලව පසුව දරනු ලබන වියදම් ප්‍රාග්ධනීත කරනු ලබන්නේ එම වියදම් දැරීම හේතුවෙන් අදාල වත්කමෙහි අනාගත ආර්ථික ප්‍රතිලාභ වර්ධනයට එය පිටුවහලක් වන්නේ නම් පමණි. ක්‍රමක්ෂය සරල රේඛීය පදනම මත ඇස්තමේන්තු ගත පස් අවුරුදු ජීව කාලය පුරා කපාහරිනු ලබයි.

1.3.7 ජීව විද්‍යාත්මක වත්කම්

"ජීව විද්‍යාත්මක වත්කම්" පරිණත ජීව විද්‍යාත්මක වත්කම් සහ අපරිණත ජීව විද්‍යාත්මක වත්කම් ලෙස වර්ගීකරණය කර ඇත. පරිණත ජීව විද්‍යාත්මක වත්කම් ගණයට අයත් වන්නේ ඵලදාව නෙලාගන්නා මට්ටමට පත්ව ඇති හෝ නිරන්තර ඵලදාව ලැබෙන තත්වයට පත්ව ඇති අයිතමයන් ය. අපරිණත ජීව විද්‍යාත්මක වත්කම් ලෙස සැලකෙන්නේ ඵලදාව නෙලාගන්නා තත්වයට පත් නොවූ අයිතමයන්ය. තේ, රබර්, අනිකුත් වැවිලි සහ තවාන් ජීව විද්‍යාත්මක වත්කම් ලෙස වර්ගීකරණය කර ඇත. ජීව විද්‍යාත්මක වත්කම් ඵලදරන ජීව විද්‍යාත්මක වත්කම් සහ පරිභෝජනමය ජීව විද්‍යාත්මක වත්කම් ලෙස වර්ගීකරණය කෙරෙන ඵලදරන ජීව විද්‍යාත්මක වත්කම් විකිණීම සඳහා හෝ නෙලාගැනීම සඳහා තබා නොගන්නා ඒවා වන අතර, එම අයිතමයන් කෘෂිකාර්මික නිෂ්පාදනයන් ලබාගැනීමේ පරමාර්ථයෙන් සංවර්ධනය කරනු ලැබේ. පරිභෝජනයම ජීව විද්‍යාත්මක වත්කම් ගණයට දැව ලබාගැනීමට පාලනය කරනු ලබන ගස් මෙන්ම ජීව විද්‍යාත්මක වත්කම් වලින් ඵලදාව නෙලාගන්නා ලද කෘෂිකාර්මික නිෂ්පාදන මෙන්ම ජීව විද්‍යාත්මක වත්කම් වශයෙන් විකුණනු ලබන අයිතමයන් අයත්වේ. අතීත සිද්ධියක ප්‍රතිඵලයක් සේ ආයතනය ඒවා වර්තමානයේ දී පාලනය කරනු ලබන විට හා එම අයිතමයන් සමඟ බැඳුනු අනාගත ආර්ථික ප්‍රතිලාභයන් ව්‍යාපාරය තුළට ජනනයවීම භව්‍ය වන්නේ නම් හා ඒවායේ පිරිවැය හෝ සාධාරණ අගය විශ්වසනීය පරිදි මැණිය හැකිවන විට ජීව විද්‍යාත්මක වත්කම් ආයතනය විසින් හඳුනාගනී. දැව ලබාගැනීමට පාලනය කරන ගස් මුල්වරට හඳුනාගන්නා අතර, සෑම වාර්තාකරණ කාලච්ඡේදයක් අවසානයේදීම ශ්‍රී.ල.ගි.ප්‍ර 41 ප්‍රකාරව ඒවා සාධාරණ අගයෙන් විකිණීම සඳහා යන පිරිවැය අඩු කළ පසු ලැබෙන අගයට නිරූපණය කෙරේ. ජීව විද්‍යාත්මක පරිණාමය සඳහා මෙම කාලච්ඡේදය තුලදී දැරීමට සිදුවන පිරිවැය ප්‍රමාණාත්මක නොවන හෙයින්, ළපටි වැවිලි වල පිරිවැය ඒවායේ සාධාරණ අගයට සමාන ලෙස සලකා ඇත.

1.3.8 නොනිමි වැඩ

ගිණුම් වර්ෂය තුලදී සම්පූර්ණ කරගත නොහැකි වූ ප්‍රාග්ධන ආයෝජනවලට අදාල ප්‍රාග්ධන වියදම් අදාල වර්ෂයේ නොනිමි වැඩ යටතේ දක්වා ඇති අතර, වැඩ සම්පූර්ණ වී පරිහරණයට සුදුසු තත්වයට පැමිණි පසු ඒවා දේපල පිරියත හා උපකරණ යටතේ දක්වනු ලැබේ.

1.3.9 ආයෝජන

1.3.9.1 දිගුකාලීන ආයෝජන පිරිවැය මත සඳහන් කර ඇත.

1.3.9.2 රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවෙහි ආයෝජන

මෙම ආයෝජනයන් සිදුකර ඇත්තේ රාජ්‍ය දැව සංස්ථාවේ සේවකයින්ට නිවාස ණය පහසුකම් සැලසීම සඳහාය.

1.3.9.3 ලංකා ටිම්බර් ප්ලාන්ටේෂන් ඉන්ඩස්ට්‍රීස් සමාගමේ ආයෝජන

මෙම ආයෝජනයෙන් කිසිඳු ලාභාංශයක් ලැබී නොමැත. තවද, ආයෝජනය කර ඇති රුපියල් මිලියන 30ක මුදල නැවත ලබාගැනීම ද අවිනිශ්චිතය.

1.3.10 ජංගම වත්කම්

මූල්‍ය තත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් ලෙස දක්වා ඇත්තේ මුදල් හා බැංකු ශේෂවලට අමතරව සාමාන්‍ය මෙහෙයුම් කාලය තුළ හෝ මූල්‍ය තත්ව ප්‍රකාශන දින සිට වර්ෂයක් තුළ යන දෙකෙන් අඩු කාලයක් තුළ උපලබ්ධි වේයැයි අපේක්ෂා කරන වත්කම්ය.

1.3.11 ණයගැතියෝ සහ අයවියයුතු දෑ

ණයගැතියෝ සහ අනෙකුත් අයවියයුතු දෑ ඒවා උපලබ්ධිවීමට අපේක්ෂිත වටිනාකම් වලින් ප්‍රකාශ කරනු ලැබේ. බොල්ණය කපාහරිනු ලබන අතර ණයගැතියන්ගෙන් වියහැකි පාඩු ආවරණය සඳහා පහත සඳහන් පරිදි අඩමාන ණය සඳහා ප්‍රතිපාදන වෙන්කර ඇත.

විශේෂ ප්‍රතිපාදන :-

අවුරුදු 5 ට වැඩි වෙළෙඳ ණයගැතියන් සඳහා 100%

සාමාන්‍ය ප්‍රතිපාදන :-

අවුරුදු 5 ට අඩු වෙළෙඳ ණයගැතියන් සඳහා 5%

1.3.12 වෙළෙඳ තොග

වෙළෙඳ තොග අගයකරනු ලැබ ඇත්තේ පිරිවැය හෝ ඇස්තමේන්තුගත ශුද්ධ

උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට ය. පිරිවැය නිගමනය කරනු ලබන්නේ ප්‍රථමයෙන් ලැබීම්, ප්‍රථමයෙන් නිකුත් කරන පදනමට වන අතර පිරිවැයට, බඩුතොග ප්‍රවර්තන තත්වයට හා ස්ථානයට ගෙනඒමට දරන ලද සියලු වියදම් ඇතුලත්ය. නිෂ්පාදන සම්බන්ධයෙන් මේ වනවිටදි පිරිවැයට සියලු ඍජු වියදම් ද සාමාන්‍ය ක්‍රියාකාරී මට්ටම මත පදනම් වන නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය ද ඇතුළත් ය. අවශ්‍ය අවස්ථාවන් හිදි යල්පැනගිය, සෙමින් අලෙවි වන හා දෝෂ සහිත බඩුතොග සඳහා ප්‍රතිපාදන සලසා ඇත. තොග හානිවීම් සඳහා 15% ක සාමාන්‍ය ප්‍රතිපාදනයක් සලසා ඇත.

1.4 වගකීම් හා ප්‍රතිපාදන

මූල්‍ය තත්ව ප්‍රකාශයේ ජංගම වගකීම් යටතේ ගැනෙනුයේ ඉල්ලූ වහා ගෙවිය යුතු ගෙවීම් හෝ මූල්‍ය තත්ව ප්‍රකාශන දින සිට වසරක් තුළ ගෙවිය යුතු ගෙවීම්ය. ජංගම නොවන වගකීම් ලෙස ගැනෙනුයේ මූල්‍ය තත්ව ප්‍රකාශන දින සිට වසරකට වැඩිකාලයක් තුළ ගෙවිය යුතු ගෙවීම්ය. මූල්‍ය ප්‍රකාශනවල සියලුම හඳුනාගෙන ඇති වගකීම් ගිණුම්ගත කර ඇත.

1.4.1 විශ්‍රාම පාරිතෝෂිකය

1983 අංක 12 දරන විශ්‍රාම පාරිතෝෂික පනත අනුව අඛණ්ඩව වර්ෂ 05කට වඩා වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවකයින් විශ්‍රාම පාරිතෝෂික සඳහා හිමිකම් ලබයි. කෙසේ වෙතත් සියලුම සංස්ථා සේවකයින් වෙනුවෙන් වර්ෂ 2013 දෙසැම්බර් 31 දිනට අවසන්කර ඇති සේවා කාලය හා අවසන්වරට ලැබූ වැටුප පදනම් කරගෙන සේවක විශ්‍රාම පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන වෙන්කර ඇත. අනාගතයෙහි ගෙවීමට සිදුවිය හැකි වගකීම් ගෙවීමේ පහසුව සඳහා මහජන බැංකුවේ ස්ථිර තැන්පතු ගිණුමක මුදල් ආයෝජනය කර ඇත.

1.4.2 වෙළඳ හා අනෙකුත් කටයුතු සඳහා ගෙවීම්

අදාල පිරිවැය අනුව සඳහන් කර ඇත.

1.4.3 අසම්භාව්‍ය වගකීම්

මුදලින් මැනිය හැකි සියලුම වගකීම් සඳහා ප්‍රතිපාදන සලසා ඇති අතර, අනෙකුත් වගකීම් හෙළිදරව් කර ඇත.

ආනයනය කල ක්‍රියෝසෝට් තෙල්වල දෝෂ තත්වයක් සම්බන්ධයෙන් සැපයුම්කරු සමග මතභේදයක් ඇති අතර, එම මතභේදය හේතුවෙන් ඇ.ඩො 54,490.51 ක මුදලක් ණයවර ලිපියේ සඳහන් මුදලින් නිදහස් කර නැත. මෙම මතභේදය නිරවුල් වනතෙක් බැංකුව මගින් අදාල මුදල් රඳවාගෙන ඇත.

බගවන්තලාව වැපල්ටන් වාණිජ තුනී කිරීම් බිම් කට්ටියේ අනවසර හෙළීම් නිසා රජයට පාඩු සිදුවූ බවට දන්වන ලද අතර, පරීක්ෂණවලදී හෙළිදරව් වූ සමහර කරුණු හේතුවෙන් තවමත් නිශ්චිත නිගමනයකට එළඹිය නොහැකි බැවින් සංස්ථාවේ නිලධාරීන් සමග එක්ව එම කරුණ සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්විය යුතු බවට වනසංරක්ෂණ ජෙනරාල්තුමා තිරණය කොට ඇත.

වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය දැව සංස්ථාවට එරෙහිව දෙහිඅත්තකණ්ඩිය මහේස්ත්‍රාත් උසාවියට රඹකැන්ඔය ජලාශයට යටවන භූමියේ දැව ඉවත් කිරීමේ දි සිදුවූ අක්‍රමිකතා හේතු කොට ගෙන “බී” වාර්තාවක් ඉදිරිපත් කරන ලද නමුත් සංස්ථාව විසින් නිතිපති දෙපාර්තමේන්තුවට තත්වය පිළිබඳ කරුණු ඉදිරිපත් කරන ලදි. මේ වනතෙක් නිතිපති දෙපාර්තමේන්තුව විසින් නඩුවක් ගොනුකර නොමැත.

1.5 විස්තිරණ ආදායම් ප්‍රකාශනය

විස්තිරණ ආදායම් ප්‍රකාශනය සකස්කර ඉදිරිපත් කිරිම සඳහා කාර්යයන්ට අනුව වියදම් වර්ගිකරණ ක්‍රමය භාවිතා කර ඇත. එසේ කර ඇත්තේ එයින් සංස්ථාවේ කාර්යසාධනය ලෙස පිළිබිඹු වන බැවිනි. උපචිත පදනම අනුව ආදායම් හා වියදම් හඳුනාගෙන ඇත.

1.5.1 ආදායම් හඳුනාගැනීම

දැව විකිණීමෙන් ලද ආදායම ගණනය කර ඇත්තේ දැව විකිණීමෙන් ලැබුණු හෝ ලැබිය යුතු මුදල, වෙළඳ වට්ටම් සහ ප්‍රමාණ සඳහා දෙනුලබන සහන ආදිය සැලකිල්ලට යොමුකිරීමෙන් සාධාරණ වටිනාකම් පදනමටය. රාජ්‍ය දැව සංස්ථාවේ සහ වනසංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සේවකයින් හට 25% ක සහනදායී මිලක් යටතේ දැව නිකුත් කරන අතර, එම වියදම් සුභසාධක පහසුකම් වැය ශිර්ෂය යටතේ ගිණුම්ගත කර ඇත.

1.5.2 වියදම් හඳුනාගැනීම

වර්ෂය තුළ ලබා ඇති ලාභය ගණන් බැලීමේදි වසර තුළ ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා දරන ලද සියලුම වියදම් ආදායමෙන් අඩුකර ඇත. අළුත්වැඩියා සහ නවීකරණයට

අදාල වියදම් එය දැරූ වර්ෂයේ විස්තිරණ ආදායම් ප්‍රකාශනයට හර කර ඇත.

1.5.2.1 ආදායම් බදු

ප්‍රවර්තන හා විලම්භිත බදු වලින් ආදායම් බදු සමන්විත වේ. ස්කන්ධයෙන් හෝ වෙනත් විස්තිරණ ආදායම් තුලින් සෘජුව හඳුනාගන්නා අයිතම වලට අදාල ප්‍රමාණය හැර ප්‍රවර්තන හා විලම්භිත බදු වියදම් විස්තිරණ ආදායම් ප්‍රකාශනය මගින් හඳුනාගනී.

වාර්තා කරන දිනට බලපවත්වන බදු අනුපාත හා පූර්ව වාර්ෂය වෙනුවෙන් කරන ලද වෙන්කිරීම් උපයෝගි කරගෙන, වර්ෂයේ බදු ආදායම හෝ අලාභය මත ගෙවිය යුතු හෝ ලැබිය යුතු අපේක්‍ෂිත බදු මුදල ප්‍රවර්තන බදු ලෙස හඳුනා ගනී.

මූල්‍ය වාර්තාකරණය සඳහා වත්කම් හා වගකීම්වල ඉදිරියට ගෙන ආ ශේෂය සහ බදු මුදල අතර තාවකාලික වෙනස ලබාගැනීම සඳහා වගකීම් ක්‍රමය භාවිතය මගින් විලම්භිත බදු මුදල ගණනය කෙරේ. මූල්‍ය තත්වය ප්‍රකාශන දිනට බලපවත්වන බදු අනුපාත භාවිතයෙන් වත්කම් හා වගකීම්වල ඉදිරියට ගෙන ආ නිරවුල් කළ යුතු ශේෂය හෝ අපේක්‍ෂිත උපලබ්ධි මුදල මත පදනම්ව විලම්භිත බදු මුදල ගණනය කෙරේ.

අනාගත වත්කම්වල පරිභෝජනයට ගතහැකි අගයට එරෙහිව අනාගතයේ දී බදු ලාභයක් ලැබීමේ සම්භාවිතාවයක් පවතී නම් එම ප්‍රමාණයට පමණක් විලම්භිත බදු වත්කම හඳුනාගැනේ. වත්කමට අදාල බදු ප්‍රතිලාභය තවදුරටත් ලබාගත නොහැක්කේ නම් එම ප්‍රමාණයට විලම්භිත බදු වත්කම පහත හෙලනු ලැබේ.

1.5.2.2 ස්කන්ධභාග ගෙවීම

2013 වසර සඳහා ස්කන්ධභාගය ගණනය කර ඇත්තේ හෙලා ඇති දැව පරිමාව අනුවය.

1.5.2.3 පිරිවැය වෙන් කිරීම.

දැව භුවමාරු අගය මත දැව පිරිවැය හා දැව ඉරුම්හල්වල පරිවර්තන පිරිවැය බෙදාවෙන් කරනු ලබන අතර, අදාල ඒකකය වෙත ප්‍රවාහනය කිරීමේ කුලි අගය මත යාන්ත්‍රික වැඩපොලේ පිරිවැය වෙන්කරනු ලබයි.

1.5.3 මූල්‍ය තත්ව ප්‍රකාශන දිනට පසුව සිදුවීම්

මූල්‍ය තත්ව ප්‍රකාශනය සකස් කළ දිනයට පසුව පැනනැගී සියලු සැලකිය යුතු සිද්ධීන් සැලකිල්ලට ගෙන, මූල්‍ය ප්‍රකාශවල අදාල සටහන් යටතේ නිසි ගැලපීම් හෝ අනාවරණය කිරීම් සිදුකර ඇත.

1.6 සේවක ණය චක්‍රිය අරමුදල

මෙම අරමුදල නිර්මාණය කොට ඇත්තේ සංස්ථාවේ සේවකයන්ට ණය ලබාදීමේ අරමුණිනි. සේවක ණයපොලී ආදායම වෙනත් ආදායම් යටතේ විස්තිරණ ආදායම් ප්‍රකාශනයෙහි දක්වා, ආදායම් බදු අඩුකිරීමෙන් පසු ශුද්ධ පොලී ආදායම සේවක ණය චක්‍රිය අරමුදලට මාරු කරනු ලැබේ. මෙමගින් සේවක ණය චක්‍රිය අරමුදල ගොඩනැංවෙන අතර, එමගින් ණය ලබාදීම අරමුදලේ ඇති මුදල් ප්‍රමාණයට සීමාවේ.

1.7 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සම්බන්ධ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සෘජු ක්‍රමයට අනුව පිළියෙල කර ඇත. මුදල් සහ මුදල් වලට සමාන වත්කම්වලට වටිනාකම වෙනස්වීමේ අවධානමට යටත්ව ඉක්මණින් මුදල් වලට මාරුකර ගතහැකි ඉහළ ද්‍රවශීලිතාවයක් ඇති කෙටිකාලීන ආයෝජන ඇතුලත් වේ. මුදල් සහ මුදල් සමාන වත්කම් වලට අතැති මුදල්, බැංකු ශේෂ සහ බැංකුවල ඇති කෙටිකාලීන තැන්පතු ඇතුළත් වේ.

| 02. පිරිවැටුම | 2013 | 2012 |
|---|---|---|
| | රු. | රු. |
| කඳන්-රජයේ ඉඩම් වලින් ලද | 1,557,424,218 | 1,746,652,321 |
| කඳන්-පුද්ගලික ඉඩම් වලින් ලද | 8,242,305 | 25,253,058 |
| ඉරුෑ දැව | 170,298,367 | 205,378,107 |
| සිල්පර-පුද්ගලික ඉඩම් වලින් ලද | 218,085,380 | 94,220,880 |
| සිල්පර -රජයේ ඉඩම් වලින් ලද | 234,746,032 | 649,355,187 |
| විදුලි කණු-රජයේ ඉඩම් වලින් ලද | 208,271,838 | 246,099,640 |
| විදුලි කණු-පුද්ගලික ඉඩම් වලින් ලද | 4,511,925 | 14,542,820 |
| අලි වැට කණු | 86,554,236 | 62,338,327 |
| වෙනත් | 24,707,962 | 28,847,923 |
| වන අපරාධ දැව | 39,668,133 | 26,697,383 |
| රජයේ ඉඩම් වල පරිත්‍යාග දැව | 201,425,749 | 105,927,554 |
| ගෘහභාණ්ඩ | 198,529,090 | 129,648,584 |
| දළ පිරිවැටුම | 2,952,465,235 | 3,334,961,784 |
| ජාතිය ගොඩනැගීමේ බදු | (58,716,558) | (65,163,299) |
| විකුණුම් කොමිස් | (97,388) | (284,126) |
| එකතුව | 2,893,651,289 | 3,269,514,359 |

| 03. විකුණුම් පිරිවැය | 2013 | 2012 |
|---|---|---|
| | රු. | රු. |
| දැව ගබඩා සහ මංසල ගබඩා | 723,341,531 | 703,426,840 |
| දැව පරිරක්ෂණාගාර | 604,406,762 | 715,799,997 |
| ගෘහභාණ්ඩ යන්ත්‍රාගාර | 146,648,802 | 105,398,942 |
| මංසල විකුණුම් | 221,736,385 | 198,781,863 |
| එකතුව | 1,696,133,479 | 1,723,407,642 |

| 04. විකුණුම් හා බෙදාහැරීමේ වියදම් | 2013 | 2012 |
|---|---|---|
| | රු. | රු. |
| ගබඩා | 447,048,227 | 432,308,448 |
| දැව පරිරක්ෂණාගාර | 9,821,782 | 190,050 |
| ගෘහභාණ්ඩ යන්ත්‍රාගාර | 17,261,135 | 14,324,490 |
| ප්‍රාදේශීය කළමනාකාර කාර්යාල හා ප්‍රධාන කාර්යාලය | 9,145,006 | 7,918,388 |
| එකතුව | 483,276,150 | 454,741,376 |

| 05. පරිපාලන වියදම් | 2013 | 2012 |
|---|---|---|
| | රු. | රු. |
| දැව පරීක්ෂණාගාර | 22,184,888 | 29,515,865 |
| ගෘහභාණ්ඩ යන්ත්‍රාගාර | 24,573,880 | 20,532,566 |
| ප්‍රාදේශීය කළමනාකාර කාර්යාල හා ප්‍රධාන කාර්යාලය | 597,934,435 | 529,432,952 |
| සංචාරක බංගලා | 7,107,478 | 4,077,914 |
| **එකතුව** | **651,800,681** | **583,559,297** |

| 06. වෙනත් ආදායම් | 2013 | 2012 |
|---|---|---|
| | රු. | රු. |
| 6.1 මෙහෙයුම් නොවන ආදායම් සටහන 6.3 | | |
| පොළී ආදායම - ආයෝජන | 226,670,712 | 200,306,818 |
| විදේශ විනිමය හුවමාරු ලාභ/(අලාභ) | 4,723 | 2,226,331 |
| ගොඩනැගිලි කුලිය | 14,991,686 | 15,154,488 |
| පාරිතෝෂික අධි වෙන්කිරීම් | 6,198,327 | - |
| සේවක ණය පොළිය | 10,531,622 | - |
| | 258,397,070 | 217,687,637 |
| 6.2 මෙහෙයුම් ආදායම් සටහන 6.3 | | |
| විවිධ ආදායම් | 38,025,841 | 60,105,414 |
| දඩ-කොන්ත්‍රාත්කරුවන්ගෙන් සහ සැපයුම්කරුවන්ගෙන් | 543,947 | 1,235,994 |
| තොග හානි සඳහා අධි වෙන්කිරීම් | 10,046,557 | 10,802,317 |
| අඩමාන ණය අධි වෙන්කිරීම් | 9,894,147 | 1,378,584 |
| ඌණතා සහ පාඩු සඳහා අයකිරීම් | 1,000,453 | 1,145,652 |
| ආපසු නොගෙවන ටෙන්ඩර් තැන්පත් | 1,987,765 | 1,519,666 |
| | 61,498,711 | 76,187,627 |
| **එකතුව** | **319,895,781** | **293,875,264** |

## 6.3 වෙනත් ආදායම් විශ්ලේෂණය 2013

| ආදායම් මූලාශ්‍ර | ඒකක | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | අලෙවි ගබඩා | දැව පදම් කිරීමේ ඒකක | ගෘහ භාණ්ඩ නිෂ්පාදන ඒකක | ප්‍රාදේශීය කාර්යාල හා ප්‍රධාන කාර්යාලය | සංචාරක බංගලා | දැව පිරිවැය | දැව ඉරුම්හල් | එකතුව |
| මෙහෙයුම් නොවන ආදායම් | | | | | | | | |
| පොළී ආදායම - ආයෝජන | - | - | - | 226,670,712 | - | - | - | 226,670,712 |
| විදේශ විනිමය හුවමාරු ලාභ/(අලාභ) | - | - | - | 4,723 | - | - | - | 4,723 |
| ගොඩනැගිලි කුලිය | - | - | - | 14,991,686 | - | - | - | 14,991,686 |
| පාරිතෝෂික අධි වෙන්කිරීම් | 2,660,942 | 118,219 | 685,688 | 1,515,478 | - | 628,445 | 589,555 | 6,198,327 |
| සේවක ණය පොළිය | - | - | - | 10,531,622 | - | - | - | 10,531,622 |
| | 2,660,942 | 118,219 | 685,688 | 253,714,221 | - | 628,445 | 589,555 | 258,397,070 |
| මෙහෙයුම් ආදායම් | | | | | | | | |
| විවිධ ආදායම් | 30,331 | 105 | - | 37,204,518 | 790,887 | - | - | 38,025,841 |
| දඩ-කොන්ත්‍රාත්කරුවන්ගෙන් සහ සැපයුම්කරුවන්ගෙන් | - | - | - | 543,947 | - | - | - | 543,947 |
| තොග හානි සඳහා අධි වෙන්කිරීම් | 8,856,052 | 1,136,872 | 53,632 | - | - | - | - | 10,046,557 |
| අඩමාන ණය අධි වෙන්කිරීම් | 380,313 | 9,478,515 | 35,319 | - | - | - | - | 9,894,147 |
| ඌණතා සහ පාඩු සඳහා අයකිරීම් | - | - | - | 1,000,453 | - | - | - | 1,000,453 |
| ආපසු නොගෙවන ටෙන්ඩර් තැන්පත් | - | - | - | 1,987,765 | - | - | - | 1,987,765 |
| | 9,266,696 | 10,615,492 | 88,951 | 40,736,684 | 790,887 | - | - | 61,498,711 |
| | | | | | | | | |
| එකතුව | 11,927,639 | 10,733,711 | 774,640 | 294,450,905 | 790,887 | 628,445 | 589,555 | 319,895,781 |

| 07. ආදායම් බදු | | 2013 | 2012 |
|---|---|---|---|
| | | රු. | රු. |
| ප්‍රවර්තන බදු වියදම | | | |
| ප්‍රවර්තන වර්ෂය සඳහා ආදායම් බදු | සටහන 7.1 | 131,882,763 | 88,766,698 |
| පෙර වර්ෂය සඳහා අධි/ඌණ වෙන්කිරීම් | | - | - |
| | | 131,882,763 | 88,766,698 |
| විලම්භිත බදු වියදම් | සටහන 7.2 | | |
| තාවකාලික වෙනස්වීම් වල ප්‍රවර්ථනය හා මුලාරම්භය | | 18,339,939 | (51,736,743) |
| | | 18,339,939 | (51,736,743) |
| **වර්ෂය සඳහා බදු අයකිරීම්** | | **150,222,702** | **37,029,955** |

| 7.1 ප්‍රවර්තන වර්ෂයේ ලාභය සඳහා ආදායම් බදු | 2013 | 2012 |
|---|---|---|
| | රු. | රු. |
| බදු පෙර ලාභය | 332,336,761 | 201,681,308 |
| සමාහාර ඉඩනොදෙන වියදම් | 103,786,686 | 126,099,101 |
| සමාහාර ඉඩදෙන වියදම් | (445,416,409) | (362,866,281) |
| ව්‍යාපාරික ලාභය | (9,292,962) | (35,085,872) |
| ව්‍යාපාරික නොවන ආදායම | 241,667,121 | 217,687,637 |
| බදු අයකල හැකි ආදායම | 232,374,159 | 182,601,765 |
| ආදායම් බද්දෙන් 28% | 65,064,764 | 51,128,494 |
| බෙදාහැරිය හැකි ලාභය මත ලාභාංශ බදු | 66,817,999 | 37,638,204 |
| **එකතුව** | **131,882,763** | **88,766,698** |

| 7.2 විලම්භිත බදු | තාවකාලික වෙනස | බදු බලපෑම (වත්කම්/වගකීම්) |
|---|---|---|
| | රු. | රු. |
| 2013 ජනවාරි 1 වන දිනට ශේෂය | (184,774,082) | (51,736,743) |
| වසර තුළ උත්පාදනය වූ මුදල | 65,499,781 | 18,339,939 |
| 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය | (119,274,301) | (33,396,804) |
| | | |
| දේපළ, පිරියත හා උපකරණ වල තාවකාලික වෙනස | 221,325,646 | 61,971,181 |
| විශ්‍රාම පාරිතෝෂික අරමුදලේ තාවකාලික වෙනස | (340,599,947) | (95,367,985) |
| ඉදිරියට ගෙන ආ බදු අලාභය | - | - |
| **2013 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **(119,274,301)** | **(33,396,804)** |

## 08. දේපළ, පිරියත හා උපකරණ

| විස්තරය | පිරිවැය | | | | ක්ෂයවීම් | | | | 2013.12.31 දිනට ඉදිරියට ගෙන එන ලද වටිනාකම |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 2013.01.01 දිනට ශේෂය | එකතු කිරීම් | ඉවත් කිරීම් | 2013.12.31 දිනට ශේෂය | 2013.01.01 දිනට ශේෂය | ඉවත් කිරීම් | වසර සඳහා අයකිරීම් | 2013.12.31 දිනට ශේෂය | |
| ඉඩම් | 70,787,331 | 15,243,849 | 9,452,458 | 76,578,722 | - | - | - | - | 76,578,722 |
| ගොඩනැගිලි | 469,178,798 | 159,684,616 | 30,213,126 | 598,650,288 | 133,882,312 | 3,426,157 | 11,824,409 | 142,280,565 | 456,369,723 |
| දැව අට්ටිමඩු හා වෙනත් ගොඩනැගිලි | 17,936,852 | 1,319,925 | - | 19,256,777 | 16,729,401 | - | 586,703 | 17,316,104 | 1,940,673 |
| මාර්ග හා දුම්රිය මාර්ග | 16,598,376 | - | - | 16,598,376 | 4,193,295 | - | 795,744 | 4,989,039 | 11,609,337 |
| යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | 555,650,767 | 70,738,492 | 490,000 | 625,899,259 | 439,220,447 | 250,773 | 22,583,866 | 461,553,541 | 164,345,719 |
| බදු අයිති ඉඩම් හා ගොඩනැගිලි | 148,311 | - | - | 148,311 | 148,311 | - | - | 148,311 | - |
| මාර්ග ඉදිකිරීම් යන්ත්‍ර හා උපකරණ | 60,450 | - | - | 60,450 | 60,450 | - | - | 60,450 | - |
| මෙවලම් හා උපකරණ | 4,752,792 | 395,469 | - | 5,148,261 | 4,627,344 | - | 98,631 | 4,725,977 | 422,284 |
| විදුලි උපකරණ | 10,245,098 | 3,224,348 | 15,870 | 13,453,576 | 6,594,154 | 9,522 | 712,901 | 7,297,534 | 6,156,042 |
| වාහන | 451,552,432 | 53,981,650 | 3,342,727 | 502,191,355 | 318,554,165 | 3,180,452 | 46,531,677 | 361,905,390 | 140,285,966 |
| ගෘහභාණ්ඩ හා සවිකිරීම් | 23,397,846 | 12,034,044 | 43,180 | 35,388,711 | 13,979,799 | 43,150 | 3,326,212 | 17,262,861 | 18,125,849 |
| කාර්යාලීය උපකරණ | 28,649,008 | 2,312,874 | 42,000 | 30,919,882 | 21,981,430 | 41,995 | 1,968,537 | 23,907,972 | 7,011,910 |
| පරිගණක හා උපාංග | 46,006,362 | 6,156,175 | - | 52,162,537 | 30,367,349 | - | 4,391,389 | 34,758,738 | 17,403,799 |
| විවිධ වත්කම් | 16,296,600 | 4,593,634 | - | 20,890,234 | 12,516,608 | - | 1,721,121 | 14,237,729 | 6,652,505 |
| පෙර නිමැවුම් ව්‍යුහ | 4,938,333 | - | - | 4,938,333 | 4,938,333 | - | - | 4,938,333 | - |
| බදු අයිති ඉඩම් - රත්නපුර | 680,300 | - | - | 680,300 | 680,300 | - | - | 680,300 | - |
| එකතුව | 1,716,879,656 | 329,685,077 | 43,599,361 | 2,002,965,372 | 1,008,473,698 | 6,952,048 | 94,541,191 | 1,096,062,844 | 906,902,528 |

## 09. අස්පෘශ්‍ය වත්කම්

| විස්තරය | පිරිවැය | | | | ක්‍රමක්ෂය | | | | 2013.12.31 දිනට ඉදිරියට ගෙන එන ලද වටිනාකම |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 2013.01.01 දිනට ශේෂය | එකතු කිරීම් | ඉවත් කිරීම් | 2013.12.31 දිනට ශේෂය | 2013.01.01 දිනට ශේෂය | ඉවත් කිරීම් | වසර සඳහා අයකිරීම් | 2013.12.31 දිනට ශේෂය | |
| පරිගණක මෘදුකාංග | 3,011,537 | - | - | 3,011,537 | 172,087 | - | 602,307 | 774,395 | 2,237,142 |
| එකතුව | 3,011,537 | - | - | 3,011,537 | 172,087 | - | 602,307 | 774,395 | 2,237,142 |

## 10. ආයෝජන

| 10.1 ආයෝජන - දිගු කාලීන | 2013 | 2012 |
|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | රු. | රු. |
| ස්ථාවර තැන්පතුවල ආයෝජනය | | |
| මහජන බැංකුව | 117,100,000 | 117,100,000 |
| රාජ්‍ය ආයතනවල තාවකාලික අරමුදල් ගිණුම | 338,010,495 | 298,546,189 |
| රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | 81,474,845 | 73,924,940 |
| | 536,585,340 | 489,571,129 |
| කොටස් වල ආයෝජනය | | |
| ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ මණ්ඩලය | 500,000 | 500,000 |
| සී/ස ලංකා ටිම්බර් ප්ලාන්ටේෂන් සමාගම | 30,000,000 | 30,000,000 |
| | 30,500,000 | 30,500,000 |
| **එකතුව** | **567,085,340** | **520,071,129** |

| 10.2 ආයෝජන - කෙටි කාලීන | 2013 | 2012 |
|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | රු. | රු. |
| ස්ථාවර තැන්පතුවල ආයෝජනය | | |
| මහජන බැංකුව | 694,408,552 | 606,972,649 |
| ලංකා බැංකුව | 509,082,847 | 258,133,134 |
| **එකතුව** | **1,203,491,399** | **865,105,783** |

| 11. තොග | | 2013 | 2012 |
|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | | රු. | රු. |
| වෙළඳ බඩු තොගය | 11.1 | 899,863,184 | 713,426,744 |
| තොග හානිවීම් සඳහා වෙන්කිරීම් | | (118,981,084) | (86,559,171) |
| | | 780,882,100 | 626,867,573 |
| මාර්ගස්ථ තොග | | 45,141,546 | 32,030,180 |
| කෙරීගෙන යනවැඩ | | 21,137,014 | 10,328,209 |
| ගබඩා ද්‍රව්‍ය හා අමතර කොටස් | | 107,385,216 | 79,815,620 |
| පරිරක්ෂණය කිරීමේ ද්‍රව්‍ය | | 20,049,766 | 3,677,605 |
| ඉන්ධන හා තෙල් | | 2,903,761 | 2,480,543 |
| ලිපිද්‍රව්‍ය | | 11,383,639 | 15,770,792 |
| **එකතුව** | | **988,883,042** | **770,970,524** |

| 11.1 තොග විශ්ලේෂණය | 2013 | 2012 |
|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | රු. | රු. |
| රජයේ ඉඩම් වලින් ලද කඳන් | 513,390,101 | 398,386,561 |
| රජයේ ඉඩම් වලින් ලද ඉරූ දැව | 166,901,181 | 166,602,300 |
| පුද්ගලික ඉඩම් වලින් ලද කඳන් | 1,962,491 | 2,359,272 |
| රජයේ ඉඩම් වලින් ලද සිල්පර | 67,246,138 | 3,271,864 |
| පුද්ගලික ඉඩම් වලින් ලද සිල්පර | 22,816,418 | 18,707,816 |
| රජයේ ඉඩම් වලින් ලද විදුලි කණු | 11,341,942 | 23,001,369 |
| පුද්ගලික ඉඩම් වලින් ලද විදුලි කණු | - | 289,409 |
| වෙනත් | 9,548,955 | 51,761 |
| ගෘහභාණ්ඩ | 106,655,959 | 100,756,392 |
| **එකතුව** | **899,863,184** | **713,426,744** |

## 12. වෙළඳ හා වෙනත් ණයගැතියෝ

| දෙසැම්බර් 31 දිනට | සටහන | 2013 | 2012 |
|---|---|---|---|
| | | රු. | රු. |
| වෙළඳ ණයගැතියෝ | | 475,392,716 | 637,121,375 |
| අඩමාන ණය වෙන්කිරීම් | | (35,589,882) | (43,136,231) |
| | | 439,802,834 | 593,985,144 |
| කාර්ය මණ්ඩල ණයගැතියෝ | 12.1 | 158,191,032 | 137,966,759 |
| වෙනත් ණයගැතියෝ | 12.2 | 19,995,516 | 179,851,645 |
| තැන්පත් සහ පූර්ව ගෙවීම් | | | |
| දේශීය මිළදීගැනීම් අත්තිකාරම් | | 16,332,025 | 7,242,395 |
| පූර්ව ගෙවීම් අත්තිකාරම් | | 24,903,941 | 23,723,694 |
| දැව සැපයීම් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවූ අත්තිකාරම් | | 7,533,576 | 12,843,873 |
| තැන්පත් සඳහා ලැබිය යුතු පොළී | | 206,023,255 | 167,249,237 |
| ආපසු හරවා යැවූ චෙක්පත් | | 29,928 | 239,296 |
| කතරගම අෂ්ඨපල අරමුදල | | 1,037,000 | 1,075,000 |
| උසාවි තැන්පත් | | 8,752,032 | 8,752,033 |
| පරිසර අමාත්‍යංශය | | 6,886,714 | 3,677,627 |
| වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව | | 322,398 | 891,109 |
| අයකර ගතහැකි එකතුකළ අගය මත බදු | | 293,689 | - |
| වරාය අධිකාරිය | | 604,095 | 604,095 |
| **එකතුව** | | **890,708,037** | **1,138,101,907** |

## 12.1 කාර්ය මණ්ඩල ණයගැතියෝ

| දෙසැම්බර් 31 දිනට | 2013 | 2012 |
|---|---|---|
| | රු. | රු. |
| කාර්ය මණ්ඩල ණය | | |
| වාහන ණය | 4,681,265 | 4,713,075 |
| ආපදා ණය | 122,716,321 | 124,113,494 |
| විදුලි උපකරණ ණය | 156,973 | 414,570 |
| යතුරුපැදි ණය | 1,672,180 | 833,591 |
| ගෘහභාණ්ඩ ණය | 2,440,004 | 1,781,763 |
| | 131,666,743 | 131,856,493 |
| අත්තිකාරම් හා වෙනත් ණය | | |
| වැටුප් හා වේතන අත්තිකාරම් | 9,500 | 108,167 |
| ගමන් වියදම් අත්තිකාරම් | 70,945 | 112,163 |
| උත්සව අත්තිකාරම් | 2,183,467 | 2,266,134 |
| අභ්‍යන්තර හරපත් | 2,296,463 | 3,447,478 |
| සේවක අයකිරීම් | 215,879 | - |
| පරිගණක ණය | 21,626,814 | - |
| රෙදිපිළි ණය | 121,220 | 176,324 |
| | 26,524,289 | 6,110,266 |
| **එකතුව** | **158,191,032** | **137,966,759** |

| 12.2 වෙනත් ණයගැතියෝ | 2013 | 2012 |
|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | රු. | රු. |
| විවිධ ණයගැතියෝ | 4,861,555 | 173,817,827 |
| පොදු තැන්පත් | 15,480,581 | 6,357,438 |
| පොදු තැන්පත් සඳහා වෙන්කිරීම් | (366,620) | (366,620) |
| ආපසු ගෙවියයුතු ටෙන්ඩර් තැන්පත් | 20,000 | 8,000 |
| අත්තිකාරම් - මරණාධාර | - | 35,000 |
| **එකතුව** | **19,995,516** | **179,851,645** |

| 13. මුදල් හා බැංකු ශේෂය | 2013 | 2012 |
|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | රු. | රු. |
| අතැති මුදල් | 1,104,893 | 1,168,814 |
| මාර්ගස්ථ මුදල් | 15,027,593 | 21,390,140 |
| ලංකා බැංකුව ජංගම ගිණුම | 24,200,953 | 27,571,575 |
| ලංකා බැංකුව - කාලීන තැන්පත් | 30,361,209 | 75,402,360 |
| **එකතුව** | **70,694,647** | **125,532,889** |

| 14. දායක ප්‍රාග්ධනය | 2013 | 2012 |
|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | රු. | රු. |
| ශ්‍රී ලංකා රජයේ අරමුදල | 25,584,808 | 25,584,808 |
| වනසංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් පවරාගත් වත්කම් | 10,714,815 | 10,714,815 |
| ලෝක බැංකු ආධාර | 708,202 | 708,202 |
| කැනේඩියානු හා බ්‍රිතාන්‍ය ආධාර | 4,495,843 | 4,495,843 |
| **එකතුව** | **41,503,668** | **41,503,668** |

| 15. සේවක ණය චක්‍රීය අරමුදල | 2013 | 2012 |
|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | රු. | රු. |
| වසර මුල ශේෂය | 218,784,628 | 208,105,464 |
| සේවක ණය පොළී ලැබීම් | 7,582,768 | 9,763,193 |
| වසර තුළ සිදු කරන ලද ගැලපුම් | (824,263) | 915,971 |
| වසර අග මුළු ශේෂය | **225,543,133** | **218,784,628** |

| 16. විශ්‍රාම පාරිතෝෂිකය | 2013 | 2012 |
|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | රු. | රු. |
| වසර මුල ශේෂය | 367,895,815 | 363,194,017 |
| වර්ෂය සඳහා ප්‍රතිපාදන | 639,601 | 32,405,952 |
| වර්ෂය තුළ ගෙවීම් | (27,935,470) | (27,704,154) |
| වසර අග ශේෂය | **340,599,947** | **367,895,815** |

| 17. බදුකරණය | 2013 | 2012 |
|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | රු. | රු. |
| වසර මුල ශේෂය | (29,473,329) | 97,864,518 |
| තැන්පතු මත රඳවාගැනීමේ බදු | (13,827,648) | (7,351,476) |
| වර්ෂය තුළ ගෙවීම් | - | (192,453,383) |
| ආර්ථික සේවා ගාස්තු | - | (16,300,146) |
| වර්ෂය සඳහා වෙන්කිරීම් | 131,882,764 | 88,766,698 |
| වසර අග ශේෂය | **88,581,787** | **(29,473,329)** |

| 18. ණයහිමියෝ සහ උපචිත වියදම් | 2013 | 2012 |
|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | රු. | රු. |
| සේවක අර්ථසාධක අරමුදල | 12,964,959 | 9,704,625 |
| සේවක භාරකාර අරමුදල | 1,555,815 | 1,179,309 |
| ව්‍යාපාර පිරිවැටුම් බදු | - | 398,627 |
| උපචිත වියදම් | 170,814,175 | 188,667,206 |
| ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පත් | 6,566,130 | 11,371,565 |
| ඇප තැන්පතු - කාර්ය මණ්ඩලය හැර | 30,033,745 | 32,091,211 |
| ගෙවිය යුතු විගණන ගාස්තු | 2,323,028 | 1,573,028 |
| ගනුදෙනුකරුවන්ගේ තැන්පත් | 10,400 | 7,704 |
| රඳවාගත් මුදල් | 10,118,269 | 14,576,322 |
| වෙනත් ණයහිමියෝ | 43,223,330 | 38,582,904 |
| ස්කන්ධභාගය - වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 661,562,629 | 474,283,658 |
| ස්කන්ධභාගය - වන ජීවී දෙපාර්තමේන්තුව | 335,619 | 12,511,511 |
| එකතුකළ අගය මත බදු | 22,168,086 | 19,154,160 |
| එකතුව | **961,676,185** | **804,101,830** |

## මූල්‍ය පාරිභාෂික ශබ්ද මාලාව

1 ගිණුම් ප්‍රතිපත්ති
මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී හා ඉදිරිපත් කිරීමේදී භාවිතා කරනු ලබන විශේෂ මූලධර්ම, පදනම්, සම්මත, නීතීන් සහ ක්‍රියාමාර්ග.

2 ක්‍රමක්ෂය
අස්පෘශ්‍ය වත්කම් එහි ඵලදායී ජීව කාලය තුල ක්‍රමවත් ලෙස බෙදා හැරීම.

3 උපචිත වියදම්
ආදායම් හා වියදම් ලැබීම් හෝ ගෙවීම් කාලපරිච්ඡේදයන් ගැන නොසලකා, එකිනෙක ගැලපීමේ මූලධර්මය.

4 මුදල් හා මුදල් වලට සමාන වත්කම්
මාස 3 ක් හෝ ඊට අඩු කාලයකින් කල්පිරෙන ද්‍රවශීලි ආයෝජන.

5 ආදායම් සංචිත
ආයෝජන සඳහා තබා ඇති සංචිත.

6 අගය එකතු කිරීම්
සංස්ථාව විසින් එහි ක්‍රියාකාරකම් මත උත්පාදනය කරන ලද ධන ප්‍රමාණය.

7 ක්‍රියාකාරී දර්ශකය
ජංගම වගකීම් වලින් ජංගම වත්කම් බෙදූ විට ලැබේ.

8 ක්ෂය වීම්
වත්කමක ක්ෂය කළ හැකි අගය එහි ඵලදායී ජීවකාලය තුල ක්‍රමවත්ව බෙදාහැරීම.

9 තෝලනය
යෙදවූ ප්‍රාග්ධනයට ණය ලබාගත් ප්‍රමාණය.

10 සාධාරණ අගය
දැනුමැති මනාප පාර්ශවයන් අතර අතේ දුරින් කරනු ලබන ගණුදෙනුවකදී වත්කමක් හුවමාරු කලහැකි අගය වේ.

11 වත්කම් මත ඉපැයීම්
ශුද්ධ ආදායම මුළු වත්කමෙහි ප්‍රතිශතයක් ලෙස දැක්වීමයි. මෙය ලාභය මැනීමේ හා සමාන වෙනත් ආයතනවල කාර්යසාධනය සැසඳීමේ මිනුමක් ලෙස භාවිතාවේ.

12 විලම්භිත බදු
වර්තමාන ගිණුම්කරණ ප්‍රතිපත්ති, බදු ප්‍රතිපත්ති වලින් වෙනස් වීම නිසා අනාගතයේදී ඇති විය හැකි වත්කම් හෝ වගකීම් වේ.

State Timber Corporation
Ministry of Environment and Renewable Energy

*Composed by : Dulini Wijesuriya & Shalika Harshani*
*Design & Printed by : Deelaka Associates - Tel : 5632637*